
# දෙසතිය

පුවත් සඟරාව

2024 දෙසැම්බර්



## අඩ සියවසක සලරූ

# රවීන්ද්‍රය

# ආපදා මතින් නැගී සිටීම



2024 Fengal කළ හදිය

2004 සුනාමිය - හම්බන්තොට



2004 සුනාමිය - දකුණු දුම්රිය මාර්ගය



ශ්‍රී ලංකාව මෑත භාගයේ මුහුණදුන් දරුණුතම ස්වාභාවික ව්‍යසනය වූ සුනාමිය සිදුවී 2024 දෙසැම්බර් 26 දිනට වසර 20ක්. 2004 වසරේ සිදු වූ එම ව්‍යසනය හේතුවෙන් 2005 වසරේ සිට ජාතික සුරක්ෂිත දිනය ප්‍රකාශයට පත් කර තිබෙනවා. මේ කාලයේ අප මුහුණ දුන් ස්වභාවික ආපදා සිදුවීම් ඉහළ අගයක්. එහි සමීපතම සිදුවීම 2024 නොවැම්බර් මස අවසානයේ ඇතිවූ මහ ගංවතුර. උසස්පෙළ විභාගය පවා දින කිහිපයකට කල් දැමීමට සිදු වූයේ එහි බලපෑම තීව්‍ර වූ නිසා.

ස්වාභාවික ආපදාවලට මුහුණදීමට තරම් වූ ජාතික ප්‍රතිපත්තියක් අදටත් අපට නැහැ. මෙවැනි ව්‍යසනවල අමිහිර පසුගිය කාලයේ අත් වින්දා. 2015 අරණායක හා හල්දුම්මුල්ල නාය යාම, 2016-2017 බස්නාහිරට බල පෑ මහා ගංවතුර, රත්තපුර, යාපනය, දකුණු පළාත ආදී බොහෝ ස්ථානවලට ඇති වූ ආපදා තත්ත්ව ඉතා ප්‍රබල මට්ටමකයි පැවතුණේ.

විටෙක නියඟය. විටෙක ගංවතුර. ඇතැම් විටෙක එක ම දිස්ත්‍රික්කයේ ස්ථාන දෙකක නියඟය හා ගංවතුර. මේ තත්ත්වය වහා අවධානයට ගත යුතු වනවා. රටේ සියලු අදාළ ආයතන සම්බන්ධීකරණය වූ, සියලු පක්ෂ විපක්ෂ එක් වූ ජාතික වැඩපිළිවෙළක් සඳහායි අප පිය නැඟිය යුත්තේ.

**නිශාන්ත පීරිස්**

# දෙසතිය

පුවත් සඟරාව

**වෙළුම 46, කලාපය 12,**
**2024 දෙසැම්බර්**



**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150



උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**



මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





23




03 පිල්ලි ගැසූ සහල්



05 අගේ පෙන්නන අපේ පොල්



15 ජයක රහස



38 සාහිත්‍යයට නාලිකා ගැළපුම



41 200ට උසස් වීම

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

**දෙසතිය** සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය........................................ හා .................................... දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් ''ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්'' නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..................................................

Address ..................................................

..................................................

..................................................

..................................................

ID Number ............................ Tel / Mobile ............................

Signature ............................ Date............................

# අපේක්ෂා ඵල දරන ලකුණු

ජේසුස් ක්‍රිස්තු සමිඳාණන්ගේ අසිරිමත් උපත සිදුවූ නත්තල සැමරීම දෙසැම්බර් මස 25 දිනට යෙදී තිබෙනවා. ලෝකයේ ලක්ෂ සංඛ්‍යාත කිතුණුවන් මෙන් ම අන්‍ය ආගම් අදහන පිරිස් ද නත්තල සැමරීමට එක් වන්නේ සියලු ජාතීන් අතර සාමයෙන් හා අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් බැඳීමේ අවශ්‍යතාව මතු කරමින් දෙව් මැදුරේ බැති ගී ගැයෙන මොහොතක.

නත්තලේ සැබෑ අරුත වන්නේ එය වුවත් වත්මන් සමාජය ඇතැම් විටෙක ධන, බල ලෝභී ව ක්‍රියා කරන සෙයක් ද දක්නට ලැබෙනවා. එහෙත් අයුක්තිය, අසාධාරණය, දූෂණය රජ වී ඇති පසුබිමක ජනතාව අපේක්ෂා කරන්නේ ඒ සියල්ල පසෙකලා මානව ගුණදම් අගයන, විමුක්තිය උදා වන, සාමය රජයන සමාජයක්.

රටේ දශක ගණනක් පැවති දේශපාලන සංස්කෘතිය ඉවතලමින් ඒ වෙනුවට නව දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමට ජනතාව ලබා දුන් මැතිවරණ තීන්දුවෙන් ඉල්ලා සිටියේ ද එවැන්නක්. පෙර මහ මැතිවරණවලට වඩා මෙවර මහ මැතිවරණයේ ප්‍රතිඵල විමසුමෙන් එම කරුණ තහවුරු වනවා. මෙතෙක් ලක් ඉතිහාසයේ සිදු නොවූ ආකාරයට, රට ම එක පෙළට දිශානුගත වෙමින් ජාති, ආගම්වලින් නොබෝදා අපේක්ෂා කළේ සියලු ජාති, ආගම් අතර සාමය, සංහිඳියාව, සහජීවනය සුරැකෙන වංචාව, දූෂණය, මැර බලය පිටුදකින සමාජයක්.

කාලයක් තිස්සේ ආර්ථික, සමාජ, දේශපාලන, ආගමික වශයෙන් රටේ ඔඩු දුවා ඇති ප්‍රශ්නවලට විසඳුම පළිගැනීම නොව නීතිය අකුරට ක්‍රියාත්මක කරමින්, බිඳ වැටුණු ජනතා බලාපොරොත්තු ඉටු කිරීම බව වත්මන් ආණ්ඩුව දුන් පොරොන්දුවල සඳහන්. ඇතැම් විට ජනතාව පසුගාමී වෙමින් සිටින බවක් විපක්ෂ කණ්ඩායම් හුවා දක්වන්නේ නීතිය ක්‍රියාත්මක වන බවක් දක්නට නැතැයි මැසිවිලි නඟමින්. එහෙත් ආණ්ඩුව අවධාරණය කරන්නේ නිහඬ කාලයක් ගෙවමින් ඊට අවශ්‍ය පියවර ගනිමින් සිටින බවත් එහි ප්‍රතිඵල නුදුරු දිනෙක ජනතාවට අත්දකින්නට ලැබෙනු ඇති බවත්. මෙතෙක් බදු නොගෙවූවන් කෝටි ගණන් හිඟ බදු ගෙවීම ආරම්භ කර ඇති බවට පිළිගත හැකි ආරංචි ඊට ඇති සාක්ෂ්‍ය.

දේශපාලන වෛරයෙන්, ක්‍රෝධයෙන්, පළි ගැනීමෙන් වංචා, දූෂිත ක්‍රියාවලට දඬුවම් ලබා දුන් යුගයක් අප පසු කළ බව සැමට නොරහසක්. එහෙත් ගෙවුණු මැතිවරණ සමයේ හෝ පශ්චාත් මැතිවරණ සමයේ ප්‍රචණ්ඩක්‍රියා දක්නට නොමැති තරමට සාමකාමී වටපිටාවක් රටේ පැවතීම නව දේශපාලන සංස්කෘතියකට මුලපිරීමක් ලෙස අර්ථ දැක්වීම සාවද්‍ය නොවනු ඇති. මේ නිසා දැඩි පිළිවෙතකින් විනිර්මුක්ත ව, සාමය රජයන සමාජයක් රටේ ස්ථාපිත වෙමින් තිබෙනු දැකීම සැබවින් ම සතුටට කරුණක්.

එබැවින් අප කළ යුත්තේ 2024 වසර ගෙවී යමින් තිබෙන මේ නත්තල් සමයේ ක්‍රිස්තුස් වහන්සේ කියා දුන් මානව දයාවේ පණිවුඩය සිහි කරමින් රටක් ලෙස එකාවන් ව සතුටින් හා ප්‍රේමයෙන් කල් ගෙවීම.

මාලා මලීෂාන්ත ජයසිංහ ගමගේ

- සංස්කාරක -



# පිල්ලි ගැසූ සහල්

චන්දන මාරසිංහ

මේ දිනවල වෙළෙඳපොළේ සහල් හිඟයක් නිර්මාණය වී, ඒ පිළිබඳ සුවිශේෂ කතාබහක් ද ඇති වෙමින් තිබෙනවා. ඊට පිළියමක් ලෙසයි ස්වර්ණ නාඩු මෙට්‍රික් ටොන් 70,000ක් ආනයනය කිරීමට රජය තීරණය කර තිබෙන්නේ. දෙසැම්බර් මස 15 දින වන විට ඒවා වෙළෙඳපොළට නිකුත් කෙරෙනු ඇති.

මේ සහල් හිඟය කෘත්‍රිම ව නිර්මාණය කර ඇති බවටයි බොහෝ පාර්ශ්ව චෝදනා කරන්නේ. අමාත්‍ය වසන්ත සමරසිංහ පෙන්වා දෙන ආකාරයට ගෙවුණු යල සහ මහ දෙකන්නයේ මෙරට වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.8ක්. ඉන් මෙට්‍රික් ටොන් මිලියන 3.1ක් පමණ නාඩු වී. මේ නාඩු වී ප්‍රමාණය සහල් බවට පත්වීමේදී ලැබෙන්නේ සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.1ක්. ඒ අනුව මාසික නාඩු සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 183,000ක් වන අතර මෙරට මාසික නාඩු සහල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 140,000ක් පමණ වන බවයි අමාත්‍යවරයා පවසන්නේ. ඒ අනුව මෙට්‍රික් ටොන් 40,000ක අතිරික්තයක් පවතිනවා.

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු අධිකාරියේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ජේ.එම්. තිලකරත්න බණ්ඩා පෙන්වා දෙන ආකාරයට නොවැම්බර් 05 දිනට ලබාගත් සංඛ්‍යා ලේඛන අනුව රටේ සහල් මෙට්‍රික් ටොන් 327,215ක් පවතිනවා. එහෙත් අතරමැදියන් හා වී මෝල් හිමියන් සතු ව පවතින වී සමග මේ ප්‍රමාණය තවත් වැඩි විය යුතුයි. මෙයින් පෙනී යන්නේ යම් පිරිසකගේ ඇතැම් ක්‍රියාමාර්ග හේතුවෙන් රටේ කෘත්‍රිම නාඩු සහල් හිඟයක් නිර්මාණය වී ඇති බව.

ගොවියන් සතු ව තවත් 15%ක පමණ වී තොග පවතින බව එක්සත් සහල් නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති මුදිත් පෙරේරා සඳහන් කරනවා. අදහස් දක්වන ඔහු: "ගොවියන් සතු ව පමණක් නොවෙයි වී මෝල් හිමියන් සහ අතරමැදියන් සතුවත් වී තොග පවතිනවා. එවැනි අතරමැදියන් සතුව වී මෙට්‍රික් ටොන් 100,000ක් පමණ තිබෙන්නට පුළුවන්. වාහන ආනයන ක්ෂේත්‍රයේ නිරතවන්නන් පසුගිය කාලයේ වී තොග රැස්කිරීමේ කාර්යයට සම්බන්ධ වී තිබෙනවා. ඔවුන්ගේ කාර්යය වී ඇත්තේ වී රැස් කර වැඩි මිලට අලෙවි කිරීම. එම වී තොග අතර වැඩි වශයෙන් පවතින්නේ නාඩු වී. මේ අනුව කිසිදු හිඟයකින් තොර ව වී නිෂ්පාදනය කර තිබුණත් නිර්මාණය කර තිබෙන්නේ කෘත්‍රිම සහල් හිඟයක්."

සහල් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කරමින් 2022-05-02 දින නිකුත් කළ ගැසට් නිවේදනය තවමත් වලංගු බව පාරිභෝගික අධිකාරියේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසනවා. එයට අනුව නාඩු කිලෝග්‍රෑමයක් අලෙවි කළ යුතු වන්නේ රුපියල් 220කට. සම්බා කිලෝග්‍රෑමයක් රුපියල් 230ක් විය යුතු අතර කීරි සම්බා කිලෝග්‍රෑමයක මිල වන්නේ රුපියල් 260ක්. කැකුළු හාල්

> ගොවියාට මෙන් ම පාරිභෝගිකයාට ද පහසුකම් සැලසීම වී අලෙවි මණ්ඩලයේ වගකීමක් වුවත් එය සිදු ව තිබේද යන්න ගැටලුවක්. ඔවුන්ට මුදල් හෝ නිසි සැලසුමක් නොමැති වීමත් ඊට හේතුවක්. සභාපති මංජුල පින්නලන්ද පවසන ආකාරයට වී නිෂ්පාදනයෙන් 30%ක් ගොවියන් තබා ගන්නවා. ඒ, පරිභෝජනය, බිත්තර වී සහ අලෙවිය ආදියට. අනෙක් 70% පවතින්නේ වී මෝල් හිමියන්, අතරමැදියන් හා තොග රැස් කරන කණ්ඩායම් සතු ව. බලපෑම් කළ හැකි මට්ටමේ වී තොග රජය සතු ව නොමැති වීම නිසා ඊට බලපෑම් කිරීමේ හැකියාවක් රජයට නැහැ.

> ගොවි ජනතාවට සාධාරණ මිලක් ලබාදීම මෙන් ම පාරිභෝගිකයාට උපරිම පහසුකම් සලසමින් වෙළෙඳපොළේ සහල් පවත්වාගෙන යාම මූලික අවශ්‍යතාවක්. එහිදී සහල් කර්මාන්තයේ නිරතවූවන් පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වනවා. ව්‍යාපාරිකයන්ගේ අරමුණ ලාභ ඉපයීම වුවත් අනෙක් පාර්ශ්වවලට ගැටලු ඇති කරමින් අසීමිත ලාභ උපයා ගැනීම කිසිසේත් පිළිගත නොහැක්කක්.

කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල සඳහන් වන්නේ රුපියල් 210ක් වශයෙන්. මේ උපරිම සිල්ලර මිල ඉක්මවා අලෙවි කළහොත් පුද්ගලයකුට රුපියල් ලක්ෂයක දඩයක් නියම කිරීමේ හැකියාව පවතිනවා. උපරිම සිල්ලර මිල සඳහන් නිවේදනය මාස 06කට වරක් යාවත්කාලීන කළ යුතු බවයි සභාපති මුදිත් පෙරේරා පෙන්වා දෙන්නේ. 2025 වසරේ මාර්තු දක්වා වී තොග මෙරට පැවතියත් එය වෙළඳපොළට නොලැබීමට මේ යාවත්කාලීන නොවීම හේතු වී ඇති බව සභාපති මුදිත් පෙරේරා පෙන්වා දෙන කාරණාවක්. ඒ අනුව සහල් මිල වැඩි කිරීම ඔවුන්ගේ අවශ්‍යතාවක් වී තිබෙනවා. නිෂ්පාදන පිරිවැය ඇතුළු කරුණු ඊට හේතුවක් ලෙසයි සැලකෙන්නේ.

වී තොග රැස්කිරීම සඳහා රජයේ ප්‍රධාන බැංකු දෙකෙන් ව්‍යාපාරිකයන් ණය ලබා ගන්නා අතර ණය ගිවිසුම් අනුව එම වී බැංකු සතු වස්තුවක් ලෙසයි සැලකෙන්නේ මේ ණය අයකර ගැනීම කඩිනම් කරන්නේනම් ගබඩාවල ඇති වී කඩිනමින් සහල් බවට පත්කර වෙළෙඳපොළට නිකුත් කිරීමට වී මෝල් හිමියන්ට සිදුවන බවයි මුදිත් පෙරේරා සඳහන් කළේ. එසේ වන්නේ සහල් අලෙවි කර බැංකු ණය ගෙවීමට ඔවුන්ට සිදුවනු ඇති නිසා.

පවතින වාතාවරණය හමුවේ වැඩි මිලට සහල් අලෙවි කරන වෙළෙඳුන් සොයා වැටලීම් සිදුකරන බව පාරිභෝගික අධිකාරියේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ජේ.එම් තිලකරත්න බණ්ඩා සඳහන් කරනවා. පොදුවේ වසරකට කරන සියලු වැටලීම් සංඛ්‍යාව 25000ක් පමණ වන අතර සහල් ගබඩා සම්බන්ධයෙන් සිදු කළ වැටලීම්වලදී සහල් මෙට්‍රික් ටොන් 327,215ක් සොයාගැනීමට හැකි වී තිබෙනවා. ඒ අතර හමු වී ඇති නාඩු සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 136,257ක්.

මෙවැනි ගැටලුවලදී ඒවා සමථයකට පත්කිරීම සඳහා දායකත්වය ලබාදීමේ වගකීම පැවරී තිබෙන්නේ වී අලෙවි මණ්ඩලයට. ඒ, රජයේ යාන්ත්‍රණය එය වන බැවින්. කෙසේ වෙතත් වී අලෙවි මණ්ඩලයේ සභාපති මංජුල පින්නලන්ද සඳහන් කළේ වසර ගණනාවකින් වී අලෙවි මණ්ඩලය වී මිල දී ගෙන නොමැති බව. ඔහු සඳහන් කරන පරිදි අම්පාරේ



ගබඩාවක පමණක් කීරි සම්බා වී මෙට්‍රික් ටොන් 109,000ක් පවතින අතර මෙවැනි ගැටලු සහගත අවස්ථාවකදී එය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ගොවියාට මෙන් ම පාරිභෝගිකයාට ද පහසුකම් සැලසීම වී අලෙවි මණ්ඩලයේ වගකීමක් වුවත් එය සිදු ව තිබේද යන්න ගැටලුවක්. ඔවුන්ට මුදල් හෝ නිසි සැලසුමක් නොමැති වීමත් ඊට හේතුවක්. සභාපති මංජුල පින්නලන්ද පවසන ආකාරයට වී නිෂ්පාදනයෙන් 30%ක් ගොවියන් තබා ගන්නවා. ඒ, පරිභෝජනය, බිත්තර වී සහ අලෙවිය ආදියට. අනෙක් 70% පවතින්නේ වී මෝල් හිමියන්, අතරමැදියන් හා තොග රැස් කරන කණ්ඩායම් සතු ව. බලපෑම් කළ හැකි මට්ටමේ වී තොග රජය සතු ව නොමැති වීම නිසා ඊට බලපෑම් කිරීමේ හැකියාවක් රජයට නැහැ.

ඉදිරියේදී වී මෙට්‍රික් ටොන් 300,000ක් පමණ මිල දී ගැනීමට අපේක්ෂා කරන බව වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා සඳහන් කරනවා. වී අලෙවි මණ්ඩලය සතු ව ගබඩා 216ක් පමණ ඇතත් නිසි නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් බොහෝ ගබඩා භාවිතයට ගත නොහැකි මට්ටමට පත්වී අවසන්. එම ගබඩා අලුත්වැඩියා කිරීමත් වී අලෙවි මණ්ඩලයේ ඉදිරි සැලසුම්වලට ඇතුළත් අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෙන් ගබඩා අලුත්වැඩියා කරන බවත් වී මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ණය මුදලක් ලබා ගන්නා බවත් වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා සඳහන් කළ කාරණයක්.

ගොවි ජනතාවට සාධාරණ මිලක් ලබාදීම මෙන් ම පාරිභෝගිකයාට උපරිම පහසුකම් සලසමින් වෙළෙඳපොළේ සහල් පවත්වාගෙන යාම මූලික අවශ්‍යතාවක්. එහිදී සහල් කර්මාන්තයේ නිරතවූවන් පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වනවා. ව්‍යාපාරිකයන්ගේ අරමුණ ලාභ ඉපයීම වුවත් අනෙක් පාර්ශ්වවලට ගැටලු ඇති කරමින් අසීමිත ලාභ උපයා ගැනීම කිසිසේත් පිළිගත නොහැක්කක්. මහා පරිමාණ, මධ්‍යම හා සුළු පරිමාණ වී මෝල් හිමියන්ටත් සාධාරණයක් ඉටුවන ලෙස මේ කර්මාන්තය පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය කරුණක්. මේ වන විට වී මෝල් හිමියන්, තොග රැස් කරන්නන් හා බෙදා හරින පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක වනවා. එසේ ම සහල් තොග රැස් කරමින් ගබඩා කර තබා ගන්නා අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව ද විශේෂ අවධානය යොමු කළ යුතු අතර වී අලෙවි මණ්ඩලය හා පාරිභෝගික අධිකාරිය ශක්තිමත් ව ක්‍රියාත්මක වී ඒ පිළිබඳ නියාමනයක් ඇති කිරීම මූලික අවශ්‍යතාවක්. එසේ නොවුවහොත් ඇතැම් පිරිසක් පමණක් උපරිම වාසි ලබා ගනිමින් සිදු කරන මේ කාර්යය නිසා අසාධාරණයක් සිදු වන්නේ අතිවිශාල පිරිසකට.

# අගේ පෙන්නන අපේ පොල්



**රංගිකා අබේසේකර**

දේශීය වෙළෙඳපොළේ පොල් ගෙඩියක මිල විශාල ලෙස ඉහළ යාම සමාජයේ පුවත් මවන තරමට ජනප්‍රිය මාතෘකාවක් වී තිබෙනවා. ශ්‍රී ලංකා ඉතිහාසයේ පොල් මිල ඉහළ ගිය ප්‍රථම අවස්ථාව මෙය නොවුණත් මෑත ඉතිහාසයේ රු. 200.00 ද ඉක්මවා පොල් ගෙඩියක් අලෙවි වීම පාරිභෝගිකයන් පත් කර ඇත්තේ දැඩි අපහසුතාවකට.

ලෝකයේ සිව් වැනි පොල් නිෂ්පාදකයා වන්නේ ශ්‍රී ලංකාව. මෙරට පොල් වගා කරන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 480,215ක් වන අතර වාර්ෂික පොල් නිෂ්පාදනය සැලකීමේදී 2022 වසරේ පොල් ගෙඩි මිලියන 3,351.8ක ඵලදාවක් ලැබී තිබෙනවා. 2023 වසරේ මේ අස්වැන්න පොල් ගෙඩි මිලියන 2,944ක්. 2024 වසරේ ජනවාරි සිට ජුනි මාසය තෙක් පොල් ගෙඩි මිලියන 1423ක නිෂ්පාදනයක් පෙන්නුම් කරන අතර 2024 වසර අවසන් වන විට පොල් ගෙඩි මිලියන 2,683ක ඵලදාවක් ඇස්තමේන්තු කර ඇති බවයි පොල් වගා මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී එන්.එස් ජයලත් සඳහන් කරන්නේ.

ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය වන ගස් මිලියන 55ක් පමණ තිබෙනවා. මෙරට ගෘහස්ථ පොල් පරිභෝජනය 60-70%ත් වන අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේ 30-40%ක් පමණ. පොල් ආශ්‍රිත නිෂ්පාදනවලින් වාර්ෂික ව මෙරටට ලැබෙන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 0.8%ක්. එය බිලියන 1.8ක් දක්වා වර්ධනය කිරීමට හැකියාව පවතින බවයි ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂ ආචාර්ය නයනි ආරච්චිගේ අවධාරණය කරන්නේ.

සෑම වසරක ම පොල් මිල තීරණය වන්නේ ඉල්ලුම හා සැපයුම යන කාරණා මත.

පොල් මිල ඉහළ යාම සඳහා හේතු රැසක් බලපා තිබෙනවා. 2021 වසරේ පැවති ආණ්ඩුව රසායනික පොහොර ආනයනය නැවැත්වීමට ගත් ප්‍රතිපත්තිමය තීරණය මත ශ්‍රී ලංකාව මුහුණදුන්නේ දැඩි රසායනික පොහොර හිඟයකට. එය පසුකාලීන ව රටේ පොල් ඵලදාව අඩුවීමට බලපෑවා. පොල් අස්වැන්න අඩුවීම සඳහා බලපාන කෘමීන්ගෙන් වන හානිය එක් ගැටලුවක්. සුදු මැස්සා හානිය, රතුකුරුමිණි හානිය, පොල් මයිටා හානිය, පොල් දළඹු හානිය ඊට අයත්. රිලවුන් සහ දඬුලේනුන්ගෙන් වන හානිය ද සැලකිය යුතු මට්ටමක පවතිනවා. පොල් වගාවේ වයස අනුව නිර්දේශිත වාර්ෂික ව යෙදිය යුතු පොහොර ප්‍රමාණය අඩුවීම පොල් අස්වැන්න පහත වැටීමට බලපාන තවත් සාධකයක්.

ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන එන්.එස් ජයලත්, "2019-2020 කාලයේ රසායනික පොහොර මිල ඉහළ ගියා. පොහොර මිල අඩු වුවත් වගාකරුවන් පොල් ගස්වලට පොහොර 50%ක උපරිමයකට වඩා යෙදුවේ නැහැ. එයට හේතු වන්නේ පොහොර නොදැම්මත් පොල් ගසේ ඵල හටගැනීම. පසේ ස්වාභාවික පොහොර තිබීමෙන් ඵලදාව ලැබුණත් දීර්ඝකාලීන ව එලෙස ඵලදාව ලබා ගැනීම අපහසු කාරණයක්. ඒ නිසා පොහොර යොදා ජල සම්පාදනය ඉහළ නැංවිය යුතුයි. පොහොර යෙදුවත් එම ඵලදාව ලබාගැනීමට වසර 3ක් වැනි දීර්ඝ කාලයක් ගතවෙනවා. මේ වසරේ පොල් ඵලදාව 10%කින් අඩුවීමට සුදු මැස්සාගේ හානිය බලපෑවා. පසුගිය වසරවලට සාපේක්ෂ ව මේ වසරේ අස්වැන්න පොල් ගෙඩි මිලියන 200ත් 300ත් අතර අඩුවීමක් දක්නට ලැබෙනවා".

විශේෂයෙන් පොල් පොහොර මිල ඉහළ යාම පොල් වගාකරුවන්ට බලපා තිබෙනවා. මෙවැනි පසුබිමක පොල් ඉඩම්වලින් ලැබෙන ලාභයට වඩා ඉඩම වෙන්දේසි කර විකිණීමත් සූර්ය පැනල සවිකිරීමෙන් ලාබ ඉපැයිය හැකි නිසාත් පොල් වගාකරුවන් යොමු වී සිටින්නේ එවැනි විකල්ප ලාබ ඉපැයුම් සඳහා.

සාර්ථක පොල් ඵලදාවක් සඳහා වසරේ පැතිරුණු වර්ෂාපතනයක් ලැබීම ඉතා වැදගත්. හොඳින් වර්ධනය වූ පොල් ගසකට දෛනික ව ලබාදිය යුතු ජල ප්‍රමාණය ලීටර් 60ක් පමණ වන බවයි එන්.එස් ජයලත් සඳහන් කරන්නේ. පොල් වගා කරන ප්‍රදේශවලට මිලිමීටර් 100ට අඩු වර්ෂාපතනයක් තිබෙන අවස්ථා පොල් වගාවේදී සලකන්නේ උග්‍ර නියඟ කාල ලෙස.

සාර්ථක පොල් ඵලදාවක් ලබාගැනීම සඳහා පැවතිය යුතු පාරිසරික උෂ්ණත්වය වන්නේ සෙල්සියස් අංශක 33ක්. උෂ්ණත්වය වැඩි කාලවල පරාගනය නිසි ලෙස සිදු නොවන බවයි ආචාර්ය නයනි ආරච්චිගේ සඳහන් කරන්නේ. අදහස් දක්වන ඇය, "පොල් අස්වැන්න වාර්ෂික ව ඉහළ පහළ යාම සාමාන්‍ය තත්ත්වයක්. සාමාන්‍යයෙන් පොල්ගෙඩි මිලියන 2800ත් 3000ත් අතර සංඛ්‍යාවක් මෙරට නිෂ්පාදනය වනවා. මේ වසරේ පොල් ඵලදාව අඩුවීමට එක් හේතුවක් වන්නේ 2023 වසරේ ලැබුණු වර්ෂාපතනය. එම වසරේ ඔක්තෝබර් සිට දෙසැම්බර් තෙක් යහපත් වර්ෂාපතනයක් ලැබුණත් ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා කාලයේ පොල් වගාව සහිත ප්‍රදේශ බහුතරයකට ලැබී ඇත්තේ මිලිමීටර් 100ට වඩා අඩු වර්ෂාපතනයක්. එම කාලයේ පාරිසරික උෂ්ණත්වය සෙල්සියස් අංශක 34ක්. ඒ අනුව 2023 වසරේ බලපෑමයි 2024 වසරේ අප්‍රේල් මාසයෙන් පසු පොල් ඵලදාව අඩුවීම කෙරෙහි බලපා තිබෙන්නේ."

ශ්‍රී ලංකාවට අමතර ව ඉන්දියාව, ඉන්දුනීසියාව, පිලිපීනය වැනි ලෝකයේ මහා පරිමාණ පොල් නිෂ්පාදනය කරන රටවලත් පොල් හිඟයක් දක්නට ලැබෙනවා. ඒ හේතුවත් සමග ලෝකයේ දිසිදි පොල්, පොල්තෙල්, පොල් කිරි සහ පිටි කළ පොල් වැනි පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීම ස්වභාවික කාරණයක්. පොල් අස්වැන්නේ අඩුවීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින මේ ඉහළ ඉල්ලුම යන කාරණා දේශීය වෙළෙඳපොළේ මිල ඉහළ යාමට ප්‍රබල හේතුවක් වන බවයි ආචාර්ය නයනි ආරච්චිගේ සඳහන් කළේ.

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ UNIDO (United Nations Industrial Development Organization) සංවිධානය එක් ව පොල් ඵලදාව අඩුවීම සම්බන්ධයෙන් කෙටිකාලීන සහ දිගුකාලීන විසඳුම් සෙවීමට එක් ව සිටිනවා. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන ආචාර්ය නයනි ආරච්චිගේ: "පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා ඇතිවී තිබෙන පොල් හිඟයට කෙටිකාලීන විසඳුම් ලෙස පොල් නිෂ්පාදනය අඩු කාලයේදී පමණක් ශීත කළ පොල් මද ආනයනයට හැකියාවක් තිබෙනවා. එහෙත් පොල් ගෙඩි ගෙන්වීම අවදානම්. ඊට හේතුව පොල් නිෂ්පාදනය ඉහළ රටවල ලංකාවේ වාර්තා නොවන රෝග හා පළිබෝධ වාර්තා වීම".

ඉහළ පොල් නිෂ්පාදනයක අවශ්‍යතාව පවතින යුගයක එවැනි දීර්ඝකාලීන ඉලක්කගත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බවයි ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරිය සඳහන් කළේ. අදහස් දක්වන ඇය, "ඉදිරියේදී මූලිකත්වය දෙන්නේ කාලගුණික සහ පළිබෝධවලට ඔරොත්තු දෙන උසස් පොල් ප්‍රභේද පිළිබඳ අවධානය යොමු කර ඒ සඳහා වන පර්යේෂණවලට. පොල් වගාවක පසේ ඵලදායිතාව වැඩි කිරීමට ප්‍රදේශවලට ආවේණික ව අතුරු බෝග සහ සත්ත්ව පාලනයටත් ඉඩප්‍රස්ථා ලබා දී තිබෙනවා".

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව අස්වැන්න අඩුවීම අවම කිරීම සඳහා වසුන් යෙදීම හා පොල් ලෙලි වළවල් සැකසීම වැනි තෙතමන සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම වැදගත්. විශේෂයෙන් වගාකරුවන්ට නියඟ කාලවලදී ජල සම්පාදන ක්‍රම භාවිතයට හැකියාවක් තිබේ නම් වර්ෂාව අවම වීම නිසා වන බලපෑම අඩු කිරීමට පුළුවන්.

මේ වසරේ පොල් ඵලදාව අඩුවීමට එක් හේතුවක් වන්නේ 2023 වසරේ ලැබුණු වර්ෂාපතනය. එම වසරේ ඔක්තෝබර් සිට දෙසැම්බර් තෙක් යහපත් වර්ෂාපතනයක් ලැබුණත් ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා කාලයේ පොල් වගාව සහිත ප්‍රදේශ බහුතරයකට ලැබී ඇත්තේ මිලිමීටර් 100ට වඩා අඩු වර්ෂාපතනයක්. එම කාලයේ පාරිසරික උෂ්ණත්වය සෙල්සියස් අංශක 34ක්. ඒ අනුව 2023 වසරේ බලපෑමයි 2024 වසරේ අප්‍රේල් මාසයෙන් පසු පොල් ඵලදාව අඩුවීම කෙරෙහි බලපා තිබෙන්නේ.

ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයකින් වාර්ෂික ව පොල් ගෙඩි 7000ක ඵලදාවක් ලැබෙන බව ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ සංඛ්‍යා දත්ත අනුව පෙනී යනවා. එහෙත් හඳුන්වා දී තිබෙන පොල් ප්‍රභේදවල විභවය වාර්ෂික ව පොල් ගෙඩි 12,000ත් 15,000ත් අතර සංඛ්‍යාවක්. එම හැකියාව වර්ධනය වන්නේ පොල් ගසට නිවැරදි ලෙස පොහොර හා ජලය සැපයීමෙන් බවයි ආචාර්ය නයනි ආරච්චිගේ සඳහන් කළේ. අදහස් දක්වන ඇය: "දීර්ඝකාලීන ව මෙරට පොල් අස්වැන්න වර්ධනය කරගැනීම අත්‍යවශ්‍ය වූවක්. ඉන්දියාවේ හෙක්ටයාරයකින් වාර්ෂික ව ගෙඩි 9,000 ඉක්මවා ලබා ගන්නවා. ඇතැම් ප්‍රාන්තවල 12,000 ඉක්මවා ලබාගන්නා අවස්ථා දක්නට පුළුවන්. ඒ සඳහා වගාකරුවන් පොහොර සහ ජල සම්පාදන කටයුතු නිසි ලෙස පොල් ගසට ලබාදෙනවා. විශේෂයෙන් ම ඉන්දියානු රජයෙන් ජල සම්පාදනය උදෙසා වැය වන විදුලියට අය කිරීමක් කරන්නේ නැහැ. එය නොමිලේ ලබාදෙනවා. රජයට අප යෝජනා කරන්නේ පොල් නිෂ්පාදන අපනයනය කරන සෙස් අරමුදල (CESS) උපයෝගි කර ගනිමින් ඒ ඔස්සේ වගාකරුවන්ට හා පොල් කර්මාන්තයට පහසුකම් සැලසීමෙන් වගාකරුවන් දිරිගැන්වීමට හැකි බව".

පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දීර්ඝකාලීන විසඳුම් යෝජනා ඉදිරිපත් කරන එන්.එස් ජයලත්: "යටිවගා වැඩසටහන යටතේ වාර්ෂික ව පොල් පැළ මිලියන 2කට ආසන්න ව වගාකරුවන්ට ලබා දෙනවා. 2024 වසර අවසන් වන විට පැළ මිලියන 1.6ක් ලබාදීමයි අපගේ අරමුණ. පෙර වසරවලදී මෙවැනි පැළ, වගාකරුවන් වෙත නොමිලේ ලබා දුන්නත් පවතින ප්‍රතිපාදන ගැටලු හේතුවෙන් සහන මිල ගණන් යටතේයි මේ පැළ ලබා දෙන්නේ. ඒ අනුව ඉදිරි වසර 60ක් පමණ යන තෙක් හොඳ පොල් ඵලදාවක් ලබා දිය හැකි පැළ ස්ථානගත කිරීමට අපට හැකියාවක් තිබෙනවා."

පොල් සංවර්ධන අධිකාරියේ සභාපති ශාන්ත රණතුංග පවසන්නේ කෙටිකාලීන ව පොහොර යෙදීම සහ පොල් ගස් නිසි ලෙස නඩත්තුව කඩිනමින් කළ යුතු බව. යල් පැන ගිය ගස් ඉවත් කිරීමත් කළ යුත්තක්. 2030 වසරේදී පොල් ගෙඩි මිලියන 4,500ක් ලබාගැනීමත් අපනයන ඉලක්කය ලෙස ඇමරිකානු ඩොලර් බිලියන 4.5ක් සපුරා ගැනීමත් ඔවුන්ගේ ඉලක්කය වනවා.

මේ අනුව පෙනී යන්නේ කෙටිකාලීන ව පොල් මිල ඉහළ යාමෙන් පොල් කර්මාන්තය පිළිබඳ ව ඇති වෙමින් තිබෙන සමාජයේ කතාබහ පිටුපස එය හා බැඳුණු දිගුකාලීන කතන්දරයක් පවතින බව.

# මාධ්‍ය අවකාශයේ ප්‍රායෝගික එළඹුම

බිනූ දිලාරා ගමගේ

මෙරට පුරවැසියා මාධ්‍ය කෙරෙහි වඩා සබුද්ධික කිරීම හා ඒ සඳහා අවශ්‍ය ජන විඥානය සකස් කිරීමට වඩාත් සුදුසු ම ස්ථානය වන්නේ පාසල. පාසල් අධ්‍යාපනය මූලික කරගෙන මාධ්‍ය සාක්ෂරතාව ලබා දීමට හා ඒ සඳහා දරුවන්ගේ තාර්කික බුද්ධිය සංවර්ධනයට වඩාත් සුදුසු ම අවස්ථාවක් ලෙස සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන විෂය පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබා දීම සලකන්නට පුළුවන්. එවැනි සුවිශේෂ කර්තව්‍යයක් ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසල් 57ක සහභාගිත්වයෙන් නොබෝද (නොවැම්බර් 07) ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේදී සිදු වුණා. ඒ, පාසල් මට්ටමින් පැවතුණු පාසල් මාධ්‍ය සමාජවලට හා සන්නිවේදන විෂය හදාරන දරුවන්ට මාධ්‍ය පිළිබඳ ප්‍රායෝගික දැනුම සම්පාදනයත් මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ දරුවන්ගේ සවිඥානිකත්වය පුළුල් කිරීමත් අරමුණු කර පළමු වැඩමුළුව පවත්වමින්.


ප්‍රායෝගික පුහුණුව ලබමින්

අධ්‍යාපන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පාසල් මාධ්‍ය සමාජ වැඩසටහනට 2017 වසරේදී ගිවිසුමකට අත්සන් තබා තිබෙනවා. එම පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධනය හා ජනගත කිරීම සඳහායි ජනමාධ්‍ය අමාත්‍යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය එක් ව 2024 ඔක්තෝම්බර් 29 දින අවබෝධතා ගිවිසුමකට එළැඹුණේ. ඒ අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම හා දායකත්වය යටතේ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ප්‍රචාරක අනුග්‍රාහකත්වය ලබා දීම සහ වැඩසටහන් මෙහෙයවීම සිදු කරනවා.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ හර්ෂ බී. අබේකෝන් පවසන පරිදි තුන්වැනි ලෝකයේ රටවල 'දියුණු මාධ්‍ය සාක්ෂරතාවකින් යුත් ගෝලීය මාධ්‍ය ප්‍රජාවක්' ඇති කිරීමේ යුනෙස්කෝ සංවිධානයේ ජ්‍යාත්‍යන්තර ගෲන්වෝල් සම්මුතියේ මාර්ගෝපදේශවලට යටත් ව අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේ මූලිකත්වයෙන් 2000 වසරේදී පාසල් මාධ්‍ය සමාජ වැඩසටහන මෙරට පාසල් පද්ධතියට හඳුන්වා දී තිබෙනවා. පාසල් පද්ධතියේ පාසල් මාධ්‍ය සමාජ ජනප්‍රිය වීමට ඒ වන විටත් සන්නිවේදනය කෙරෙහි වැඩි උනන්දුවක්, නැඹුරුවක් සිසු දරුවන් අතර පැවතීම හේතු වී තිබෙනවා. පාසල් මාධ්‍ය සමාජවල අරමුණ වන්නේ දරුවන්ගේ සන්නිවේදන කුසලතා, නිර්මාණශීලී හැකියා වර්ධනය කිරීමට මාධ්‍ය පිළිබඳ අධ්‍යයන හා නව දැනුම ලබා දීම. මෙහි තවත් පියවරක් ලෙස ජාතික අධ්‍යාපන ආයතනය විසින් 'සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන' විෂය 2006 වසරේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ සඳහාත් 2009 වසරේදී අ.පො.ස. උසස් පෙළ සඳහාත් හඳුන්වා දී තිබෙනවා.

2010/2015 පමණ සිට සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා පාසල් දරුවන්ගේ උනන්දුවක් සහ පාසල් මට්ටමින් වැඩි පිළිගැනීමක් දක්නට ලැබුණා. අධ්‍යාපන විෂය සමගාමී අංශය විසින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපුරා දුන් බවයි සහකාර අධ්‍යක්ෂ හර්ෂ බී. අබේකෝන් පවසන්නේ. එහෙත් මේ විෂය ශාස්ත්‍රාලයීය අධ්‍යයන ජනගත කිරීමේ විශාල අභියෝගයක්


පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධනය හා ජනගත කිරීම සඳහා ගිවිසුම්ගත වෙමින්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනයට පැවතුණු නිසා 2016 වසරේදී ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පර්යේෂණ අංශය විසින් සමස්ත පාසල් මාධ්‍ය සමාජ වැඩපිළිවෙළ පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේදී 'පාසල් මාධ්‍ය සමාජ ජාතික වැඩසටහන' ආරම්භ වී තිබෙනවා.

1979දී ආරම්භ කරන ලද ස්වාධීන රූපවාහිනී සේවය මෙරට දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා වෙනුවෙන් කැප වී සිටින්නේ අනාදිමත් කාලයක සිට. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සභාපති ප්‍රියන්ත වෙදමුල්ල සඳහන් කරන්නේ ආයතනික වශයෙන් එක් ව පාසල් මාධ්‍ය අධ්‍යාපනය ඔස්සේ සිදු කරන මේ මැදිහත් වීම දරුවන්ගේ මාධ්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට ගත් කාලෝචිත හා වැදගත් පියවරක් බව.

අදහස් දක්වන ඔහු: "මාධ්‍ය අවකාශය හරවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා යොමු කරමින් පසුගිය කාලයේ කොවිඩ් 19 වසංගතය නිසා දැඩි දුෂ්කරතාවට මුහුණපෑ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය වෙනුවෙන් අප පෙනී සිටියා. මාධ්‍ය පයීතය නිවැරදි ව හඳුනා ගැනීමට හැකි තාර්කික බුද්ධියෙන් හෙබි පුරවැසියකු බිහි කිරීමේ මූලික පියවර ආරම්භ වන්නේ පාසලින්. එම නිසා දරුවන්ගේ මාධ්‍ය සාක්ෂරතාව සංවර්ධනය කිරීමට නම් පාසල හා සම්බන්ධ වීම වැදගත්. පාසල් මාධ්‍ය සමාජ ඔස්සේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමේ අරමුණින්, 'පාසල් මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහන' යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අවසරය ඇති ව පාසල් 10,000න් පාසල් 3500ක මාධ්‍ය සමාජ බිහි කිරීමටත් පාසල් මාධ්‍ය සමාජ සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා උපදේශනය ලබා දීමටත් ජනමාධ්‍ය විෂය උගන්වන ගුරුවරුන් විෂය ඉගැන්වීම් සඳහා සවිබල ගැන්වීමටත් හැකියාව ලැබී තිබෙනවා.

පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධනය හා ජනගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ අදහස් දක්වන රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා: "අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණයක් සහිත ව දරුවන්ගේ සුභ සිද්ධිය උදෙසා ක්‍රියාත්මක වන වඩාත් සාර්ථක වැඩපිළිවෙළක් විදිහට මේ වැඩසටහන සලකන්න පුළුවන්. න්‍යායෙන් තොර භාවිතයත් භාවිතයෙන් තොර න්‍යායත් නිසා ඇති වන ගැටලු මාධ්‍ය ක්ෂේත්‍රයේ පවා පොදුවේ නිරීක්ෂණය වනවා. එම නිසා මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන දරුවන්ට මාධ්‍ය විෂයට අදාළ ප්‍රායෝගික දැනුම සංවර්ධනය කිරීමේ වගකීම සහ කාලීන අවශ්‍යතාව පිළිබඳ සලකා බලමින්, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සතු සම්පත් හා හැකියාව උපයෝගි කරගෙන ඊට අවශ්‍ය සහයෝගය අප ලබා දෙනවා. ඉදිරියේදී මේ වැඩසටහන තවත් පුළුල් ව ව්‍යාප්ත කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය

ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේදී වැඩමුළුව පවත්වෙමින්





ක්‍රියාත්මක මේ වැඩසටහනට සමගාමී ව මාධ්‍ය සමාජවල දරුවන්ට සහ සන්නිවේදන විෂය හදාරන දරුවන්ට ස්වාධීන රූපවාහිනී නාලිකාව සමග එක් ව අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා නිර්මාණය කර දීමටත් පාසල් මට්ටමින් පාසල් ජනමාධ්‍යවේදීන් (Student Journalists) බිහි කිරීමටත් නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය මූලික කරගෙන අනාගත රැකියා අවස්ථා උත්පාදනයට අත්වැලක් සැපයීමටත් අප මෙහිදී අපේක්ෂා කරනවා."

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් එච්. එස්. කේ. ජේ. බණ්ඩාර පෙන්වා දෙන ආකාරයට 2006 වසරේ සිට මෙරට පාසල් අධ්‍යාපනයේ විෂයයක් ලෙස සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය දක්නට ලැබුණත් පසුගිය අවුරුදු 20කට ආසන්න කාලයේ මේ විෂය ක්ෂේත්‍රයේ ප්‍රායෝගික දැනුම පාසල් අධ්‍යාපනය සමග එකතු වූ බවක් දක්නට නැහැ. එම නිසා පාසල් දරුවන් අතර මාධ්‍ය සාක්ෂරතාව හා විෂය ක්ෂේත්‍රයේ

**පාසල් දරුවන්ට පවා බැහැර ව භාවිත කළ නොහැකි සමාජ මාධ්‍ය, ස්මාර්ට් ජංගම දුරකතනය තමන්ගේ අධ්‍යාපනයට අර්ථවත් ලෙස යොදා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීමත් මේ වැඩසටහනින් අපේක්ෂිත තවත් අරමුණක්. බිම් මට්ටමේ සිට ම ලබා ගන්නා පාසල් දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ සහභාගිත්වය සහිත ප්‍රායෝගික අධ්‍යාපනික වැඩසටහනක් වශයෙන් මෙය වඩාත් සුවිශේෂ වන්නේ එම නිසා.**

ජාලය එක් ව තවත් අවබෝධතා ගිවිසුමකට එළඹීමටත් නියමිතයි."

මාධ්‍ය හා සන්නිවේදනය හදාරන දරුවන්, පාසල් මාධ්‍ය සමාජවල දරුවන් ඉලක්ක කරගෙන එක් අධ්‍යාපන කලාපයක් ආවරණය කෙරෙන එක් වැඩමුළුවක් බැගින් මේ වැඩසටහන දීප ව්‍යාප්ත ව පැවැත්වීම ආරම්භ කර ඇති බව ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, ප්‍රවීණ මාධ්‍යවේදී හසන්ත හෙට්ටිආරච්චි පෙන්වා දෙනවා. අධ්‍යාපන කලාප කාර්යාල මට්ටමින් මේ වැඩසටහන පිළිබඳ පාසල් දැනුවත් කර සමාන අවස්ථා ලැබෙන පරිදි දරුවන් සහභාගි කර ගැනීමත් තෝරාගත් ඉඩ පහසුකම් සහිත පාසලක වැඩමුළුව සංවිධානය කිරීමත් සිදු වනවා. මේ වැඩමුළුවේදී මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා විද්වතුන් විද්‍යුත් මාධ්‍ය උපකරණ භාවිතය, ආලෝකකරණය, සංස්කරණය වැනි තාක්ෂණික දැනුම ලබා දෙන අතර දරුවන් පෝෂණය කරන්නේ

වැඩසටහන් නිෂ්පාදනය, වැඩසටහන් ඉදිරිපත් කිරීම, මාධ්‍ය ආචාර ධර්ම සහ මාධ්‍ය භාවිතය පිළිබඳ රසවත් දේශනවල විෂය සමගාමී දැනුමෙන්. මේ වැඩසටහන අවසානයේ දරුවන්ගේ නිර්මාණශීලීත්වය අගයමින් පඨිත නිර්මාණය (Content Creating) සඳහා දරුවන් දිරි ගැන්වීමටත් දරුවන් අතින් නිමැවෙන එම විශේෂාංග ස්වාධීන රූපවාහිනී සේවයේ 'ටෙලිවිෂන් ඉස්කෝලය' වැඩසටහන ඔස්සේ විකාශනය කිරීමටත් වර්ෂයක් අවසානයේ එම විශේෂාංග අතරින් වඩාත් සාර්ථක පඨිත නිර්මාණවලට ත්‍යාග ප්‍රදානයක් "Content Colombo Kids' Version" නමින් පැවැත්වීමටත් සැලසුම් කර ඇති බවයි හසන්ත හෙට්ටිආරච්චි පෙන්වා දෙන්නේ. පාසල් දරුවන්ට පවා බැහැර ව භාවිත කළ නොහැකි සමාජ මාධ්‍ය, ස්මාර්ට් ජංගම දුරකතනය තමන්ගේ අධ්‍යාපනයට අර්ථවත් ලෙස යොදා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීමත් මේ වැඩසටහනින් අපේක්ෂිත තවත් අරමුණක්. බිම් මට්ටමේ සිට ම ලබා ගන්නා පාසල් දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ සහභාගිත්වය සහිත ප්‍රායෝගික අධ්‍යාපනික වැඩසටහනක් වශයෙන් මෙය වඩාත් සුවිශේෂ වන්නේ එම නිසා.

මහාචාර්ය ටියුඩර් වීරසිංහ පවසන්නේ වර්ෂ 1600න් පමණ පසුව ක්‍රමයෙන් පුවත්පත්, සඟරා, වාර ප්‍රකාශන, ගුවන්විදුලිය, සිනමාව, රූපවාහිනිය වැනි සංහතික මාධ්‍යවල වර්ධනයත් සමග සංකීර්ණ සන්නිවේදන මාධ්‍ය අවකාශයක් ලෝකයේ නිර්මාණය වූ බව. එහිදී මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කරන පඨිත ග්‍රහණය කර ගැනීමට, විග්‍රහ කර ගැනීමට සහ පඨිත නිර්මාණය කර ගැනීමට පවතින ශක්‍යතාවේ සමස්තය අළලා මාධ්‍ය සාක්ෂරතාව බිහි වනවා. මාධ්‍ය අවකාශය නිර්මාණය වීමේ ප්‍රතිඵලයක් විදිහට 1920 - 1930 කාලයේදී ලෝක මට්ටමින් මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ හඳුනා ගැනීම සිදු වනවා. මාධ්‍ය පඨිතයක් නිර්මාණය අද වන විට පත් ව තිබෙන්නේ වෘත්තීය ක්ෂේත්‍රයක් බවට. මාධ්‍ය පඨිතයේ මතවාදීමය ස්වරූපයක්, ව්‍යාපාරමය ස්වරූපයක් සහ මිනිසුන්ගේ දැනුම, ලෝක දෘෂ්ටිය, සංවේදීතා සකස් කිරීම, මෙහෙයවීම ආදිය දැක ගන්නට පුළුවන්. එම නිසා මාධ්‍ය පඨිතයේ පවතින අර්ථ ග්‍රහණය කර ගැනීමට, පඨිත සංජානනය කර ගැනීමට, මාධ්‍ය පඨිත නිර්මාණය කරන්නන්ගේ අරමුණු හඳුනා ගැනීමට මාධ්‍ය සාක්ෂරතාව ඉතා වැදගත්. ඒ අනුව මාධ්‍ය පිළිබඳ ප්‍රායෝගික දැනුම සම්පාදනයෙන් මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ දරුවන්ගේ සවිඥානිකත්වය පුළුල් කිරීමට රජය ගත් මේ පියවර ඵලදායී වනු ඇත්තේ අදට වඩා හෙටට.





# පර්යේෂණ සම්භාෂණය

**සමේලා රාජපක්ෂ**

පර්යේෂණ සම්භාෂණයේදී ඉදිරිපත් කර තිබෙන්නේ පරිසරය පිළිබඳ අධ්‍යයනය කිරීම, ආර්ථිකය පිළිබඳ පර්යේෂණ කිරීම, සමාජය පිළිබඳ පර්යේෂණ කිරීම යන තිරසර සංවර්ධනයේ කාරණා තුන සම්බන්ධයෙන් වන පර්යේෂණ. එක්සත් ජාතීන්ගේ සංවිධානය 2030 වන විට තිරසර සංවර්ධන අභිමතාර්ථ (Sustainable development Goals / SDG Goals) 17ක් අත්කර ගැනීමට අපේක්ෂා කරන නිසා සෑම රටක් ම ඊට දක්වන්නේ දැඩි උනන්දුවක්. මේ නිසා කාලගුණික විපර්යාස වැනි තිරසර සංවර්ධනයේ පුළුල් පැතිකඩක් ආවරණය වන මාතෘකා ඊට ඇතුළත් ව තිබුණා.

"ඵලදායී පර්යේෂණ ඔස්සේ තිරසර අනාගතයක් ගොඩනැගීම" යන තේමාව යටතේ කොළඹ විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සම්භාෂණය (ARS-UOC) මෙවර පැවැත්වුණේ 2024 නොවැම්බර් 04 දින විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේදී. ඒ, විශ්වවිද්‍යාල ආචාර්ය ප්‍රජාව සහ ජගත් කීර්තිධර ගෝලීය විද්වතුන් රාශියකගේ එකමුතුවෙන් දැනුම බෙදා ගැනීම සහ නවෝත්පාදන උදෙසා වෙන් වූ දිනයක් ලෙස. මේ පර්යේෂණ සම්භාෂණයේ ප්‍රධාන ආරාධිතයා වූයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික ශ්‍රී ලංකා නියෝජිත අසුසා කුබෝතා.

2008 වර්ෂයෙහි නිත්‍ය වාර්ෂික කාර්යයක් ලෙස ආරම්භ වූ මේ වාර්ෂික පර්යේෂණ සම්භාෂණය විශ්වවිද්‍යාලයේ පීඨ, ආයතන, මණ්ඩප සහ පුස්තකාලය විසින් පවත්වනු ලබන පර්යේෂණ සැසිවාර සියල්ල ම එක් කරමින් පර්යේෂකයන්ට, ශාස්ත්‍රලෝලීන්ට සිය පර්යේෂණ කාර්ය විදහා දැක්වීම සඳහා වේදිකාවක් තනා තිබුණා. හුදෙක් විශ්වවිද්‍යාලයීය ආචාර්ය ප්‍රජාව කළ පර්යේෂණවලින් උකහා ගන්නා ලද නව දැනුම් සම්භාරය ව්‍යාප්ත කිරීමට පමණක් සීමා නොවී සියලු පීඨ සහ ආයතන අතර අන්තර් සම්බන්ධතාව ප්‍රවර්ධනයට ඉඩ වෙන් කර තිබීම මෙහි විශේෂත්වයක්.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩී.එච්. කරුණාරත්න පවසන ආකාරයට සාමාන්‍යයෙන් පර්යේෂණ සංඛ්‍යාව මත ලෝකයේ විශ්වවිද්‍යාලවල

ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය අනුව විශ්වවිද්‍යාල වර්ගීකරණය සිදු වනවා. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව 2%ක් වන ලෝකයේ ඉහළ ම ගණයේ විශ්වවිද්‍යාල හා පර්යේෂකයන් අතරට කොළඹ විශ්වවිද්‍යාලය ද අයත්. පසුගිය වසරේ සිදු කළ පර්යේෂණ 3128ක් අතරින් වැඩි ම බලපෑම් සහගත පර්යේෂණ (Impactful Research) සිදුකර ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලය නිසා තවදුරටත් ජන ජීවිතයට බලපෑම් කළ හැකි පර්යේෂණ ඉදිරිපත් කිරීමෙන් කොළඹ විශ්වවිද්‍යාලය ඉදිරියට ගෙන යන බව ඔහු පෙන්වා දෙනවා. ඒ, විශිෂ්ට ලෙස අධ්‍යාපනය ලැබීම සහ අධ්‍යාපනය ලබාදීම (Excellency Learning and Teaching)/ පර්යේෂණ, ජාලගතවීම් සහ පර්යේෂණ සඳහා කණ්ඩායම් සමග එකතුවීම/ නවෝත්පාදන ඉදිරිපත් කිරීම, ප්‍රාග්ධනය, යටිතල පහසුකම් ජනතාවට සහ විද්‍යාර්ථීන්ට ලබා දීම/ වගකිව යුතු කළමනාකරණය (Responsible Management) යන කොළඹ විශ්වවිද්‍යාලයට ආවේණික ප්‍රධාන අරමුණු හතර ඔස්සේ යමින්.

මේ පර්යේෂණ සම්භාෂණයේදී ඉදිරිපත් කර තිබෙන්නේ පරිසරය පිළිබඳ අධ්‍යයනය කිරීම, ආර්ථිකය පිළිබඳ පර්යේෂණ කිරීම, සමාජය පිළිබඳ පර්යේෂණ කිරීම යන තිරසර සංවර්ධනයේ කාරණා තුන සම්බන්ධයෙන් වන පර්යේෂණ. එක්සත් ජාතීන්ගේ සංවිධානය 2030 වන විට තිරසර සංවර්ධන අභිමථාර්ථ (Sustainable development Goals / SDG Goals) 17ක් අත්කර ගැනීමට අපේක්ෂා කරන නිසා සෑම රටක් ම ඊට දක්වන්නේ දැඩි උනන්දුවක්. මේ නිසා කාලගුණික විපර්යාස වැනි තිරසර සංවර්ධනයේ පුළුල් පැතිකඩක් ආවරණය වන මාතෘකා ඊට ඇතුළත් ව තිබුණා.

මෙවර පර්යේෂණ සම්භාෂණයේ සභාපති, කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඩිල්ෂානි  දිසානායක සඳහන් කරන්නේ පර්යේෂණය යනු නව දැනුම නිෂ්පාදනය කිරීමක් බව. ආචාර්යවරු උගන්වන්නේ කවුරුන් හෝ නිෂ්පාදනය කරන ලද, පොතපතට ඇතුළත් කළ දැනුමක්. එහෙත් එය ඉදිරියට ගෙන ගියේ නැතිනම් එම දැනුම යාවත්කාලීන වන්නේ නැහැ. මේ නිසා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලවල වගකීමක් මෙන් ම රැකියාවේ කොටසක් වන්නේ මේ නව දැනුම උත්පාදනය කිරීම බවත් ඒ සඳහා ඵලදායි ම මාර්ගය වන්නේ පර්යේෂණ සිදුකිරීම බවත් ඇය අවධාරණය කරනවා. පර්යේෂණවලින් නව දැනුම සොයා යන අලුත් පරම්පරාවක් බිහිවීමත් මෙහිදී ඉතා වැදගත්.

විශ්වවිද්‍යාල පර්යේෂණ ජාතික සංවර්ධන ක්‍රියාවලියට වැදගත් වන ආකාරය පිළිබඳ මහාචාර්ය ඩිල්ෂානි දිසානායක දක්වන්නේ මෙබඳු අදහසක්. ඇය; "අප කරන සෑම පර්යේෂණයක් ම රටේ සංවර්ධනයට දයක කර ගන්නට පුළුවන්. දේශගුණ විපර්යාස වැනි පරිසර වෙනස්කම්, කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු, ආර්ථික වෙනස්කම් පිළිබඳ අධ්‍යයනය කළ, විශ්ව දැනුම එකතු කරගත් විද්‍යාඥයන් පිරිසක් විශ්වවිද්‍යාලයේ ම සිටිනවා. විශ්වවිද්‍යාලයෙන් බාහිරවත් එවැනි ම වූ දක්ෂතා ඇති පිරිසක් සිටිනවා. අපට අවශ්‍ය වුණේ මේ දෙපිරිසේ දැනුම ප්‍රායෝගිකත්වයට නංවමින් රටේ සංවර්ධනයට දායක කර ගැනීම. ලෝකයේ නව පර්යේෂණ ක්‍රමවේද ශ්‍රී ලංකාව වැනි රටවල භාවිත කරන විට ඇතිවන විශාල ම අභියෝගය වන්නේ 'අප සංවර්ධනය වෙමින් පවතින රටක් ය' යන මානසිකත්වයෙන් මිදීම. එය කළ යුත්තක්. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල නවීන තාක්ෂණික පහසුකම් තිබුණත් යම් යම් අවස්ථාවල ඒවා ඒ ඒ විශ්වවිද්‍යාලවලට සීමා වී තිබෙනවා. අප කළ යුත්තේ සියලු විශ්වවිද්‍යාල එකතු වී එක් ගමනක් යාම.

**සෑම පර්යේෂණයක් ම රටේ සංවර්ධනයට දායක කර ගන්නට පුළුවන්. දේශගුණ විපර්යාස වැනි පරිසර වෙනස්කම්, කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු, ආර්ථික වෙනස්කම් පිළිබඳ අධ්‍යයනය කළ, විශ්ව දැනුම එකතු කරගත් විද්‍යාඥයන් පිරිසක් විශ්වවිද්‍යාලයේ ම සිටිනවා. විශ්වවිද්‍යාලයෙන් බාහිරවත් එවැනි ම වූ දක්ෂතා ඇති පිරිසක් සිටිනවා.**

විශ්වවිද්‍යාලවලත් අධ්‍යාපනයෙන් තිරසර සංවර්ධනය පිළිබඳ මානසිකත්වය ඇති කිරීම කෙරෙහි  විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ස්වාභාවික විද්‍යා, සමාජ විද්‍යා සහ මානව විද්‍යා සම්බන්ධ පර්යේෂණ සඳහා තිබෙන මැදිහත්වීම ගැන කතා කරන විට ලෝකයේ වැඩි අවධානයක් ලබා දී ඇත්තේ ස්වාභාවික විද්‍යා පර්යේෂණවලට. නමුත් මනෝවිද්‍යාව, අධ්‍යාපනය වැනි දේ ඊට එකතු වුණේ නැත්නම් එහි ප්‍රතිඵලය සම්පූර්ණ වන්නේ නැහැ. පර්යේෂණ සම්භාෂණයෙන් අප බලාපොරොත්තු වුණේ ඒ සෑම අංශයක් ම එකතු කරගෙන පර්යේෂණ සිදු කිරීම."

මේ සම්භාෂණයේදී මහාචාර්ය මොහාන් මුණසිංහ 'තිරසරභාවය සහ සමකාලීන හරිත අන්තර්ග්‍රාහී සංවර්ධනය (BIGG) සහ දේශගුණික යුක්තිය උදෙසා අන්තර් ශික්ෂණමය පර්යේෂණ' යන මැයෙන් දේශනයක් ද ජපානයේ වසේඩා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය යසුයුකී ටෝඩෝ 'ගෝලීය සැපයුම් දාමයන්හි තිරසර සංවර්ධනය' යන මැයෙන් දේශනයක් ද සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ සභාපති වෛද්‍ය වින්යා ආරියරත්න 'තිරසර අනාගතයක් ගොඩනැගීමේදී ප්‍රජාවගේ සහ සිවිල් සමාජයේ කාර්යභාරය' මැයෙන් දේශනයක් ද පැවැත්වූවා.



# අවශ්‍ය වන්නේ නිෂ්පාදන ආර්ථිකයක්





ආචාර්ය
**නන්දසිරි කීඹියහෙට්ටි**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය

ප්‍රශ්නය:

දේශපාලන බලය, නීතිය, සාමාන්‍ය ජන ජීවිතය අතර සබඳතාව ඔබ විශ්ලේෂණය කරන්නේ කෙසේ ද?

පිළිතුර:

ආණ්ඩුවකට විශාල බලයක් ලැබුණු අවස්ථා මෙන් ම සුළු බලයක් ලැබුණු අවස්ථා ද ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ දක්නට ලැබෙනවා. 1977දී ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුවට 5/6ක බලයක් ලැබුණේ කොට්ඨාස ඡන්ද ක්‍රමය යටතේ. මෙවර ජාතික ජන බලවේගයට 7/10ක බලයක් ලැබී තිබෙන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ. නමුත් රටකට වැදගත් වන්නේ බලය කොතරම් ප්‍රමාණයකින් ලැබෙනවාද යන්න නොවෙයි බලය භාවිත කරන ආකාරය. බලය නීතිය අභිභවා නොයා යුතුයි. බලය නීතියට වඩා ඉහළින් ක්‍රියාත්මක සෑම අවස්ථාවක ම අපට හිමි කර දුන්නේ අහිතකර ප්‍රතිඵල. ජනතාව බලය ලබා දී තිබෙන්නේ නීතිය ක්‍රියාත්මක කරවීම සඳහාත් ජන ජීවිතය යහපත් කරවීම සඳහාත්. පසුගිය කාලවකවානුවේ ශ්‍රී ලංකාවේ අප දුටු අත්දැකීම නම් බලය නීතියට වඩා ඉහළින් ක්‍රියාත්මක වීමත් එහි ප්‍රතිඵලයක් විදියට ජනතාවගෙන් කොටසක් පමණක් වරප්‍රසාද ලබන තත්ත්වයට පත්වීමත්. ආර්ථිකයේ සුළු පිරිසක් වටා ධනය හා නිෂ්පාදන අවශ්‍යතා ඒකරාශි වන තත්ත්වයක් දක්නට තිබුණා. එහි ඵලයක් ලෙසින් එම ආර්ථිකයේ ම බහුතර ජනකොටසට ආර්ථිකයට දායක වීමේ අවස්ථාව අහිමි ව ගොස් තිබුණා. වර්තමානයේ අප ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන්නේ ජන ජීවිතය යහපත් කරවීම සඳහා බලය යෙදවීම. ඒ අතර මැද තත්ත්වය නීතිය සහ ආර්ථිකය ලෙසින් හඳුන්වන්න පුළුවන්. සෑම පුද්ගලයකුගේ ම අයිතිවාසිකම් සුරැකෙන, සෑම පුද්ගලයකුට ම අවස්ථා ලැබෙන සමාජයක් නිර්මාණය කිරීමට නීතිය අවශ්‍ය වනවා. එසේ වුවහොත් පමණයි ආර්ථිකයක නිෂ්පාදන අවස්ථා සමාජයේ හැමදෙනාට ම ස්පර්ශ කළ හැකි තත්ත්වයකට පත්වන්නේ. එසේ නොවුණහොත් බලය ඇති පුද්ගලයන් නිෂ්පාදන අවස්ථා වැඩි ප්‍රමාණයක් අත්පත් කර ගන්නවා. ආර්ථිකයේ නිෂ්පාදන අවස්ථා හිමිකර ගැනීම සඳහා බලය ප්‍රධාන සාධකයක් නොවන තත්ත්වයක් පැවතිය යුතුයි. රටේ සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ කුසලතාව සහ අවශ්‍යතාව අනුව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සහ ඒවා පවත්වාගෙන යාමට හෝ නිෂ්පාදන හා සේවා වෙළෙඳපොළට සම්බන්ධ වීමට දේශපාලන බලය හෝ අනුගාමි දේශපාලන බලයක් අවශ්‍ය නොවන තත්ත්වයක් සමාජයේ නිර්මාණය විය යුතුයි. එවිටයි ජන ජීවිතය යහපත් වන ආකාරයට ආර්ථිකයක පුද්ගලයන්ට හිමි පංගුව ඔහු කරා ළඟා කර ගත හැක්කේ.

ප්‍රශ්නය:

ඔබ පවසන්නේ නීතියේ ආධිපත්‍යය තහවුරු කර පුද්ගල චර්යාව පාලනය කිරීමෙන් අයිතිවාසිකම් සුරැකෙන සමාජයක්, එනම් ශිෂ්ට සම්පන්න දේශපාලන සංස්කෘතියක් බිහි කළ හැකි බව ද?

පිළිතුර:

නීතියේ ආධිපත්‍යය තහවුරු වීම ශිෂ්ට සම්පන්න දේශපාලන සංස්කෘතියකට අවශ්‍ය මූලික පදනම සපයන නමුත් ඒ නිසා ම සමාජයක් ශිෂ්ට සම්පන්න වේයැයි බලාපොරොත්තු වෙන්න බැහැ. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ රාජාසන කතාවේදී (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ) සඳහන් කළා නීතියට වඩා ඉහළින් කිසිවකු නොසිටිය යුතු බව. සාධාරණ සමාජයක් සඳහා අවශ්‍ය වන මූලික කාරණයක් ලෙසින් නීතියේ ආධිපත්‍යය තහවුරු වී තිබීම දක්වන්න පුළුවන්. නීති සම්පාදනය කිරීමත් විධායකය සම්පාදනය කරන නීති ක්‍රියාත්මක කිරීමත් පාර්ලිමේන්තුව සතු කාර්යයක්. අධිකරණය විසින් කරනු ලබන්නේ නීතිය අර්ථ දැක්වීම. මේ පද්ධතිය ක්‍රියාත්මක වන්නේ නීතිගරුක සමාජයක් නිර්මාණය කිරීම සඳහා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නීතියට ගරු කරන, ඒ අනුව ක්‍රියා කරන, ආකල්පමය වශයෙන් දියුණු, සදාචාර සම්පන්න ජනතාවක් සිටින සමාජයකයි ශිෂ්ට සම්පන්න දේශපාලන සංස්කෘතියක් ඇති විය හැක්කේ. ශිෂ්ට සම්පන්න දේශපාලන සංස්කෘතියක් සඳහා පුද්ගල අධ්‍යාත්මයේ දියුණුවත් වැදගත්.

### ප්‍රශ්නය

බොහෝ ආර්ථික අභියෝග ජය ගැනීමට බාධාවක් ව තිබූ දේශපාලන අස්ථාවර බව දැන් නැහැ. 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' සඳහා යන ගමනේදී ආණ්ඩුවට කුමන අභියෝගවලට මුහුණපෑමට සිදු වෙයි ද?

### පිළිතුර

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව සියයට 31ක්. නාගරික දරිද්‍රතාව සියයට 18ක් වන විට වතු අංශයේ දරිද්‍රතාව සියයට 51ක්. මන්දපෝෂණයත් පවතින්නේ ඉහළ මට්ටමක. උගතුන් රට අතහැර යාම ඉහළ ගොස් තිබෙනවා. මේ නිසා පවතින ජීවිතය ලස්සන නැහැ. පොහොසත් රටක් නිර්මාණය කළහොත් ලස්සන ජීවිතයක් ලබා ගත හැකියි යන අදහසිනුයි 'ලස්සන ජීවිතයක්, පොහොසත් රටක්' යන සංකල්පය මතු වන්නේ. පොහොසත් රටක් යන්නෙහි අදහස රටේ ඒක පුද්ගල ආදායම ඉහළ යාම ම නොවෙයි. ආර්ථිකයේ සුළු පිරිසක් අතර ධනය ඒකරාශී වීමෙන් එය සිදු වන්නට පුළුවන්. ඒක පුද්ගල ආදායමෙන් කියවෙන්නේ නැහැ රටේ සෑම පුද්ගලයකුට ම එම ආදායම සමාන ව ලැබෙන බවක්. ඒ නිසා පොහොසත් රටක් වීමට නම් මූලික වශයෙන් කාරණා තුනක් ඉටු විය යුතුයි. ඒ, ආර්ථිකය වර්ධනය වීම, ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ පුද්ගලයන් අතර බෙදී යාම සහ රටේ සංස්කෘතිකමය, සදාචාරාත්මක වශයෙන් දියුණු සංස්කෘතික ලක්ෂණවලින් පූර්ණ වූ තත්ත්වයක් වශයෙන්. මේ සඳහා වත්මන් ආණ්ඩුව හඳුනාගෙන තිබෙන්නේ නිෂ්පාදන ආර්ථිකයක් ලෙසින් ශ්‍රී ලංකා ආර්ථිකය දියුණු කිරීම.

පහත මිල ගණන් යටතේ ගුණාත්මක භාණ්ඩ හා සේවා පරිභෝජනය කළ හැක්කේ නිෂ්පාදන ආර්ථිකයකට සියලු දෙනාට දායක වීමේ හැකියාව ලැබී, එමගින් තමන්ගේ ආදායම් මට්ටම ඉහළ යාමෙන් පමණයි. ශ්‍රී ලංකාව මේ වන විට විශාල ණය බරක් සහිත රටක්. ණය බරෙන් අත්මිදෙන්නට නම් විදේශ විනිමය ඉපයිය යුතුයි. ඒ සඳහා නිෂ්පාදන ආර්ථිකයක් අවශ්‍ය වන අතර ම ජාත්‍යන්තර වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවට පවතින වෙළෙඳ පංගුව ඉහළ දමා ගත යුතු වනවා.

මේ ගමනේදී ශ්‍රී ලංකාවට අභියෝග රාශියකට මුහුණදෙන්න සිදුවේවි. පළමු අභියෝගය වන්නේ වත්මන් ආණ්ඩුවට

**ඒක පුද්ගල ආදායමෙන් කියවෙන්නේ නැහැ රටේ සෑම පුද්ගලයකුට ම එම ආදායම සමාන ව ලැබෙන බවක්. ඒ නිසා පොහොසත් රටක් වීමට නම් මූලික වශයෙන් කාරණා තුනක් ඉටු විය යුතුයි. ඒ, ආර්ථිකය වර්ධනය වීම, ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ පුද්ගලයන් අතර බෙදී යාම සහ රටේ සංස්කෘතිකමය, සදාචාරාත්මක වශයෙන් දියුණු සංස්කෘතික ලක්ෂණවලින් පූර්ණ වූ තත්ත්වයක් වශයෙන්.**

ලැබී තිබෙන ජන වරමේ ප්‍රමාණය සහ සංයුතිය. එය වරප්‍රසාදයක් නොවෙයි අභියෝගයක්. ජන බලයේ පාවෙන ඡන්ද විශාල සංඛ්‍යාවක් පැවතීමයි ඊට හේතුව. මේ පිරිසේ අභිලාෂ ඉටු කිරීමට ආණ්ඩුව යම් හෙයකින් අපොහොසත් වුවහොත් එම ජන ප්‍රසාදය අවම වන්නට පුළුවන්. මේ පිරිස ජාතික ජන බලවේගයේ මූලික ආර්ථික ප්‍රතිපත්තිය සහ එහි දිගුකාලීන සැලසුම් පිළිබඳ අවබෝධයෙන්, ඒ පිළිබඳ පැහැදීමෙන් ඡන්දය භාවිත කළ පිරිසක් නොවෙයි. බොහෝ විට මේ පිරිස අනෙකුත් දේශපාලන පක්ෂ කෙරෙහි ඇති වූ කලකිරීම නිසා හෝ වංචා දූෂණ පිටු දැකීමට දේශීය සම්පත් විකිණීමට එරෙහි ව ඡන්දය භාවිත කළ අය වන්නට පුළුවන්. වංචා හා දූෂණවලට සම්බන්ධ වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒම සහ ඔවුන්ට දඩුවම් පැමිණවීම ක්ෂණික ව ම සිදු කරනු දැකීමට එම පිරිස කැමතියි. නමුත් ආණ්ඩුවට එය එසේ ම කළ නොහැකි වන්නේ එය නීතිමය ක්‍රියාවලියක ප්‍රතිඵලයක්, යම් කාලයක් ගතවන ක්‍රියාවලියක් මෙන් ම ඉතා ප්‍රවේශම් සහගත ව කළ යුත්තක් නිසා. ආණ්ඩුවකට තම බලාධිකාරයෙන් ඔබ්බට යන, පාලනය කළ නොහැකි තත්ත්ව පිළිබඳ අනවබෝධයෙන් යුක්ත ජන කොටසක් ද මෙහි සිටිනවා. ආණ්ඩුවට පාලනය කළ හැක්කේ ආර්ථිකයක සමස්තයෙන් සියයට 20ක තරම් කොටසක්.

### ප්‍රශ්නය

ඔබ පවසන පරිදි රාජ්‍ය අංශයට ආර්ථිකයක සියල්ල පාලනය හෝ අවශ්‍ය පරිදි හැසිරවීම කරන්නට බැහැ. එසේනම් පොහොසත් රටක් නිර්මාණයේදී රාජ්‍ය අංශය සතු කාර්යභාරය කුමක් විය යුතු ද?

### පිළිතුර

රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව අවම මට්ටමක පවතින බවට බොහෝ දෙනා අතර මතයක් පැවතියත් ඉතා කාර්යක්ෂම රාජ්‍ය ආයතනත් මේ අතර ම තිබෙනවා. එසේනම් රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව අවම වන්නේ කෙසේ ද? කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කරන්නේ අඩු යෙදවුමකින් වැඩි නිමැවුමක් ලබා ගැනීම. මෙහි යෙදවුම් යන්න කාලය හෝ ශ්‍රමය හෝ වියදම හෝ වන්නට පුළුවන්. එහෙත් අවම යෙදවුමකින් ඉහළ නිමැවුමක් ලබා ගැනීමේ හොඳම ක්‍රමය තාක්ෂණය භාවිත කිරීම. එහිදී එය ප්‍රශස්ත මට්ටමින් භාවිත කරනවා ද යන්න ගැටලුවක් පවතිනවා. එහෙත් රාජ්‍ය සේවය තාක්ෂණය ඔස්සේ උපරිම කාර්යක්ෂමතාවකින් පවත්වාගෙන යනවානම් කාලය විශාල වශයෙන් අඩු කර ගන්නට පුළුවන්. ස්ථාපිත කිරීමේ මූලික පිරිවැය යම් ආකාරයකින් ඉහළ මට්ටමක පැවතියත් ක්‍රියාකාරී වියදම අවම මට්ටමකයි පවතින්නේ. මෙහිදී භාවිත වන්නේ අවම ශ්‍රම ඒකක. රාජ්‍ය සේවයේ පවතින ශ්‍රමය සහ තාක්ෂණය ද භාවිත කරන විට ආණ්ඩුව අභියෝගයකට මුහුණදෙන්න පුළුවන් රාජ්‍ය වියදම සම්බන්ධ ව. නමුත් සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි මානව සම්පත භාවිත කළ යුතු ම ක්ෂේත්‍ර හැර අනෙකුත් ක්ෂේත්‍රවලට නව බඳවා ගැනීම් නොකර සිටීමට ආණ්ඩුවට හැකියාව තිබෙනවා. එවිට විරැකියාවෙන් පෙළෙන ජන කොටසක් පිටත සිටිනවානම් ආණ්ඩුවෙන් පිටත ආර්ථිකයක් නිර්මාණය කර තිබිය යුතුයි. ඒ අනුව ආණ්ඩුවේ ප්‍රධාන කාර්යභාරය විය යුත්තේ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් පවත්වාගෙන යන අතරතුර ම ආණ්ඩුවෙන් පිටත ශක්තිමත් ආර්ථිකයක් පවත්වා ගැනීම.

සාකච්ඡා කළේ
**දීප්ත කුමාර බටගොඩ**

# ශ්‍රී ලංකා දේශපාලනයේ පරිවර්තනය

ශ්‍රී ලංකාවේ 2024 පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජාතික ජන බලවේගය ආණ්ඩුවක් පිහිටුවා ගත්තේ පාර්ලිමේන්තුවේ බහුතර බලයක් දිනා ගනිමින්. මේ ඡන්ද ප්‍රතිඵලය පිළිබඳ සමාජයේ සුවිශේෂ අවධානයක් යොමු ව තිබෙනවා. මා දකින ආකාරයට මෙවර මැතිවරණයේදී බොහෝ පිරිසක් ඡන්දය පාවිච්චි කළේ පැවතුණු දේශපාලන ක්‍රමය ගැන කලකිරීමෙන්. දේශපාලන බලය දරා සිටි පක්ෂවල අභ්‍යන්තරය බිඳ වැටීමත් සමග සිදු වුණේ එම පක්ෂ සමග සිටි ජනතාව ජාතික ජන බලවේගය දෙසට යොමු වීම.

මේ සඳහා බලපෑ කෙටිකාලීන පසුබිමක් මෙන් ම දිගුකාලීන පසුබිමක් තිබෙනවා. කෙටිකාලීන ව ආර්ථිකය අර්බුදයක් ඇතිවුණා. කොවිඩ් 19 වසංගතයෙන් රටට සැලකිය බලපෑමක් සිදු වුණා. ඒ සමග විශාල ජනතා නැගිටීමක් ද ඇතිවුණේ පවතින ක්‍රමය කෙරෙහි විරෝධතා මතු වීමෙන්. මේ නිසා ජනතාවට විශ්වාසයක් ඇතිවුණා 'පවතින දේශපාලන ක්‍රමය වෙනස් කළ යුතු ය' (System change) යන්න. දිගුකාලීන ව ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජාතික පක්ෂයේ අභ්‍යන්තරය බිඳවැටීම මීට දැඩි ව බලපෑවා. මේ නිසා ජනතාව දේශපාලන පක්ෂවලට දක්වන පක්ෂපාතීත්වය එන්න එන්න ම අඩු වුණා.

1950 සහ 1960 ගණන්වලයි ශ්‍රී ලංකා-යූඇන්පී යනුවෙන් පක්ෂ බෙදීම ඇති වුණේ. මූලික වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනයා මේ දේශපාලන පක්ෂ දෙකට සම්බන්ධ ව සිටියා. පක්ෂ දෙක මාරුවෙන් මාරුවටයි බලය ලබා ගත්තේ. ඔවුන්ට අපේක්ෂාවක් තිබුණා මෙවර නැතහොත් 'ඊළඟ මැතිවරණ ජයග්‍රහණය තම පක්ෂයට ලැබිය යුතු ය' යන්න. එවිටයි ස්ථිර ජනපදනමක් පක්ෂයකට සැකසෙන්නේ. 1977න් පසු මේ තත්ත්වය වෙනස් වුණා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අවුරුදු 17ක් රට පාලනය කළා. 1994න් පසුවත් ආණ්ඩු බලය හිමිකර ගත් පක්ෂවල සමතුලිත බව බිඳ වැටුණා. එම සමතුලිත බව රැකීමට නම් නිතර නිතර ආණ්ඩු වෙනස් විය යුතුයි. එය සිදු වුණේ නැහැ. බලය හිමි කර ගන්නා පක්ෂ දීර්ඝකාලයක් ආණ්ඩු බලය පවත්වාගෙන ගියා. ඒ නිසා මෙය පක්ෂවල සමතුලිතභාවයට බාධාවක්. 1977න් පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙන් ම 1994න් පසු එක්සත් ජාතික පක්ෂය බිඳ වැටුණා. මෙවැනි පසුබිමක 1977න් පසු එම පක්ෂවල ජනපදනම දුර්වල වන ආකාරයයි දක්නට ලැබුණේ.



මහාචාර්ය
**නිර්මාල් රංජිත් දේවසිරි**
ඉතිහාස අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

මීට සාපේක්ෂ ව තවත් වැදගත් ප්‍රධාන ප්‍රවණතා දෙකක් සිදු වුණා. පළමුවැන්න විශාල අර්ධ නාගරික ජනගහනයක් ඇතිවීම. ඔවුන් කොළඹ නගරය ආශ්‍රිත ව රැකියාවල නිරත සහ කොළඹ අවට නගරවල පදිංචි පිරිස්. ඔවුන්ගේ දේශපාලන පක්ෂ පිළිබඳ ආකල්ප, බලාපොරොත්තු, දේශපාලනය සමග තිබෙන ව්‍යුහාත්මක සම්බන්ධය වෙනස්. ඊට හේතුව ග්‍රාමීය ජනතාව රඳා පැවතුණේ රජයේ සහනාධාර වැනි ක්‍රම මත. ඔවුන්ට දේශපාලක පක්ෂ කෙරෙහි පක්ෂපාතීත්වයක් තිබුණා. විශේෂයෙන් ග්‍රාමීය දේශපාලන පක්ෂ සමග දේශපාලන බැඳියාවක් තිබුණා.

නමුත් 1990න් පමණ පසු අලුත් ජන කොටස්වල එවැනි දේශපාලන



යුද්ධය නිමවීමෙන් පසු උතුරු නැගෙනහිර දේශපාලන පක්ෂවල පරිවර්තනන සිදුවුණා. දෙමළ ප්‍රධාන පක්ෂවලට තිබුණු ආධිපත්‍යය අඩුවුණා. දෙමළ ජාතිකවාදී සම්ප්‍රදායේ ඉල්ලීම්වලට වඩා ඔවුන්ට අවශ්‍ය වුණේ ක්‍රමයක යම්කිසි වෙනසක්. යුද්ධයෙන් පසු දකුණේ ආණ්ඩුව උත්සාහ දැරුවේ මිලිටරි පාලනය දිගට ම පවත්වාගෙන යාමට නිසා ඒ පිළිබඳ ඇතිවුණේ කලකිරීමක්. ඔවුන් සිතුවා ජාතික ජන බලවේගය එයට වෙනස් විදියට ආමන්ත්‍රණය කරනු ඇතැයි කියා. උතුරේ වසා තිබුණු මාර්ග විවෘත කිරීම වැනි ක්‍රියාකාරකම් ද එම ප්‍රදේශවල ජනතාවට තම ඡන්දය පාවිච්චි කිරීමේදී යම් තරමකට බලපාන්නට ඇති.

පක්ෂපාතිත්වයක් තිබුණේ නැහැ. මේ නිසා පක්ෂ හැසිරවීම අසීරු වූවා මෙන් ම පක්ෂ කෙරෙහි කලකිරීමක් ඇති වුණා. එයයි දෙවැනි ප්‍රවණතාව. එම පක්ෂවල නායකත්වය දූෂිත වුණා. දීර්ඝකාලීන බලයේ සිටින ආණ්ඩු සමග සිටි නිසා ඔවුන්ට පුළුවන් වුණා එම ආණ්ඩු බලය පාවිච්චි කර ධනය ඉපයීමට හා බලය අවභාවිත කිරීමට. ඔවුන් කළේ ආණ්ඩු බලය හුවමාරු වන දිශාවට මාරු වීම. ඔවුන්ට උද වුණේ. බලය නොමැති ව සිටිය නොහැකි තත්ත්වයක්. ඔවුන් දූෂිත බව ජනතාවට හැඟුණු නිසා ඒ පිළිබඳ විශාල කලකිරීමක් ජනතාවට ඇතිවුණා. එයයි විශාල ජන අරගලයක් ලෙස 2022 මැයි 09 දින ප්‍රකාශයට පත් වුණේ. පසුකාලීන ව ජාතික ජන බලවේගයේ ජයග්‍රහණයට මේ දේශපාලන කලකිරීමයි දැඩි ව බලපෑවේ. දිගුකාලීන ව ඇති වූ මේ පසුබිම හමුවේ ජනතාව පත් වුණේ අතෘප්තියට. එය කෙතරම්ද යන්න ඡන්ද පොරොන්දු වුවත් ජනතාව සැලකිල්ලට ලක් කළේ නැහැ. 1956දී මෙන් ම 1977දී ඇති වූ විශාල ජන හැරවීම්වලදී ඡන්ද පොරොන්දු වැදගත් නොවූවා සේ ම මෙවර ජන හැරවීමේදීත් ජනතාව එවැනි පොරොන්දුවලින් වෙනස් කළ නොහැකි වුණා.

යුද්ධය නිමවීමෙන් පසු උතුරු නැගෙනහිර දේශපාලන පක්ෂවල පරිවර්තනන සිදුවුණා. දෙමළ ප්‍රධාන පක්ෂවලට තිබුණු ආධිපත්‍යය අඩුවුණා. දෙමළ ජාතිකවාදී සම්ප්‍රදායේ ඉල්ලීම්වලට වඩා ඔවුන්ට අවශ්‍ය වුණේ ක්‍රමයක යම්කිසි වෙනසක්. යුද්ධයෙන් පසු දකුණේ ආණ්ඩුව උත්සාහ දැරුවේ මිලිටරි පාලනය දිගට ම පවත්වාගෙන යාමට නිසා ඒ පිළිබඳ ඇතිවුණේ කලකිරීමක්. ඔවුන් සිතුවා ජාතික ජන බලවේගය එයට වෙනස් විදියට ආමන්ත්‍රණය කරනු ඇතැයි කියා. උතුරේ වසා තිබුණු මාර්ග විවෘත කිරීම වැනි ක්‍රියාකාරකම් ද එම ප්‍රදේශවල ජනතාවට තම ඡන්දය පාවිච්චි කිරීමේදී යම් තරමකට බලපාන්නට ඇති. ඔවුන්ට පෙනුණා ජාතික ජන බලවේගය පෙර ආණ්ඩුවලට වඩා ජාතික ආරක්ෂාව පිළිබඳ වෙනස් ප්‍රවේශයක් උතුර සම්බන්ධයෙන් දරනු ඇති බවට. විශේෂයෙන් තරුණ පිරිස් මෙහිදී ඡන්දය භාවිත කළා එවැනි කාරණා කෙරෙහි අවධානය යොමු කරමින්.

මෙවර ජයග්‍රාහී පාර්ශ්වය ලෙස ජාතික ජන බලවේගයට ජනාධිපතිවරණයේදී ලැබුණු ඡන්ද සංඛ්‍යාවට වඩා පාර්ලිමේන්තු මැතිවරණයේදී ලැබුණු ඡන්ද සංඛ්‍යාව වැඩියි. එය මීට පෙර පැවති මැතිවරණවලට වඩා වෙනස් තත්ත්වයක්. මීට පෙර සිදු වූයේ ජයග්‍රාහී පාර්ශ්වයට ජනාධිපතිවරණයේදී වැඩි ඡන්ද සංඛ්‍යාවකුත් පාර්ලිමේන්තු මැතිවරණයෙදී අඩු ඡන්ද සංඛ්‍යාවකුත් ලැබීම. එහෙත් මෙවර ජාතික ජන බලවේගයට ජනාධිපතිවරණයේදී ලැබුණේ අඩු ඡන්ද සංඛ්‍යාවක් පාර්ලිමේන්තු මැතිවරණයෙදී ඊට වැඩි ඡන්ද සංඛ්‍යාවත් ලැබුණා. යම්කිසි ආකාරයකට ජනාධිපතිවරණයට පෙර පාර්ලිමේන්තු මැතිවරණය පැවත්වූයේනම් පාර්ලිමේන්තු මැතිවරණයෙදී ජාතික ජන බලවේග යට ලැබෙන ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් ජනාධිපතිවරණයේදී ලැබෙනවා. ඒ අනුව පෙර සහ පසු වශයෙන් ඡන්දය පවැත්වීම අනුවයි මෙවර ප්‍රතිඵලය අඩු වැඩි වී තිබෙන්නේ.

ජනාධිපතිවරණයේ තරග බිමේ සිටි ප්‍රධාන අපේක්ෂකයන් 03 දෙනාට ඡන්දය ලබා දුන් පිරිස සිතුවේ තමන්ගේ අපේක්ෂකයා දිනනු ඇතැයි යන්න. නමුත් කුමන අපේක්ෂකයා ජයග්‍රහණය කරයි ද යන විශ්වාසයක් ජනතාවට තිබුණේ නැහැ. කෙසේ වෙතත් ජාතික ජන බලවේග යේ අපේක්ෂක අනුර දිසානායක එම ජය තහවුරු කරගත් නිසා එහි වාසිය පාර්ලිමේන්තු මැතිවරණයේ ජයග්‍රහණයට තීරණාත්මක සාධකයක් වුණා. මෙවැනි පසුබිමක තම පක්ෂ කෙරෙහි පක්ෂපාතිත්වයක් නැති නිසාත් තම පක්ෂය දිනනු ඇතැයි බලාපොරොත්තුවක් නැති නිසාත් අනෙකුත් පක්ෂ කෙරෙහි පක්ෂපාතිත්වය දැක් වූ පිරිස් ජාතික ජන බලවේගයේ ජයග්‍රහණය තහවුරු කිරීමය දයක වුණා. ජනතාවට අපේක්ෂකයා යන පුද්ගල සාධකයට වඩා රටේ රැල්ල ගමන් කරන දිශාවත් වැදගත් වුණා. මේ නිසා පාර්ලිමේන්තු මැතිවරණයේ ආධුනික අපේක්ෂකයන් බොහෝ සිටියත් ජාතික ජන බලවේගය වටා ජනතාව ඒකරාශි වුණේ අනුර දිසානායක, හරිනි අමරසූරිය වැනි ජනප්‍රිය චරිත කෙරෙහි විශ්වාසය තබමින්.

වත්මන් ආණ්ඩුවට ඉදිරියේදී ආණ්ඩුකරණය පහසු නැහැ. ජනතා අපේක්ෂා වැඩියි. ඒවා සපුරාලීමේ අභියෝගය ආණ්ඩුවට තිබෙනවා. තව ම ගමන ආරම්භ කළා පමණයි. තව කෙටි කාලයක් බලා සිටිය යුතුයි ඔවුන්ගේ දේශපාලන ගමන යන දිශාව පිළිබඳ අදහසක් පළ කිරීමට. ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කර ගැනීමත් ආණ්ඩුව හමුවේ තිබෙන අභියෝගයක්. පවතින භූ දේශපාලන න්‍යාය පත්‍රය අනුව ඇමරිකාව ඉන්දියාව, චීනය සමග පවතින දේශපාලනය කළමනාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුව විශේෂ අවධානය යොමු කළ යුතු වනවා. මේ සඳහා අවශ්‍ය වන්නේ උපායමාර්ගික ප්‍රවේශයක්.

සාකච්ඡා කළේ
**චන්දන මාරසිංහ**

# ජයක රහස

කුමාර ලියනගේ



ජාතික ජන බලවේගය නව රජයක් සහ ආණ්ඩුවක් පිහිටුවා තිබෙන්නේ දශක ගණනක් තිස්සේ ජීවිත කැප කරමින්, අතිශය දුෂ්කර මගක් ඔස්සේ පැමිණි දීර්ඝ දේශපාලනික චාරිකාවකින් පසුව. මේ කාලාන්තරයේ එම සමාජ දේශපාලනික බලවේගය විවිධාකාරයෙන් පරිණාමයටත් පරිවර්තනයටත් විපරිවර්තනයටත් ලක් වූ බව පැහැදිලි කරුණක්.

1965දී පමණ ආරම්භ කරන ලද මේ අභියෝගාත්මක ගමන, වසර 50කට පමණ පසු අනභියෝගී අවකාශයකින් සාර්ථක විජයග්‍රහණ රැසක් සමග රාජ්‍ය බලය ද අත්පත් කරගනු ලැබුවේ ලෝක පරිමාණයේ ඓතිහාසික සලකුණු අන්තර්ජාතික වශයෙන් ද සනිටුහන් කරමින්. ඔවුන්ගේ සමාරම්භක සමය නියෝජනය වූයේ බෝල්ෂෙවික් පක්ෂයෙන් වූ අතර 1971 කැරැල්ල නමින් ප්‍රසිද්ධ තරුණ විප්ලවකාරී සන්නද්ධ අරගලය සඳහා සක්‍රීය වශයෙන් දායක වූයේ ද එය. එහෙත් ඒ වනවිට බෝල්ෂෙවික් පක්ෂය වටා තවත් සන්නද්ධ අරගලය විශ්වාස නොකරන එහෙත් වාමාංශික තරුණ කොටස් එක් ව සිටියා. ඔවුන් සියල්ලන්ගේ සහභාගිත්වය සහිත වාමවාදී තරුණ දේශපාලන ව්‍යාපාරය හඳුන්වන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණ නමින්. 1971 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනසමාජයට ජයග්‍රහණ ද ස්වකීය දේශපාලන ව්‍යාපාරයට තීරණාත්මක පරාජය ද හිමි වූවායින් පසු 'මහනඩුව' නමින් ප්‍රසිද්ධ අධිකරණ ක්‍රියාවලියකට ද යටත් ව සිරගගත වන්නට ද ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන නායකත්ව මණ්ඩලයට සිදු වුණා. සන්නද්ධ අරගලයේදී රජයේ ආරක්ෂක අංශ සමග ගැටී එම දේශපාලනික ව්‍යාපාරයේ ග්‍රාමීය බුද්ධිමත් තරුණ ක්‍රියාකාරීන් 15000ක පමණ පිරිසක් ජීවිත කැප කළ බව ප්‍රකට කරුණක්. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණේ '71 තරුණ සන්නද්ධ අරගලය' ශ්‍රී ලාංකික රාජ්‍යතන්ත්‍රයේ, උසස් අධ්‍යාපනයේ, කලා සංස්කෘතික අවකාශයේ මෙන් ම සමාජ ජීවිතයේ ප්‍රමුඛ හැරවුම් ලක්ෂයක් වශයෙන් ද සලකන්නට පුළුවන්. 1972 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය පිහිටුවීම 'තරුණ කොමිසම', 'වම් ඉවුරේ සිනමාව', 'ජනතාවාදී සාහිත්‍යය', 'යථාර්ථවාදී කලාව' 'සමාජ දේශපාලනික වේදිකා නාට්‍ය', 'අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ' ආදී වශයෙන් සමස්ත 70 දශකය ම සමාජ ප්‍රගතිකාරක මානව කේන්ද්‍රීය පරිවර්තනීය යුගයක් බවට මූලික වශයෙන් පත් වූයේ 1971 වර්ෂයේ අප්‍රේල් මාසයේදී දියත් කරන ලද මේ ශ්‍රී ලාංකික ජන සමාජයට පෙර නොවූ විරූ අත්දැකීමක් එකතු කළ සන්නද්ධ අරගලය ඔස්සේ.

එහි සමාජ සංස්කෘතික බලපෑම විවිධ ක්ෂේත්‍රවලට නා නා විධ ආකාරයෙන් සිදු වූ අතර ඇතැම් ඒවා තාර්කික ව තහවුරු කිරීම එතරම් පහසු නැහැ. 71 අරගලකරුවන්ට සමාජය සමග සෘජු සම්බන්ධතා ගොඩනගා ගැනීමේ අභියෝගයක් තිබී ඇති බව වර්තමානයේ වටහාගත ගන්නට පුළුවන්. එසේ නො වුයේනම් වර්තමාන සමාජ ජයග්‍රහණ ඉතා පහසුවෙන් ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාමාර්ග ඔස්සේ වුව ද

1965දී පමණ ආරම්භ කරන ලද මේ අභියෝගාත්මක ගමන, වසර 50කට පමණ පසු අනභියෝගී අවකාශයකින් සාර්ථක විජයග්‍රහණ රැසක් සමග රාජ්‍ය බලය ද අත්පත් කරගනු ලැබුවේ ලෝක පරිමාණයේ ඓතිහාසික සලකුණු අන්තර්ජාතික වශයෙන් ද සනිටුහන් කරමින්. ඔවුන්ගේ සමාරම්භක සමය නියෝජනය වූයේ බෝල්ෂෙවික් පක්ෂයෙන් වූ අතර 1971 කැරැල්ල නමින් ප්‍රසිද්ධ තරුණ විප්ලවකාරී සන්නද්ධ අරගලය සඳහා සක්‍රීය වශයෙන් දායක වූයේ ද එය.

අත්පත් කර ගැනීමේ විභවතාවක් තිබුණු බව පෙනෙනවා.

මේ ආකාරයට අරගලකරුවන්ගේ අවස්ථාව මගහැරී තිබෙන්නේ ඔවුන් පොදු සමාජයට ආමන්ත්‍රණය කිරීමේ භාෂාවේදය කෙරෙහි නිසි අවධානය යොමු නොකිරීම හෙවත් ස්වකීය කාඩරයට (Carder) අමතන දේශපාලනික පාරිභාෂික වදන් මිශ්‍රිත උප භාෂා ප්‍රභේදයකින් සන්නිවේදනය කිරීමට දැරූ උත්සාහය තීරණාත්මක ලෙස බලපාමින්. විශේෂයෙන් පොදුජන සමාජයට විවෘත වූ අවස්ථා සහිත ප්‍රචාරක රැස්වීම්වලදී ඔවුන් විසින් එය අඩුවැඩි වශයෙන් සිදු කිරීම, එකල සාමාන්‍ය ප්‍රවෘත්තියක් වූ තරමට ප්‍රචලිත වූවක්. ව්‍යවහාරික භාෂා ප්‍රභේද සහ සන්නිවේදනය පිළිබඳ විමර්ශනශීලී ව හදාරන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ප්‍රාමාණික විද්වතුන්ට සමකාලීන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ලා සිදු කළ හැකි සමාජ ප්‍රගතිකාරක පර්යේෂණ අධ්‍යයන රැසකට අවශ්‍ය මූලාශ්‍ර ගොන්නක් මේ ඔස්සේ සපයා ගත හැකි බව පෙනෙනවා.

'සමකාලීන භාෂාව, ප්‍රගතිශීලී දේශපාලනය සහ පොදුජන සමාජය' මැයෙන් භාෂා අධ්‍යයන ක්ෂේත්‍රයේ නව විෂය ප්‍රදේශයක් මේ ඔස්සේ ආරම්භ කළ හැකි වන්නේ නම්, සන්නද්ධ තරුණ දේශපාලන ව්‍යාපාරයක් සමාජානුයෝජනය වෙමින්, තත්කාලීන සමාජ ගතික හා බද්ධ ව ක්‍රියා කරනුවස් නව දේශපාලනික උපායමාර්ග ඔස්සේ ප්‍රජාතන්ත්‍රීය අවකාශයක දේශීය සහ විදේශීය ශ්‍රී ලාංකික බුද්ධි කණ්ඩායම්වලට ද ආරාධනා කරමින් ජනතා විමුක්ති පෙරමුණ නමින් පැවතුණු, අර්ධ ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ සහිත මධ්‍යවාමවාදී දේශපාලන ව්‍යාපාරයක් ධනේශ්වරවාදයෙන් පෝෂිත නවලිබරල් දේශපාලනික අවකාශයක මැනවින් සබුද්ධික ව හසුරුවමින්, ශ්‍රී ලාංකික රාජ්‍යයේ විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන බල කේන්ද්‍රත්‍රයේ ව්‍යවස්ථාපිත බලය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ඔස්සේ නිල වශයෙන් තහවුරු කර ගනිමින් සිදුකරන ලද එම ඓතිහාසික ලෝක පරිමාණ මාහැඟි සමාජ පරිවර්තනයට සමකාලීන වශයෙන් දැක්විය හැකි මානව ප්‍රගතිකාරක ගෞරව බහුමානයක් වශයෙන් ද හඳුන්වන්නට පුළුවන්. මේ විද්වත් ක්‍රියාවලිය වඩා වැදගත් වන්නේ 2024 වර්ෂයේදී 'බිනර මාසයේ නිහඬ ව සිදුකරන ලද අප්‍රතිහත සමාජ විප්ලවය වූ නිසා. එය වූ කලී, 1987/89 කාල වකවානුවේදී එවක දුර්දාන්ත රාජ්‍ය පාලකයන්ගේ තිරශ්චීන අරමුණුසහගත බිහිසුණු භීෂණකාරී මර්දන



දහස් ගණනින් පොදුජනතාව සහභාගි වන දැවන්ත වේදිකා සහිත ජාතික මට්ටමේ 'මහා රැළි' සඳහා 'නව තාක්ෂණික යුගයේ' දැවැන්ත ඩිජිටල් පුළුල් තිර ඔස්සේ සමීප රූප ලෙස ජනතාව හමුවට යමින් සහ ඊට ම අනුගතවන ලෙස වඩා අර්ථසම්පන්න ව පොදුජන සමාජයේ භාවිත වන සාමාන්‍ය සංවාදාත්මක කථන භාෂාව යොදා ගැනීමේ උපායමාර්ගය සියලු ප්‍රතිවාදී දේශපාලන වේදිකා අසාර්ථක කරවන්නට තරම් සමත් වුණා. උතුර, දකුණ, නැගෙනහිර, වතුකරය යනාදී ඊනියා දේශපාලන බෙදීම්, ජාතිවාදී ප්‍රවේශ, අන්තවාදී ආගමික බොහෝ රැළි ඒ ආමන්ත්‍රණය ආදරණීය ව පිළිගැනීම විශේෂත්වයක්.

ක්‍රියාවලියකට හසු වී සාහසික වූත්, අමානුෂික වූත්, විවිධ වධබන්ධනවලට ලක් ව අකාලයේ ඝාතනය වූ දේශප්‍රේ තරුණ බුද්ධිමත් ජන කණ්ඩායමකින් දෛවෝපගත ලෙස ශේෂ වූ තවත් එබඳු සක්‍රිය දේශප්‍රේමී තරුණ දේශපාලන නායකයන් සමූහයක් විසි: දියත් කරන ලද්දක්

ජාතික ජන බලවේග නායකත්ව කණ්ඩායම විසින් ඉතා විචක්ෂණශීලී ව වඩා ප්‍රායෝගික ප්‍රවේශයකින් සමාජ දේශපාලනයට එළඹෙමින් ස්වකීය දේශපාලන ව්‍යාපාරයට පිළිගත හැකි වූ, විවිධ බාහිර සමාජ කණ්ඩායම්වලට ද විවෘත වෙමින් පොදුජනතාව සමග සංවාද කිරීම සඳහා ජ.වි.පෙ කාඩර භාෂාව බැහැර කොට තාර්කික සාමාන්‍ය කථන භාෂා ව්‍යවහාරය තෝරා ගැනීම පමණක් වුව 'බිනර මාසයේ ජයග්‍රාහකයන්' බවට පත් වෙමින්, අද්විතීය සහ අසමසම 'මහා ජනතා විජයග්‍රහණයක්' ලබා ගැනීම සඳහා මූලික අඩිතාලම සකස් කර ගැනීමට තරම් අතිශය තීරණාත්මක වූවක්. ඒ, දහස් ගණනින් පොදුජනතාව සහභාගි වන දැවන්ත වේදිකා සහිත ජාතික මට්ටමේ 'මහා රැළි' සඳහා 'නව තාක්ෂණික යුගයේ' දැවැන්ත ඩිජිටල් පුළුල් තිර ඔස්සේ සමීප රූප ලෙස ජනතාව හමුවට යමින් සහ ඊට ම අනුගතවන ලෙස වඩා අර්ථසම්පන්න ව පොදුජන සමාජයේ භාවිත වන සාමාන්‍ය සංවාදාත්මක කථන භාෂාව යොදා ගැනීමේ උපායමාර්ගය සියලු ප්‍රතිවාදී දේශපාලන වේදිකා අසාර්ථක කරවන්නට තරම් සමත් වුණා. උතුර, දකුණ, නැගෙනහිර, වතුකරය යනාදී ඊනියා දේශපාලන බෙදීම්, ජාතිවාදී ප්‍රවේශ, අන්තවාදී ආගමික බොහෝ රැළි ඒ ආමන්ත්‍රණය ආදරණීය ව පිළිගැනීම විශේෂත්වයක්.

ජාතික ජන බලවේගය මෙලෙස සිදු කරන ලද ඩිජිටල් තිර පරීක්ෂණය (digital screen test) යනු, නූතන විශ්වවිද්‍යාලයීය ව්‍යවහාරික භාෂා අධ්‍යයන අංශවල නොමඳ අවධානයට ලක්විය යුතු තරම් වැදගත් පර්යේෂණාත්මක අත්හදා බැලීමක්.



# ට්‍රම්ප් පුනරාගමනය

**මොහාන් සමරනායක**

ඇමරිකා එක්සත් ජනපදයේ 2024 ජනාධිපතිවරණයෙන් (නොවැම්බර් 05 පැවැති) රිපබ්ලිකන් පාක්ෂික ඩොනල්ඩ් ට්‍රම්ප් පැහැදිලි ජයක් අත්කර ගත්තා. ඩොනල්ඩ් ට්‍රම්ප් ඇමරිකාවේ ජනාධිපති ධුරයට පත් වූ පළමු අවස්ථාව මෙය නොවෙයි. මීට පෙර 2016 ජනාධිපතිවරණයේදී ද ජයග්‍රහණය කළ ඔහු 2017දී ධුරය භාරගෙන 2021 වන තුරු වසර 04ක් ඇමරිකාව පාලනය කළා.

ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ මෙවර ජයග්‍රහණයේ විශේෂ ලක්ෂණ කිහිපයක් දක්නට පිළිවන්. ඔහු මෙවර ජනාධිපතිවරණයේදී වාර්තාවක් තැබුවා. ඒ, ඇමරිකා එක්සත් ජනපද ඉතිහාසයේ ජනාධිපතිවරයෙක් අවුරුදු 04ක ධුර කාලයක් සිට විරාමයකට පසු නැවත වරක් ජනාධිපති ධුරයට පත්වූ ප්‍රථම අවස්ථාව අවුරුදු 130කට පසු වීම. මින් පෙර මෙවැනි ජයග්‍රහණයක් අත්කරගත්තේ 1880 ගණන්වල ග්‍රෝවර් ක්ලීව්ලන්ඩ් ජනාධිපතිවරයා. ඊළඟට ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ මෙවර ජයග්‍රහණය ඉතා නිශ්චිත සුපැහැදිලි වූවක්. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා තෝරා ගන්නේ ජනතාවගේ සෘජු ඡන්දයෙන් නොව ජනතාවගේ ඡන්දයෙන් පත්වන ඉලෙක්ටරල් කොලේජ් මැතිවරණ සභාව ලෙස හඳුන්වන ආයතනයේ සභිකයන්ගේ ඡන්දයෙන්. ඉලෙක්ටරල් කොලේජ් සාමාජික සංඛ්‍යාව 538ක්. එයින් අඩකට වැඩි සංඛ්‍යාව 270ක්. මෙවර ඩොනල්ඩ් ට්‍රම්ප් ඉලෙක්ටරල් කොලෙජ් ඡන්ද 312ක් හිමිකරගෙන තිබෙනවා. එය පැහැදිලි බහුතරයක්. ඔහුගේ ප්‍රතිවාදිනී උප ජනාධිපතිනි කමලා හැරිස්ට ලැබුණු ඉලෙක්ටරල් කොලෙජ් ඡන්ද සංඛ්‍යාව 226ක්.

> ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ මෙවර ජයග්‍රහණයේ විශේෂ ලක්ෂණ කිහිපයක් දක්නට පිළිවන්. ඔහු මෙවර ජනාධිපතිවරණයේදී වාර්තාවක් තැබුවා. ඒ, ඇමරිකා එක්සත් ජනපද ඉතිහාසයේ ජනාධිපතිවරයෙක් අවුරුදු 04ක ධුර කාලයක් සිට විරාමයකට පසු නැවත වරක් ජනාධිපති ධුරයට පත්වූ ප්‍රථම අවස්ථාව අවුරුදු 130කට පසු වීම.

ජනප්‍රිය ඡන්ද නැත්නම් ජනතා ඡන්ද ගත්විට ඩොනල්ඩ් ට්‍රම්ප්ට මිලියන 76.8ක ඡන්ද හිමි වුණා. කමලා හැරිස්ගේ ජනතා ඡන්ද මිලියන 74ක්. කමලා හැරිස්ට වඩා ජනතා ඡන්දවලිනුත් විසි ලක්ෂයක් ඉදිරියෙන් ඩොනල්ඩ් ට්‍රම්ප් සිටිනවා. 2016 ඩොනල්ඩ් ට්‍රම්ප් ජය ගත්තේ ඉලෙක්ටරල් කොලේජ් ඡන්ද බහුතරය ලැබීම නිසා. එහෙත් ඔහුට ලැබුණු ජනප්‍රිය ජනතා ඡන්ද සංඛ්‍යාව ඔහුගේ එදා ප්‍රතිවාදිනිය වූ හිලරි ක්ලින්ටන්ට ලැබුණු සංඛ්‍යාවට වඩා තිස් ලක්ෂයකින් අඩුයි. තවත් ලක්ෂණයක් මෙවර ඔහුගේ ජයග්‍රහණයේ තිබෙනවා. මේ දෙවර ම ට්‍රම්ප් තරග කළේ කාන්තා අපේක්ෂිකාවන් සමග. 2016දී තරග කළේ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්ගේ බිරිඳ වන හිලරි ක්ලින්ටන් සමග. මෙවර ඔහුගේ ප්‍රතිවාදිනිය වූයේ උප ජනාධිපති කමලා හැරිස්. ඇමරිකා එක්සත් ජනපද ඉතිහාසයේ ප්‍රථම වරට අධිකරණය හමුවේ නඩුකරයකින් වැරදිකරු බවට තීන්දු කළ තැනැත්තෙක් ඩොනල්ඩ් ට්‍රම්ප්. අධිකරණයෙන් වැරදිකරු කරනු ලැබූවෙක් මින් පෙර ඇමරිකාවේ ජනාධිපති පදවියට පත් වී නැහැ. එය තවත් විශේෂයක්.

ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ජයග්‍රහණයෙන් පසුව සහ ඉන් පෙර සිටත් ඇමරිකාවේත් ලෝකයේත් ශ්‍රී ලංකාවේත් ට්‍රම්ප්ගේ ජය ලෝකයට කෙසේ බලපානු ඇත් ද? ඒ ඒ රටට කෙසේ බලපානු ඇත් ද? යන්න පිළිබඳ පුළුල් කතිකාවක් ඇති වුණා. ලෝකයට ඇති වන බලපෑම සම්බන්ධයෙන් පොදු මතකයක් වන්නේ ඇමරිකාව සෙසු රටවල් සමග යුද්ධ කිරීම ඩොනල්ඩ් ට්‍රම්ප් නතර කරනු ඇතැයි යන්න. එසේ සිතන්නට තිබෙන

එක් හේතුවක් වන්නේ ට්‍රම්ප්ගේ පළමු පාලන සමයේදී ඔහු කිසිදු රටක් සමග යුද්ධයකට නොයාම. වෙනත් ආකාරවලින් ඔහු රටවල් සමග විරසකකම්, එදිරිවාදිකම් පවත්වාගෙන ගියා. දෙවැනි ව මෙවර ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් දිගට ම කියා සිටියා තමා බලයට පැමිණ පැය 24කින් යුක්රේන් යුද්ධය නතර කරන බව. එහෙත් එය නතර කරන්නේ කෙසේදැයි ඔහු සඳහන් කළේ නැහැ. එසේ ම ඔහු කියා සිටියා ගාසා තීරයේ සිදුවන යුද්ධය, ඊශ්‍රායලය කරගෙන යන මිලිටරි මෙහෙයුම නතරකොට සාමය උදා කරන බව. මේ නිසයි බොහෝ දෙනා විශ්වාස කළේ ඔහු බලයට පැමිණි විට ලෝකයේ යුද ගිනි නිවී යනු ඇතැයි කියා. මේ විශ්වාසය කෙතරම්දයත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ ඉංග්‍රීසි පුවත්පතක පළ වූ කාටූනයක සඳහන් වී තිබුණා ඩොනල්ඩ් ට්‍රම්ප් පරවියකුගේ වේශයෙන් තුඩින් විලෝ අත්තක් රැගෙන යුද ගිනි දැල්වෙන යුක්රේනයට සහ ගාසා තීරයට ඉහළින් පියාසර කරන ආකාරය. මේ පිළිබඳ යථාර්ථය තේරුම්ගත හැක්කේ ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුවේ ස්වභාවය, එහි අපේක්ෂා මොනවාද යන්න තේරුම් ගැනීමෙන්. 'ඔහු නිසා ශ්‍රී ලංකාවට වාසිසහගත තත්ත්වයක් උදා වේ' යන විශ්වාසය ශ්‍රී ලංකාවේ ඇතැම් විචාරකයන්ට තිබුණා. ප්‍රධාන පෙළේ ඉංග්‍රීසි පුවත්පතක දේශපාලන කොලමේ පවා ඒ විශ්වාසය සනිටුහන් වුණා. එසේ කල්පනා කළේ ඇමරිකා එක්සත් ජනපදයේ නායකත්වයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වේදිකාවක් කරගෙන ශ්‍රී ලංකාවට එරෙහි ව ඉදිරිපත් කර ඇති යෝජනා මාලාව නතර වෙතැයි යන විශ්වාසය නිසා. එහෙත් මේ පිළිබඳවත් නිගමනය කළ හැක්කේ ඒ පිටුපස තිබෙන භූ දේශපාලනික සාධක විශ්ලේෂණය කිරීමෙන්.

'ට්‍රම්ප්ගේ දෙවැනි ගමන ලෝක සාමයට කෙසේ ආධාර කරනු ඇත් ද?' යන පැනයට පිළිතුරු සෙවීමේදී ඇමරිකා එක්සත් ජනපදය නමැති රාජ්‍යය හඳුනාගැනීම වැදගත්. ඇමරිකාව ලොව ප්‍රමුඛතම රාජ්‍යයක්. එය තවමත් ලෝකයේ අංක 01 ආර්ථිකය. එහි ආර්ථික උත්පාදනයේ වටිනාකම 2023 අවුරුද්දේ ජූනි මාසයේ මැද භාගයේදී ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 23.7ක් පමණ. ඇමරිකාව ආරම්භයේ සිට ම අධිපතිවාදී රටක්. අධිරාජ්‍යයක්. ඇමරිකාව සතු ව ලොව පුරා තිබෙනවා යුද කඳවුරු 800කට වැඩියෙන්. ලෝකයේ රටවල් ගණනාවක එක්සත් ජනපද හමුදා කණ්ඩායම් නතර කොට තිබෙනවා. එම ගෝලීය ආධිපත්‍යයේ අරමුණ ඇමරිකාව සතු දේශපාලන, ආර්ථික සහ මිලිටරි ආධිපත්‍යය ආරක්ෂා කරගැනීම. එය නම් යථාර්ථය ඩොනල්ඩ් ට්‍රම්ප් ලෝකයට විශේෂයෙන් සාමය උදාකරනු ඇතැයි සිතීමට අපහසුයි.



මෙවර ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් දිගට ම කියා සිටියා තමා බලයට පැමිණ පැය 24කින් යුක්රේන් යුද්ධය නතර කරන බව. එහෙත් එය නතර කරන්නේ කෙසේදැයි ඔහු සඳහන් කළේ නැහැ. එසේ ම ඔහු කියා සිටියා ගාසා තීරයේ සිදුවන යුද්ධය, ඊශ්‍රායලය කරගෙන යන මිලිටරි මෙහෙයුම නතරකොට සාමය උදා කරන බව. මේ නිසයි බොහෝ දෙනා විශ්වාස කළේ ඔහු බලයට පැමිණි විට ලෝකයේ යුද ගිනි නිවී යනු ඇතැයි කියා.

ඊට තිබෙන සාක්ෂි ප්‍රමාණවත් නැහැ. ඔහු තමාගේ පළමු ධුර කාලයේදී යුද්ධ ආරම්භ නොකළේ ඔහු විශ්වාස කළා මෙසේ සෙසු රටවල් සමග කරන යුද්ධ නිසා ඇමරිකාවේ ආර්ථික ශක්තිය පිරිහෙන බව. 2016දී මෙන් ම 2024 ඡන්ද ව්‍යාපාරයේදීත් ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ප්‍රධාන තේමා පාඨ දෙකක් තිබුණා. ඉන් එක් තේමාවක් වන්නේ 'ඇමරිකාව නැවත ශ්‍රේෂ්ඨත්වයට පත් කරමු' (Make America great again) යන්න. දෙවැන්න ඇමරිකාවට පළමු තැන (America first) යන්න. ලෝකයේ කවර හෝ රටක් තමන්ගේ රාජ්‍යය ශ්‍රේෂ්ඨත්වයට පත් කිරීමටත් තමන්ගේ රාජ්‍යය මුල්තැන්හි ලා සලකා ක්‍රියා කිරීමටත් පෙළඹෙනවා නම් එවැනි රාජ්‍යයකින් ලෝකයට බොහෝ දෙනා අපේක්ෂා කරන යහපත උදාවේ යැයි සිත්නනට බැහැ. ඔහු චීනය සමග වෙළෙඳ යුද්ධයක් ආරම්භ කළා. චීනයෙන් ආනයනය කරන භාණ්ඩ සඳහා 60%ක පමණ තීරු බදු පැනවීමට පියවර ගත්තා. එය කවර හෝ රටක් සමග මිත්‍රශීලී පියවරක් නොවෙයි. ඔහුගේ පාලන සමයේදී ඔහු ඉරානය සමග ඇමරිකාව අත්සන් කර තිබූ න්‍යෂ්ටික වැඩසටහන් පාලන ගිවිසුමෙන් ඉවත් වුණා. ඒ ගිවිසුම හැඳින්වුණේ 'පරිපූර්ණ ඒකාබද්ධතා සැලැස්ම' (Joint Comprehensive Plan of Action) නමින්. මේ ගිවිසුම අත්සන් කළේ බැරක් ඔබාමාගේ පාලන සමයේදී. එයින් අපේක්ෂා කළේ ඉරානය න්‍යෂ්ටික අවියක් නිපදවීමට ආරම්භ කර ඇති වැඩසටහන පාලනය කොට න්‍යෂ්ටික අවියක් නිෂ්පාදනය නතර කිරීම. එහෙත් මේ ගිවිසුමෙන් ඉවත්වුණු ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා ඉරානයට එරෙහි ව දැඩි ව සම්බාධක ප්‍රකාශයට පත් කළා. එවැනි ක්‍රියාමාර්ගයක් ගන්නේ ඔහු තමාගේ රාජ්‍යයේ ආර්ථික ශක්තිය ආරක්ෂා කරගැනීම සඳහා. ඩොනල්ඩ් ට්‍රම්ප් යුක්රේනයේ සතුරෙක් නොවෙයි. ඔහු කලින් පාලන සමයේදී යුක්රේනයට උදව් කළා. මෙවර ඔහුට තිබෙන ප්‍රශ්නය යුක්රේන් යුද්ධය සඳහා ඇමරිකා එක්සත් ජනපදය ඩොලර් බිලියන සිය ගණනින් වැය කිරීම, යුද ආධාර සැපයීම තමන්ගේ රටේ ආර්ථික සාරය පිටට ගලා යන හේතුවක් වී තිබෙන නිසා. ඔහුගේ ප්‍රධාන ඉලක්කය වී තිබෙන්නේ වියදම්කාරී, නාස්තිකාරී සම්පත් විනාශ කරන බාහිර මැදිහත්වීම්වලින් වැළකී තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

**කාංචනා සිරිවර්ධන**

# දහනයෙන් දහනය වීම

**නිහාල් පීරිස්**

එක්සත්ජාතීන්ගේදේශගුණිකවිපර්යාස පිළිබඳ සමුළුව (Conference of the Parties) මේ වසරේ නොවැම්බර් මාසයේ පැවැත්වුණේ 29 වැනි (COP 29) වතාවට. මේ සමුළුවලදී බොහෝ විට විවිධ මත ගැටුම්, විරෝධය පෑම් ආදිය ඇති වන ආකාරය දක්නට පුළුවන්. මෙවර ද එහි එවැනි ගැටුම්වලින් සහ ආන්දෝලනවලින් අඩුවක් තිබුණේ නැහැ. ඇති වූ මත ගැටුම් නිසා එය නියමිත වේලාවට අවසන් කර ගැනීමට පවා නොහැකි වුණා.

අසර්බයිජානයේ අගනුවර සහ එරට විශාලතම නගරය වන බාකුහි මේ සමුළුව ආරම්භ වූයේ නොවැම්බර් මස 11 දින. එහි සභාපතිත්වය දරන ලද්දේ අසර්බයිජානයේ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ඇමැතිවරයා වන මුක්තාර් බබායෙව් විසින්. නොවැම්බර් 22 දින සමුළුව අවසන් වීමට නියමිත ව තිබුණත් සමුළුවේ ඇති වූ දරුණු මත ගැටුම්, නොඑකඟතා ආදිය නිසා එය නියමිත දිනයේ නියමිත වේලාවට අවසන් කර ගැනීමට නොහැකි වුණා. අවසානයේ සමුළුව නිමාව දුටුවේ නියමිත වේලාවට වඩා පැය 30ක් පමණ ඉක්ම ගිය පසුව. සමුළුව අතරමග නතර වනු ඇතැයි යන බියක් පවා එක් අවස්ථාවක ඇති වී තිබුණා.

ලෝකයට ම දරුණු තර්ජනයක් එල්ල කර ඇති දේශගුණික අර්බුදවලට වඩාත් ම දයක වන පාර්ශ්වයක් වන්නේ ධනවත් රටවල්. ඔවුන් ඉතා විශාල වශයෙන්

> සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ දිළිඳු රටවල් දේශගුණික විපර්යාස නිසා මුහුණ දී සිටින ගැටලු විසඳා ගැනීම සඳහා ධනවත් රටවල් වාර්ෂික ව එම රටවලට යම් මුදලක් ලබා දෙනවා. ෆොසිල ඉන්ධන භාවිතයේ සිට පුනර්ජනනීය බලශක්තිය වෙත මාරුවීමේ ව්‍යාපෘති සඳහා ද මේ මුදල් යොදා ගැනෙනවා. මෙවැනි මුදලක් ලබා දීම සම්බන්ධයෙන් මුලින් ම එකඟතාවක් ඇති වූයේ ද මෙයට පෙර පැවැති දේශගුණික විපර්යාස පිළිබඳ සමුළුවකදී ම.

ෆොසිල ඉන්ධන (ඛණිජ තෙල්, ගෑස්, ගල් අඟුරු ආදිය) භාවිත කරනවා. ඒ ඔස්සේ කාබන් ඩයොක්සයිඩ් වැනි වායු විශාල වශයෙන් පරිසරයට මුදා හැරෙනවා. එය දේශගුණික අර්බුදවලට බලපාන ප්‍රධානම හේතුවක්.

දේශගුණික අර්බුද නිසා වඩාත් ම බැට කන්නේ ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ දිළිඳු රටවල්. ධනවත් රටවල් හා සසඳන කල ඔවුන් දේශගුණික අර්බුදවලට දයක වන්නේ ඉතා ම අඩුවෙන්. මේ නිසා ඔවුන් ගොදුරු වී සිටින්නේ විශාල අසාධාරණයකට.

මේ වනවිට ලෝකයේ ස්වාභාවික විපත් ආදිය ඉතා දරුණු මට්ටමකට ළඟා වී ඇති අතර එවැනි තත්ත්වයක් ඇති වීමට ප්‍රධාන හේතුවක් ලෙස සැලකෙන්නේ ද ගෝලීය උණුසුම ඉහළ යාම සහ දේශගුණික විපර්යාස. සුළි කුණාටු, අධික වර්ෂාපතනය, ජල ගැලීම්, නාය යාම්, නියග වැනි ආපදාවලින් බොහෝ රටවල ජනයා දැඩි පීඩාවට ලක් වෙමින් සිටිනවා. එම රටවල ආර්ථිකයට මෙවැනි ආපදා නිසා සිදුවන බලපෑම ද සුළුපටු නැහැ. ගෝලීය උණුසුම වැඩි වීම හේතුවෙන් සාගර ජල මට්ටම ඉහළ යාම එල්ල කර තිබෙන්නේ දූපත් රටවල් රැසකට දරුණු තර්ජන. මේ රටවල වෙරළාසන්න ප්‍රදේශ මුහුදට බිලිවීම එවැනි තර්ජනයක්.

සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ දිළිඳු රටවල් දේශගුණික විපර්යාස නිසා මුහුණ දී සිටින ගැටලු විසඳා ගැනීම සඳහා ධනවත් රටවල් වාර්ෂික ව එම රටවලට යම් මුදලක් ලබා දෙනවා. ෆොසිල ඉන්ධන



භාවිතයේ සිට පුනර්ජනනීය බලශක්තිය වෙත මාරුවීමේ ව්‍යාපෘති සඳහා ද මේ මුදල් යොදා ගැනෙනවා. මෙවැනි මුදලක් ලබා දීම සම්බන්ධයෙන් මුලින් ම එකඟතාවක් ඇති වූයේ ද මෙයට පෙර පැවැති දේශගුණික විපර්යාස පිළිබඳ සමුළුවකදී ම. මෙවර සමුළුවේදී ඇති වූ මත ගැටුම්වලට සහ ආන්දෝලනවලට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ මේ මුදල පිළිබඳ ගැටලු.

සංවර්ධනය වෙමින් සිටින රටවලට සහ වඩාත් ම අනතුරට ලක් ව සිටින රටවලට ධනවත් රටවල් ලබා දෙන්නේ වසරකට ඇමරිකානු ඩොලර් බිලියන 100ක පමණ මුදලක්. එහෙත් දෙවැනි ව කියූ රටවල් දන් කාලයක සිට ම පවසමින් සිටින්නේ දේශගුණික විපර්යාස නිසා තමන් මුහුණ දී සිටින ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මේ මුදල් කිසිසේත් ප්‍රමාණවත් නැති බව. ඒ නිසා ඔවුන් මේ මුදල වැඩි කර ගැනීමට දැඩි උත්සාහයක නිරත ව සිටිනවා. සංවර්ධනය වෙමින් සිටින රටවල එකමුතුවක් වන ජී 77 කණ්ඩායමේ අපේක්ෂාව වී තිබුණේ මෙය ඇමරිකානු ඩොලර් බිලියන 500 දක්වා ඉහළ දමා ගැනීමට. එහෙත් ධනවත් රටවල් එකඟ වූයේ ඇමරිකානු ඩොලර් බිලියන 300ක් සඳහා පමණයි. සංවර්ධනය වෙමින් සිටින ඇතැම් රටවල් එයට කිසිසේත් කැමැත්තක් දක්වූයේ නැහැ. ඒ නිසා යම් පිරිසක් සමුළුවෙන් නැගිට ගොස් තිබූ බව ද වාර්තා වුණා. ධනවල් රටවල් එකඟ වූ මේ මුදල ගැන විවේචනය කරමින් ඉන්දියානු නියෝජිතවරිය වූ චාන්ද්නි රයිනා ඉතා දැඩි කතාවක් පවත්වා තිබුණා. ඇය පවසා තිබුණේ මෙය හුදෙක් 'දෘෂ්ටි මායාවක්' පමණක් බව. "අප සියලුදෙනා මුහුණ දී සිටින දැවැන්ත අභියෝගවලට විසඳුම් ලබා දීමට මෙයට කිසිසේත් හැකියාවක් නැහැ" යැයි ඇය සඳහන් කර තිබුණා.







"අපේ රටවලට අපි යන්නේ අපට ඉතා ඉක්මනින් අවශ්‍ය ව ඇති මුදල් ප්‍රමාණයෙන් ඉතා කුඩා කොටසක් පමණක් අරගෙනයි" එසේ චෝදනා කර තිබුණේ දේශගුණික විපර්යාස නිසා විශාල තර්ජනයකට මුහුණ දී සිටින මාෂල් දූපත්වල නියෝජිතවරිය වූ ටීනා ස්ටීජ්. ඇතැම් විශේෂඥයන්ගේ තක්සේරුවට අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දී සිටින ගැටලු විසඳා ගැනීමට නම් ඔවුන්ට වාර්ෂික ව ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.3ක පමණ මුදලක් ලබා දිය යුතුයි. එහෙත් ධනවත් රටවල් කැමැත්ත පළ කර තිබෙන්නේ ඊට වඩා බෙහෙවින් අඩු මුදලකට.

ධනවත් රටවල නියෝජිතයන් පවසා තිබුණේ මේ වනවිට තම රටවල් ද විවිධ ආර්ථික ගැටලුවලට මුහුණ දී සිටින නිසා ඩොලර් බිලියන 300ට වැඩි මුදලක් ලබා දිය නොහැකි බව. වසර 2035 වනවිට මේ මුදල ලබා දීමට ඔවුන් කැමැත්ත පළ කළ අතර අවසානයේ සංවර්ධනය වෙමින් පවතින රටවලට සිදු වුණේ එයට එකඟ වීමට. ප්‍රදාන සහ ණය වශයෙන් ලැබෙන මෙහි වැඩි මුදලක් ප්‍රදාන ලෙස ලබා ගැනීමටයි දේශගුණික විපර්යාස නිසා විශාල තර්ජනයකට මුහුණ දී සිටින රටවල් උත්සාහ කරමින් සිටින්නේ. මේ වන විටත් එම රටවල් පීඩා විඳිමින් සිටින්නේ දරුණු ණය අර්බුදවලින්.

දේශගුණික විපර්යාස පිළිබඳ ගැටලුවලට කල් පවතින විසඳුම් ලැබෙන්නේ ෆොසිල ඉන්ධන භාවිතය නතර කිරීමෙන්. ෆොසිල ඉන්ධන භාවිතය අඩු කරමින්, පුනර්ජනනීය බලශක්තිය වෙත හැකි ඉක්මනින් මාරු විය යුතු ව තිබුණත් එවැනි ක්‍රියාමාර්ගවලට ෆොසිල ඉන්ධන නිපදවන රටවලින් බලපෑම් එල්ල වෙමින් ඇති බවට ද චෝදනා නැගෙනවා. එක්සත් ජාතීන්ගේ දේශගුණික සමුළුව වැනි අවස්ථා පවා මේ පාර්ශ්වවල බලපෑම්වලින් නිදහස් නැති බවයි ඇතැම් ක්‍රියාකාරිකයන් පෙන්වා දෙන්නේ. මෙවර සමුළුවට ෆොසිල ඉන්ධන කර්මාන්තය නියෝජනය කරන්නන් 1,700කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වී සිටි බව සඳහන්.



# සැඟවුණු රහස්

**සුගත්ප්‍රිය කුලතුංගආරච්චි**

තනි ජීවී විශේෂයකින් තැනුණු ලොව විශාලතම කොරල් ජනපදය සොයා ගැනීමට විද්‍යාඥයන් පිරිසක් සමත් වී තිබෙනවා. ඒ, නිරිතදිග පැසිෆික් සාගරයේ දූපත් සමූහයක් වන සොලමන් දූපත්වල සිදු කළ ගවේෂණයකදී.

මතුපිටින් බැලූ විට මේ කොරල් ජනපදය පෙනෙන්නේ නිල් මුහුදු පත්ලේ ඇති කළු පැහැති යෝධ ගල් පර්වතයක් ලෙස හෝ බොහෝ කලකට පෙර ගිලී අමතක වී ගිය නැවක සුන්බුන් හෝ හැටියට. එහෙත් මුහුද යට ඡායාරූප ගන්නා සිනමාකැමරා ශිල්පී මනු සැන් ෆීලික්ස්ට මුහුදේ කිමිද, එයට සමීප ව විපරම් කර බැලීමේදී දැවැන්ත, එක දිගට විහිදුණු, මෙතෙක් නොදුටු තනි කොරල් ජනාවාසයක් සොයා ගැනීමට හැකි වීම ගැන ඔහු පවා පුදුමයට පත් වුණා. ඉන්පසු සිදු කළ ගවේෂණයෙන් පසු උදා වූයේ ලොව විශාලතම තනි කොරල් ජනපදය තමන් විසින් සොයා ගනු ලැබූ බව ජාතික භූගෝලීය සංගමයේ 'ප්‍රිස්ටීන් සීස්' නමැති පර්යේෂක කණ්ඩායම ලෝකයට පවසන ඉතිහාසගත වන මොහොත.

විද්‍යාත්මක ගණනය කිරීම්වලදී හෙළිවූයේ අඩි 112 සිට 105 දක්වා පැතිර ගිය මේ මෙගා කොරල් ජනපදය පෘථිවියේ විශාලතම සත්ත්වයා වන නිල් තල්මසුන්ටත් වඩා දිග බව. එය කොතරම් විශාල ද යත්, අභ්‍යවකාශයේ සිට පවා දැකිය හැකි වුණා.

එහෙත් එය මෙතරම් දිගු කලක් නිතර මුහුදු යන දූපත්වාසීන්ගේ පවා ඇස්පනාපිට ම නොපෙනී සැඟවී තිබුණා. එයට හේතුව වුණේ ආසන්න දූපතේ වෙරළ යටට වන්නට මෙය සැඟවී මෙන් තිබීම. විද්‍යාඥයන් මේ පිහිටීම හැඳින්වූයේ ගැඹුරු සිසිල් ජල සාක්කුවක කොරල් පිහිටා තිබූවාක් බඳු හැටියට.

සොලමන් දූපත් යනු නිරිතදිග පැසිෆික් සාගරයේ ප්‍රධාන දූපත් 06කින් සහ කුඩා දූපත් 900කට අධික සංඛ්‍යාවකින් සැදුම් ලත් රාජ්‍යයක්. සොලමන් දූපත් පිහිටා ඇත්තේ ලොව කොරල්පර ත්‍රිකෝණය නමින් හැඳින්වෙන සුවිශේෂ කලාපයක. මේ කලාපය එලෙස වෙන් කර ඇත්තේ එහි කොරල්පරවල ඇති විශ්මයජනක විවිධත්වය නිසා.

අලුතින් සොයාගත් 'මෙගා කොරල්පර' පිහිටා ඇත්තේ එම දූපත් සමූහයේ ම නැගෙනහිර දෙසින් දළ වශයෙන් නාවික සැතපුම් 300ක් පමණ දුරින් පිහිටි ඩෆ් දූපත් පෙළට අයත් වූ වෙරළක. ගවේෂණයේ ප්‍රධාන විද්‍යාඥ මොලී ටිමර්ස් පවසන පරිදි මේ සොයාගැනීම 'ඇත්තට ම අහඹු ලෙස සිදුවූවක්'. එය හමු වී ඇත්තේ ඔවුන් වෙනත් මුහුදු කලාපයක ගවේෂණයට යාමට පෙර දින රාත්‍රියේ. ඈතට දිය යට සුන්බුන් නැවක කොටස මෙන් දුටු එහි සැබෑ විශිෂ්ටත්වය ඔවුන් දුටුවේ කණ්ඩායමේ දිය යට ඡායාරූප





ශිල්පී මනු සැන් ෆීලික්ස් සිය කැමරා ආම්පන්නත් රැගෙන කිමිද බැලූ විට. එය යුගයේ විශිෂ්ටතම සොයා ගැනීමක් වුණා.

විද්‍යාඥ මොලී ටිමර්ස්ට අනුව නම් 'මේ මෙගා කොරල් සොයා ගැනීම පෘථිවිය මත උස ම ගස සොයා ගැනීම හා සමානයි".

ගවේෂණ කණ්ඩායම පවසන්නේ මෙය මෙතෙක් වාර්තා වී ඇති විශාලතම තනි කොරල් ජනපදය හැටියට. ඔවුන්ට අනුව එය සෑදී ඇත්තේ ජානමය වශයෙන් සමාන කොරල් පොලිප්ස් බිලියනයකට ආසන්න ප්‍රමාණයකින්. ඒවා ක්‍රියා කරන්නේ එක් තනි ජීවියකු මෙන් ජනපදය ම එක් ව.

මේ ජනාවාසය තැනූ ජීවියා හඳුන්වන්නේ Pavona clavus නමැති විද්‍යාත්මක නාමයෙන්. එම ජීවින් දක්නට හැකි වන්නේ පොදුවේ 'උරහිස් අස්ථිය හැඩැති කොරල්' ලෙස දැක්වෙන දෘඩ කොරල් වර්ගයක් වශයෙන්. ඒ, මේ කුඩා Pavona clavus ජීවීන් හෙවත් පොලිප්ස් එකතු වී තනා ඇති 'උරහිස් ආකාරයේ' තීරු-වැටි ආකාර පැතැලි කොරල් නෙරුම් නිසා. මේ කොරල් තට්ටු බොහෝ විට දුඹුරුපැහැ වුවත් ඇතැම් ඒවා කහ, රතු, රෝස සහ නිල් පැල්ලම් ද සහිත ව මුහුද යට මවන්නේ අලංකාර දසුනක්.

තනි හුණුගල් නිර්මාණ මෙන් පෙනුණත් කොරල් යනු තාරකා මාලු, ජෙලිෆිෂ් සහ මුහුදු ඇනිමෝන්වලට නෑකම් කියන ඉතා ක්ෂුද්‍ර සතුන් විශේෂයක්. කොරල් Cnidaria කුලයේ Anthozoa උප කාණ්ඩයට අයත් ගණාවාස සාදන සාගර අපෘෂ්ඨවංශීන්. කොරල් පොලිප්ස් නමින් හැඳින්වෙන මේ කුඩා තනි ජීවීන් මල්ලක් වැනි සතකු වන අතර සාමාන්‍යයෙන් විෂ්කම්භය මිලිමීටර කිහිපයක් සහ උස සෙන්ටිමීටර කිහිපයක්. මේවා දහස් ගණනින් එකතු වී මෙබඳු ජනාවාස බිහි කරන අතර එවැනි විවිධ ජනපද රාශියක් එක් වීමෙන් බිහිවන්නේ සුප්‍රකට මහා බාධක කොරල් පරය බඳු සුවිශාල මුහුදු තාප්ප.

පරිසර විද්‍යාත්මක ව සහ ජෛව විද්‍යාත්මක ව කොරල් ඉතා වැදගත් ජීවියෙක්. කොරල්වලින් ඉටු වන්නේ මුහුදු ශාක ප්ලවාංග හා සත්ත්ව ප්ලවාංග වර්ධනයට, පරිසර පද්ධති වර්ධනයට, මුහුදු ඛාදනය අවම කිරීමට, පාරිසරික උෂ්ණත්වය පාලනයට, ඔක්සිජන් ජනනය කිරීමට, වර්ෂණ ක්‍රියාවලිය හා දියවැල්වල ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමට දායක වීම වැනි වැදගත් සේවා රාශියක්.

ටිමර්ස් පෙන්වා දෙන්නේ මේ විශේෂ Pavona clavus ජීවින් සාමාන්‍යයෙන් තනන කොරල් ගණාවාස අයිස්ක්‍රීම් පිරුණු හැන්දක් මෙන් ගෝලාකාර මුදුනක් සහිත ව පවතින බවත් අයිස්ක්‍රීම් දියවී ගියාක් මෙන් මෙය යම් ආකාරයකට සමතලා වී දිගට පැතිර ගොස් ඇති බවත් ඒවා දිගට ම එසේ පවතින විශේෂත්වයක් වනු ඇති බවත්.

අලුතින් සොයාගත් මේ කොරල් ගණාවාසය පිහිටා තිබුණේ සාගර මතුපිටට අඩි 42ක් යටින්. පර්යේෂකයන් සාමාන්‍යයෙන් කොරල්පරයක වයස තක්සේරු කිරීමට යොදා ගන්නේ එහි උස. එසේනම් අඩි 16ක් උස මේ ජනපදයේ වයස වසර 300ක් පමණ වනු ඇති. එහෙත් පර්යේෂකයන්ට අනුව එය සියවස් 03ක් හෝ ඊටත් වඩා පැරණි වන්නට පුළුවන්. ඒ අනුව මේ කොරල් ජනපදය ඉතා පැරණි, ඓතිහාසික සිදුවීම් රැසක් මැද ජීවත් වී තිබෙනවා. 19 වැනි ශතවර්ෂයේදී සොලමන් දූපත් වෙත මුල් ම ක්‍රිස්තියානි මිෂනාරිවරුන් පැමිණෙන විට, නිදහස් ප්‍රකාශය අත්සන් කරන විට, දෙවැනි ලෝක යුද්ධය අතරතුර සහ මෑතක කොවිඩ් 19 වසංගතය පැමිණෙන විට එය ජීවමාන ව සිට ඇති අතර එයට ඇත්තේ පරිපූර්ණ ඉතිහාස කතාවක්. "ඒක හරියට අපේ මුතුන් මිත්තන් තවමත් වතුරේ සැඟ වී ඉන්නවා වගේ." යැයි විද්‍යාඥ මොලී ටිමර්ස් පවසනවා.

එහි වසර 300ක ජීවිත කාලයේ මේ දැවැන්ත මුහුදු ජීවියා අත්දැක ඇත්තේ ගෝලීය



උණුසුම, අධික ලෙස මසුන් ඇල්ලීම, සමුද්‍ර දූෂණය, නාගරික හා කෘෂිකාර්මික සංවර්ධනයේ අනිටු ඵලවිපාක, කොරල් දිරාපත්වීම, කොරල් කොල්ලය සහ සාගර ආම්ලිකකරණය වැනි සාගරය ආශ්‍රිත කැපී පෙනෙන වෙනස්කම්. පර්යේෂකයන්ට අනුව අලුතින් සොයා ගත් මේ කොරල් ගහනය පැවැතුණේ ඉතා හොඳ සෞඛ්‍ය තත්ත්වයකින්. එසේ වුවත් මේ වන විට ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වැනි ස්වාභාවික බලපෑම් මෙන් ම අධික ලෙස මසුන් ඇල්ලීම, කොරල් කැඩීම ඇතුළු ව සාගරය ආශ්‍රිත මානව ක්‍රියා හේතුවෙන් ලොව සියලු ම කොරල්පරවලට එල්ල වී ඇති තර්ජන රැසක් ගැන පර්යේෂකයන් සිටින්නේ කනස්සල්ලට පත් ව.

කොරල්පර ඔවුන්ගේ ඇටසැකිල්ල නිර්මාණය කිරීම සඳහා භාවිත කරන්නේ සාගර ජලයේ ඇති කැල්සියම් කාබනේට්. එම නිසා ජලය වඩාත් ආම්ලික වන අතර දේශගුණික අර්බුදය හේතුවෙන් ද සාගරය තවත් උණුසුම් හා ආම්ලික වනවා. එය ජලයේ pH සමතුලිතතාව දරුණු ලෙස වෙනස් කරන කොරල්පර ආතතියට පත් වන්නට පුළුවන්. එහි පැහැය වෙනස් වන අතර ව්‍යුහය දුර්වල වනවා. එහි ප්‍රතිඵලය වන්නේ ලොව මෙගා කොරල් ඇතුළු කොරල්පර විනාශය.

විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ "ඔබට ප්‍රමාණවත් තරම් කැල්සියම් නොමැතිනම්, ඔබ ඔස්ටියෝපොරෝසිස් රෝගයට ගොදුරු වේ. එවිට ඔබේ අස්ථි දිරාපත් වීමට පටන් ගනී, ඒවා බිඳෙනසුලු විය හැකි ය, නිවැරදි තත්ත්ව නොමැතිනම් කොරල්පර සඳහා ද එය ම සත්‍ය විය හැකි ය." යනුවෙන්.

දේශගුණික අර්බුදය නිසා ලොව කොරල්පර විරංජනයෙන් පීඩාවට පත් වීමත් සමග 2023 සහ 2024 අතර කොරල්පර ප්‍රදේශවලින් 77%ක් ම සුදුමැලි වීමට තරම් ඉහළ උෂ්ණත්වයකට ලක් වී තිබුණා. ගෝලීය උණුසුම 1.5°Cට වඩා වැඩි වීම කොරල්පර සඳහා ව්‍යසනකාරී තත්ත්වයක්. දැනට නීති රෙගුලාසිවලින් ආරක්ෂා වී ඇත්තේ ලෝකයේ සමස්ත සාගරයෙන් 8.33%ක් වන අතර තවමත් හොඳ සෞඛ්‍යසම්පන්න ව සිටින මෙතරම් විශාල තනි ජනපදයක් සොයා ගැනීමට හැකිවීම ඇති කර තිබෙන්නේ කොරල්පරවලට නොනැසී පැවතීමට නව බලාපොරොත්තුවක්.

මේ සොයා ගැනීමෙන් අඩු තරමේ සොලමන් දූපත් ආශ්‍රිත සුවිශේෂ සාගර වාසස්ථානය සඳහාවත් දැඩි ආරක්ෂාවක් ලබා දෙන්නට උනන්දුවක් මතුකරනු ඇතැයි යන්නයි විද්‍යාඥයන්ගේ අපේක්ෂාව.





# අඩ සියවසක සලරූ රවීන්ද්‍රය

තුසිත ජයසුන්දර

'රිදී තිරයේ හැඩකාර පෙම්වතා' ලෙස ප්‍රේක්ෂක හදවත් සොරා ගත් රවීන්ද්‍ර රන්දෙනිය නම් අසහාය රංගධරයා 2024 වසරේ සිය සිනමා ජීවිතයේ වසර 50ක කඩයිම සනිටුහන් කළා. සිනමා කලාවේ මෙන් ම සිනමා කර්මාන්තයේ ද උන්නතිය වෙනුවෙන් ඔහු කළ අමිල මෙහෙවර හා කැපවීම සිනමාලෝලීන් කෘතවේදී ව සිහිපත් කරනවා නොඅනුමානයි. රවීන්ද්‍ර රන්දෙනිය රංගවේදියාණන්'ගේ' සිනමා සම්ප්‍රදානය පිළිබඳ මෙවර දෙසතිය කවරයේ කතාව ලියැවෙන්නේ ඔහුට පිදෙන උපහාරයක් ලෙස.


කැලණිය, දළුගම විසූ ප්‍රකට ව්‍යාපාරික එල්. පී. පෙරේරා සිය දෙවැනි දරුවා වන බොනිෆස් කුමරු කොටහේන ශාන්ත බෙනඩික්ට් විදුහලේ තෙවැනි පන්තියට ඇතුළත් කරන්නේ වසර 1953දී. මේ වන විට බොනිෆස්ගේ වයස අවුරුදු 08ක්. ඊට පෙර ඔහු සිප්සතර හැදෑරුවේ ශාන්ත ෆ්‍රැන්සිස් විදුහලෙන්.

රජයට පවරා නොගත් කතෝලික පාසලක් වූ ශාන්ත බෙනඩික්ට් විදුහල මුල් තැනක් ලබා දුන්නේ අධ්‍යාපනයට පමණක් ම නොවෙයි. සිසු විනය සුරැකීම හා වඩවාලීම විදුහල් බලධාරීන්ගේ බරපතළ වගකීමක් වුණා. එහෙත් කලා, ක්‍රීඩා ආදී විෂය බාහිර කාර්ය සඳහා විදුහල ලබා දුන් ඉඩහසර සැලකිය යුතු තරම්.

බොනිෆස් වෝල්ටර් පෙරේරා නොහොත් බොනී ශාන්ත බෙනඩික්ට්හි උගත්තේ පසුකාලීන ව සිරිලක සිනමාවේ කැපී පෙනුණු කිහිපදෙනකු සමග. මෙතැන ඔහුට වඩා වයසින් වැඩිමහලු සිසුන් ද සිටියා. ඉන් රෝයි හඳපාන්ගොඩ 'සුජාගෙ රහස', 'ඔබ දුටු දා', 'සරු බිම', හා 'වනසරා' ඇතුළු සිනමාපට කිහිපයකට රූපණයෙන් එක්වූයේ රසික ආදරය නොමඳ ව හිමි කර ගනිමින්. රොබින් ප්‍රනාන්දු විදුහලේ ජිම්නාස්ටික් සූරයා. සිය සිනමා දිවිය අරුත් ගන්වන්නට රොබින් මේ සමත්කම මහෝපකාරී කර ගත්තේ කිසිදු බාධාවකින් තොර ව. රොබින් නිරනුමාන ව ම සිරිලක සිනමා රූපණය විෂයෙහි එන විකල්ප තාරකාවක්. ඔහුගේ සිනමා දිවි සැරිය දශක පහකට අධික කාලයක් තිස්සේ ඇදී යන්නේ සිනමාපට සියයකට පමණ දායකවෙමින්. වරෙක ඔහු සිනමාකරුවකු ද වනවා. 'ස්වීප්



බඹර පැටික්කි (1984)



කලු දිය දහර (1975)

ටිකට්', 'සිතක මහිම', 'ගොළු හදවත', 'වාසනා' ඇතුළු සිනමාපට කිහිපයකට ම රූපණයෙන් එක්වූ සුදේශ් ගුණරත්න ද බොනීගේ පන්ති මිතුරෙක්. තවත් පන්ති මිතුරකු වූ රොනල්ඩ් ප්‍රනාන්දු සිරිලක සිනමාව පොහොසත් කළේ නර්තනාංග නිර්මාණයෙන්. මේ අතරට පැමිණි විජය කුමාරතුංග 'තවමත් සිරිලක ජනකාන්ත ම රූපණවේදියා ය' යන්න වෙසෙසින් කිවයුතු නැහැ. එසේ ම ඔහු සිනමා නිපැයුමෙන් හා ගායනයෙන් ද සිරිලක සිනමාව හා එක්වනවා.

පාසලේදී බොනී හැදෑරුවේ විද්‍යා විෂයන්. අනතුරු ව ඇක්වයිනාස් ආයතනයෙන් ඔහු උසස් අධ්‍යාපනයට එක්වනවා. මේ ඔහුගේ ජවසම්පන්න තුරුණු වියේ පළමු සමය. සිනමාශාලා මෙවක තරුණයන්ගේ පළමු හා විටෙක එක ම ආස්වාදජනක නවාතැන බවටයි පත් ව තිබුණේ. බොනී ද උග්‍ර සිනමා ලෝලියෙක්. සිය ද්විභාෂීය දැනුම මෙහිලා ඔහුට පිටිවහලක් වූ බවට කිසිදු සැකයක් නැහැ. සිනමාව විෂය වූ දෙස් විදෙස් ප්‍රකාශන ආදිය පරිශීලනයෙන් ඔහුගේ සිනමා දැනුම පොහොසත් වූ බව ද උපකල්පනය කරන්නට පුළුවන්.

වසර 1974දි පළමු වැනි වරට තිරගත මණික් සන්ද්‍රසාග්‍රගේ 'කළු දිය දහර' සිනමාපටයේ පළමු චරිතයට පණදෙමින් සිනමාව තරණය කළ මේ බොනිෆස් වෝල්ටර් පෙරේරා වත්මන් සිරිලක සිනමාවේ සක්‍රිය ව සිටින ජ්‍යෝෂ්ඨයෙක්. 'කළු දිය දහර'හිදී ඔහුගේ මේ නාමය සංශෝධන රහිත ව මුළුමනින් ම වෙනස් කරන්නේ සිනමාකරු මණික් සන්ද්‍රසාග්‍ර. එක් අතකට 1960 දශකයේ සිට සිරිලක සිනමාවේ තරුවක වූ බොනිෆස් ප්‍රනාන්දු පිළිබඳ මතකය මේ බොනිෆස්ට අවාසිදායක විය හැකි ව තිබුණා. එසේ ම 1970 දශකයේ සිනමාව ලොවට උචිත ජනකාන්ත නාමයක් සහතික කර ගැනීම ද අත්‍යවශ්‍ය වූවක්. මේ අනුව එතැන් සිට බොනිෆස් වෝල්ටර් පෙරේරා අතුරුදන් වී රවීන්ද්‍ර රන්දෙනිය උපත ලබනවා. මේ රවීන්ද්‍රගේ දෙවැනි උපතයි. සිනමා රූපණය ජය ගත හැකි අසහාය පෞරුෂයක් කල්

විජය ධර්මශ්‍රීගේ සිනමාපට කිහිපයකට ම එක්වීමේ නිසැක ප්‍රතිඵලයක් වූයේ සමාන්තර සිනමාව අභිවර්ධනයට බට රූපණවේදියකු සේ රවීන්ද්‍ර ව හඳුනා ගැනීම. එනමුදු ප්‍රතිභාව හා ව්‍යුත්පත්තිය ඔස්සේ රූපණ සමත්කම වඩවා ගනිමින් සිටි රවීන්ද්‍ර මෙතැනට කොටු වූයේ නැහැ. එසේ කොටු වූයේ නම් පෙර සඳහන් කළ 'දඩයම' සේ ම 'සිරි මැඳුර', 'අනන්ත රාත්‍රිය'. 'අක්ෂරය' වැනි සිනමාපට වෙතින් සිරිලක විශිෂ්ටතම සිනමා රූපණවේදියකු බවට ඔහු පත් නොවන්නට ද ඉඩ තිබුණා.

නොයවා ම සාක්ෂාත් කර ගැනීමත් සමග ම සිරිලක සිනමා අම්බරයේ වෙසෙසින් දිදුලන තාරකාවක් වන්නට රවීන්ද්‍ර අවකාශ සලසා ගත්තා. ඒ, අපමණ රසික මනාපය ද සහිත ව.

සිරිලක සිනමාවේ ස්වර්ණමය සමය සේ විචාරක-රසික සාතිශය බහුතරය සඳහන් කරන්නේ 1960 හෝ 1970 දශක. එක් පසෙකින් කලාත්මක-සම්භාවනීය සිනමා පිවිසුම් පෙරට එන්නට වූයේ නව්‍ය ලකුණු අන්තර්ගත විධික්‍රම ඔස්සේ. ඊට අන්තර්ජාතික චලනය වීම හා පෙරට ඒම් නිරායාසයෙන් ම බලපෑ බව සැබෑවක්. මෙහිදී රූපණ පෙදෙසින් නව මුහුණු ඇවැසි වූයේ යැයි ද සිතෙනවා. ජී.ඩී.එල්. පෙරේරා, සිරි ගුනසිංහ. සුගතපාල සෙනරත් යාපා, රන්ජිත් ලාල්, ධර්මසේන පතිරාජ හා වසන්ත ඔබේසේකර සිය පළමු හා මුල්කාලීන සිනමාපට සඳහා නවකයන් එක්කර ගන්නට දැක්වූයේ සැලකිය යුතු උනන්දුවක්. මණික් සන්ද්‍රසාග්‍ර ද මෙතැනට කැඳවිය යුතු සිනමාකරුවෙක්.

සිරිලක සිනමාවේ පැවැත්ම සුරකිමින් පැතිර ගිය රසාලිප්ත සිනමාවේ ප්‍රමිතිය ඉහළ තලයක රඳවාලීම පිණිස ද රූපණ පෙදෙසේ නවක මුහුණු ඇවැසි වූ බව පැහැදිලි කරුණක්. මෙතැන පෙරමුණ



දඩයම (1984)



ඉන්දුට මල්මිටක් (1981)

ගන්නේ ම සුපිරි තාරකා. පෙර සමයේ සුපිරි තාරකා තුරුණු විය ගෙවා දමමින් සිටීම යන හේතුව ද සලකා බලමිනුයි යසපාලිත නානායක්කාර, නීල් රූපසිංග, කේ.ඒ.ඩබ්ලිව් පෙරේරා වැනි සිනමාකරුවන්ට නවක රූපණවේදීන් හා රූපණවේදිනියන් එක්කර ගන්නට සිදු වූයේ. රවීන්ද්‍ර මේ අවකාශය විෂයෙහි සමත්කම් දක්වන්නේ හෙමින් සීරුවේ. විජය කුමාරතුංග, තිස්ස විජේසුරේන්ද්‍ර වැනි තුරුණු රුවෙන් සපිරි තරු සමග රවීන්ද්‍ර කරට කර සිනමා රූපණයෙහි නිරත වන්නේ බොහෝ විට 1970 දශකයෙන් අනතුරු ව.

සමාන්තර සිනමාව යනුවෙන් වරෙක විචාරක පිළිගැනීමට ද ලක් වන සිනමාපට මාදිලිය වඩා සවිමත් ව උද්දීපනය වන්නේ 1970 දශකයේ මැද භාගයේදී. මෙහි පුරෝගාමියකු වන විජය ධර්ම ශ්‍රී සිය පළමු වැනි සිනමාපටය වන 'දුහුළු මලක්'හි පළමු චරිතය සඳහා රවීන්ද්‍ර ව එක්කර ගන්නේ කිසියම් අවිනිශ්චිත වටාපිටාවක. මෙය සුචරිතවාදී දැක්මට අනුව දුදන ලකුණු සහිත චරිතයක්. එහෙත් රසික අනන්‍ය වීමකට බාධා නොපමුණුවන චරිතයක්. සුපිරි තරුවක වීමේ පෙර ලකුණු ඕනෑවටත් වඩා පළ කරමින් තිබූ පසුබිමක රවීන්ද්‍ර 'දුහුළු මලක්'හි ආන්දෝලනාත්මක බව නිර්මාණශීලී ව ඔප් නංවන්නට රූපණයෙන් දායක වන්නේ තමා පළමු පෙළේ රූපණවේදියකු ම වන බව අවධාරණය කරමින්. වරෙක මෙබඳු චරිත හඳුන්වා දෙන්නේ ප්‍රති වීර යන සිරස්තලය යටතේ. විජය කුමාරතුංග මෙවැනි චරිත නිරූපණය කළේ ප්‍රවේශමෙන්. හොඳම නිදසුන ලෙනින් මොරයස්ගේ 'අහිරහස'. මෙවැනි තතු සතු ඇතැම් සීමා අභිභවා යාමේ සාධනීය ඵල රවීන්ද්‍ර විසින් විශද කරනු ලබන්නේ අනතුරු ව එළැඹි දශකයේදී. වසන්ත ඔබේසේකරගේ 'දඩයම'හි රූපණය විශිෂ්ටතම නිදසුනක්.

විජය ධර්මශ්‍රීගේ සිනමාපට කිහිපයකට ම එක්වීමේ නිසැක ප්‍රතිඵලයක් වූයේ සමාන්තර සිනමාව අභිවර්ධනයට බට රූපණවේදියකු සේ රවීන්ද්‍ර ව හඳුනා ගැනීම. එනමුදු ප්‍රතිභාව හා ව්‍යුත්පත්තිය ඔස්සේ රූපණ සමත්කම වඩවා ගනිමින් සිටි රවීන්ද්‍ර මෙතැනට කොටු වූයේ නැහැ. එසේ කොටු වූයේ නම් පෙර සඳහන් කළ 'දඩයම' සේ ම 'සිරි මැදුර', 'අනන්ත රාත්‍රිය'. 'අක්ෂරය' වැනි සිනමාපට වෙතින් සිරිලක විශිෂ්ටතම සිනමා රූපණවේදියකු බවට ඔහු පත් නොවන්නට ද ඉඩ තිබුණා.


මෙයින් උද්ධරණය කෙරෙන්නේ රවීන්ද්‍ර රන්දෙනිය යනු සෑම මාදිලියක ම සිනමාපට සමග පෑහුණු රූපණවේදියකු වන බව. මේ යටතේ එන අනුමාදිලි වෙතින් ද රවීන්ද්‍රගේ රූපණ සමත්කම් නිශ්චය කර ගන්නට පුළුවන්. වරෙක ඔහු සිනමාකරුවාගේ අභිලාෂය ම ප්‍රකට කරන්නටයි වෙහෙස වන්නේ. තවත් වරෙක සිනමාකරුවාගේ අභිලාෂය පරයා නව අරුත් ජනනයට ද ඔහු වැර දරනවා. අන්‍ය අරුත් දැනවීමට ද ඔහු පසුබට වන්නේ නැහැ. මෙය කෙමෙන් එහෙත් අනුචිත පමාවකින් තොර ව වඩවා ගන්නට ඔහු සමත් වන්නේ සතතාභ්‍යාසය ම මුල්කර ගනිමින්.

සිය කලාපය පුරා නොයෙක් අන්දමින් සැරිසරන කලාකරුවන්ට තමන්ගේ ම වූ දිවියක් සහතික කර ගැනීම පහසු නැහැ. එය පවත්වා ගැනීම ද පහසු නැහැ. වෙසෙසින් ම සිනමා රූපණ කාර්යයට අවතීර්ණවූවකු සම්බන්ධයෙන් මෙය වඩා තීරණාත්මක වනවා. සැබැවින් ම රවීන්ද්‍ර යනු සිනමා රූපණයෙන් ම හඳුනා ගත හැක්කෙක්. අමතර වශයෙන් වේදිකා නාට්‍යයේදී හා රූපවාහිනී නිර්මාණ වෙතින්. එසේ ම ඔහු අතිශය ප්‍රේමනීය යුග දිවියක් ද ගෙවා දමන්නේ ආහ්ලාදයෙන්. පියඹ ප්‍රීති, ඔහුගේ සිනමා රූපණ මුල් සමයේදී හමුවන්නේ ද සිනමාව විෂයෙහි ම බව නොරහසක්. ඈ රවීන්ද්‍රගේ රූපණ සමත්කම් පසුපස ඇති අපමණ වෙහෙස සඟවන යෝධ සෙවනැල්ලක් සේ පැවසීම යුක්ති සහගතයි. රවීන්ද්‍ර නා නා විධ චරිත නා නා විධ සිනමාකරුවන් යටතේ නිරූපණය කරන අයුරු දෙස ඇය උපෙක්ෂාවෙන් සේ ම විචක්ෂණශීලී ව ද බලා සිටින බවයි හැඟෙන්නේ.

සිරිලක සමාන්තර සිනමාව 1970 දශකයේදී හා ඉනික්බිති ව පොහොසත් කළ 'පෙම්බර මධු', 'සිරිපාල හා රන්මැණිකා', 'වසන්තේ දවසක්', 'චූඩා මාණික්‍ය', 'පොඩි මල්ලී', 'බඹා කෙටූ හැටි', 'එක්ටැම් ගේ', 'ඉන්දුට මල් මිටක්', 'සතර දිගන්තය', 'ආරාධනා', 'රෑ මනමාලි', 'දෙවැනි ගමන', 'හිමකතර', 'ඩොරින්ගේ සයනය', 'කරදිය වළල්ල' ඇතුළු සිනමාපට ගණනාවක ම පළමු වැනි හෝ දෙවැනි පෙළ චරිත නිරූපණය කරමින් රවීන්ද්‍ර දැක්වූ කුසලතා ඇගැයීමෙන් බැහැර වන්නට කිසිදු සම්මාන උලෙළක් පියවර ගත්තේ නැහැ. රවීන්ද්‍ර සිරිලක සිනමා තාරකා අම්බරයේ දීප්තිමත් ම තරුවක් බවට නිත්‍ය වශයෙන් ම පත් වන්නේ මේ සිනමාපට ඔස්සේ. ඇතැම් තැනකදී අදාළ චරිතයේ හතර කොන ජය ගැනීමේ නොතිත් ආසාවකින් ඔහු පසු වූ බව ද දකින්නට පුළුවන්. එනමුදු හැකි සෑම විටෙක ම ඒ ඒ සිනමාකරුවන්ගේ අරමුණු සාධනය පිණිස ම තමා උත්සුක වන බවයි ඔහු ගම්‍ය කරන්නේ. 'පෙම්බර මධු", 'පොඩි මල්ලී", 'ඉන්දුට මල් මිටක්' නිදසුන් කිහිපයක්. සමාන්තර ව දිවෙන පළමු පෙළ චරිත නොඉක්මවීමෙන් ඔහු [illegible] සිනමාපට වෙත ලබා දුන් දායකත්වය අගය කළ යුතුමයි. 'දෙවැනි ගමන' ඇතුළු සිනමාපට කිහිපයක ම දෙ වැනි පෙළ චරිත නිරූපණය කරමින් පළමු පෙළ චරිත නිරූපණයට බට රූපණවේදීන්ට දුන් සහය ද රවීන්ද්‍රගේ විශිෂ්ටත්වය පසුපස පවතින සාධකයක්.

# සුපිරි තරුවක්

**සනත් ගුණතිලක**
රංගන ශිල්පී හා චිත්‍රපට අධ්‍යක්ෂ



සිනමා රූපණයට එක් වීමේ කිසිදු අදහසකින් තොර ව ගෙවා දැමුණු තරුණ වියේදී මා හද බැඳ ගත් සිනමා රූපණවේදීන් අතර රවීන්ද්‍ර රන්දෙනිය ඉදිරියෙන් ම සිටිනවා. මෙහි ඇරඹුම දනවන්නේ තරමක වෙනස් හැඟීමක්. ඒ, සී.ටී.පෙරේරා නිර්මාණය කළ 'ගංගා' සිනමාපටයෙන්. මේ වන විට ගාමිණී ෆොන්සේකා, ටෝනි රණසිංහ, ආනන්ද ජයරත්න කෙරෙහි ප්‍රියතාවක් දැක්වූ මා විජය කුමාරණතුංගගේ කඩවසම්, ප්‍රේමනීය ඇවතුම් පැවතුම් හා ආසක්ත ව සිටියේ නිරායාසයෙන්. විජය හා සුපිරි තරුවක වන මාලිනී සමග රවීන්ද්‍ර 'ගංගා'හි ප්‍රධාන චරිතයක් නිරූපණය කරන්නේ පෙර දැක්වූ පරිදි මා ඇතුළු මගේ සමකාලීන සිනමා ලෝලීන් තුළ යම් විස්මයක් දනවමින්. සිය උතුරා යන තුරුණු රුව සඟවා ගත් රවීන්ද්‍ර මැදිවියේ චරිතයකින් අපට සමීප වූයේ වඩා ආදරණීය ව. මෙය පසුකාලීන ව විවිධ චරිත නිරූපණයෙන් මෙරට සිනමා රූපණය පොහොසත් කරලීමට ඔහු දැක්වූ උනන්දුව පිළිබිඹු කිරීමක් ලෙසින් මා විශ්වාස කරනවා. 'දඩයම', 'සිරි මැඳුර' සාගර ජලය මදි හැඬුවා ඔබ සන්දා' උදාහරණ කිහිපයක්.

මෙරට සිනමාවේ සුරැකුම හා පැවැත්ම වෙනුවෙන් ඍජු ව ම පෙනී සිටි දැවැන්තයකු සේ රවීන්ද්‍ර හඳුන්වා දීම යුක්ති යුක්තයි. මේ පිළිබඳ මට ඇති අත්දැකීම් සනිටුහන් කරන්නේ සැබවින් ම ඔහුගේ පැතිරුණු දිවියේ අගය අවධාරණය කිරීමට. මෙරට සිනමාවේ අර්බුද දුරලා එය සවිමත් කිරීමේ පියවර හඳුන්වා දුන් වී. අම්බලවානර් කමිටුවට අදාළ ව මෙහි පළමු අවස්ථාව දක්වන්න මා කැමතියි. රවීන්ද්‍ර නොපැකිළ ව මෙහි එන ඇතැම් ප්‍රශ්නකාරී යෝජනා කිහිපයකට එරෙහි ව පෙනී සිටියා. එවක ජනපති රණසිංහ ප්‍රේමදාසගේ ඇස් වසා මේ

දශක පහකට ආසන්න සිය සිනමා රූපණ දිවි සැරිය විෂයෙහි අඛණ්ඩ ව සිනමාකරණයෙහි නිරත කිසිදු සිනමාකරුවකු සමග. දිගුකාලීන සබඳතා නොපැවැත්වීම රවීන්ද්‍ර වෙතින් දත හැකි සුවිශේෂ ලකුණක්. නොයෙකුත් හේතු මත ධර්මසේන පතිරාජ, ධර්මසිරි බණ්ඩාරනායක, තිස්ස අබේසේකර, පරාක්‍රම ද සිල්වා වැනි 1970 හා 1980 දෙදශකයේ සිරිලක සිනමාව බල ගැන්වූ සිනමාකරුවන් ඇසුරේ රූපණ සමත්කම් විදහා දැක්වීමට රවීන්ද්‍ර වෙත අවස්ථා උදා වූයේ නැහැ. ධර්මසේන පතිරාජ සිය රූපවාහිනී ආගමනය ප්‍රබලාකාරයෙන් සනිටුහන් කරන්නේ රවීන්ද්‍රගේ ද රූපණයෙන් යන්න අමතක නොකළ යුතු කාරණයක්. ධර්මසිරි බණ්ඩාරනායක සමග රවීන්ද්‍ර එක්වන්නේ 1990 දශකයේදී.

වරෙක රවීන්ද්‍ර ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ පාර්ශ්වය නියෝජනය කරනවා. 'GOD KING', 'වීර පුරන් අප්පු', 'වැකන්ද වලව්ව' යන මේ සිනමාපට ලෙස්ටර්ගේ ලකුණ නිරවුල් ව සනිටුහන් කළ සිනමාපට සේ හඳුනා ගන්නේ ඉඳහිට.

තවත් වරෙක රවීන්ද්‍ර නියෝජනය කරන්නේ වසන්ත ඔබේසේකර පාර්ශ්වය. මෙහිලා 'දඩයම' වෙසෙසින් කැපී පෙනෙන බව පෙරදී ද සඳහන් කෙරුණා. එසේ ම වසන්තගේ 'තීර්ථ යාත්‍රා', 'සෙව්වන්දි' යන සිනමාපට විද්වත් රසික හා විචාරක අවධානයට ලක් වන්නේ ද රවීන්ද්‍රගේ රූපණ නිසා ය යන්න කිව යුත්තක්.

සුමිත්‍රා පීරිස් ද රවීන්ද්‍රගේ රූපණ දායකත්වය අපේක්ෂා කරන්නේ ඉහළ ම මට්ටමකින්. 'මායා', 'සාගර ජලය මදි හැඬුවා ඔබ සන්දා' සුමිත්‍රාගේ මුද්‍රාව සහිත සිනමාපට වන්නේ රවීන්ද්‍රගේ රූපණ ප්‍රතිභාව ද නිසා.

1990 දශකයේ උදාවත් සමග ම පෙරට ආ සිනමාවේ සියුම් හා ප්‍රබල ප්‍රකාශන සමත්කම අන්තර්ජාතික අවධානයට ද පාත්‍ර කළ සිනමාකරුවන්ගේ අවධානයට රවීන්ද්‍ර ලක් වන්නේ කිසියම් අපූර්වත්වයක් ද ජනිත කරමින්. සුපිරි තරු තෝරා ගන්නට මේ ඇතැම් සිනමාකරුවන් උනන්දු වූයේ නැහැ. එසේ ම ඔවුන් පෙර මෙන් නිපැයුම්කරුවන්ගේ මැදහත්වීම් අරඹයා ද දැක්වූයේ ස්වීයත්වය සහතික කර ගන්නා ආකල්පයක්. මෙතැනදී කැපී පෙනෙන 'අනන්ත රාත්‍රිය' හා 'අක්ෂරය' රවීන්ද්‍රගේ සිනමා රූපණයේ තවත් පාරප්‍රාප්ත වීමක් සේ හඳුනා ගැනීම කිසි ලෙසකින්වත් යටපත් කළ යුතු වන්නේ නැහැ. 'අනන්ත රාත්‍රිය' නිමවීමේදී සිනමාකරු ප්‍රසන්න විතානගේ උත්සුක වන්නේ ඇතුළු හදට නැමුණු, කියා ගත නොහැකි පශ්චාත්තාපයකින් ආතුර වූ මැදිවියේ පුරුෂයකු නිර්මාණයට. රවීන්ද්‍ර මෙහිලා අතිශයින් ම සාර්ථක වන්නේ වාර කිහිපයකදී ම සිය සමීපතම තරගකාරිය වූ ස්වර්ණා මල්ලවආරච්චි සමග වීම ද බැහැර කළ නොහැකි කාරණයක්.



සම්මානයක සතුට - විජය සහ මාලනී සමග

අශෝක හඳගම 'අක්ෂරය' නිර්මාණයට පැමිණෙන්නේ දිවි තුළ සැඟවුණු හේතු මත නිරන්තර පීඩනයකට ලක් වූ යුක්තිය පසිඳලන්නකුගේ චරිතය සමග. රවීන්ද්‍ර මේ දුලබ චරිතය නිරූපණයට එකඟ වීම පවා අභියෝගාත්මක වනවා.

සිනමා රූපණවේදීන් පිළිබඳ සංකථන විෂයෙහි ඔවුන්ගේ රසාලිප්ත සිනමා ඇසුර බැහැර කෙරෙන්නේ වරෙක කිසිදු පූර්ව දැනුම් දීමකින් තොර ව. මෙය සිනමා විචාරය විසින් ජය ගනු ලැබිය යුතු වූවක් සේ නිර්ණය කිරීම වඩා නිවැරදියි. සිනමාවේ සමස්තය පිළිබඳ නිසි වැටහීමක් ලබා ගනු පිණිස සෑම මාදිලියක ම සිනමාපට විමසීම අත්‍යවශ්‍ය වන්නක්. එසේ ම ඇතැම් ශිල්පීන්ගේ සමත්කම් කුළුගැන්වෙන විකල්ප අවස්ථා හසු කර ගත හැක්කේ ද සම්මත විචාරක අවධානයට ලක් නොවන හෝ අඩුවෙන් ලක් වන මෙබඳු සිනමාපට ද මහෝපකාරී කොටගෙන.

සිය සිනමා රූපණ දිවි සැරියේ මුල් සමයේදී මුළුමනින් ම රසාලිප්ත වූ සිනමා ධාරා හා එක්වීමේ නැඹුරුවක් රවීන්ද්‍ර වෙතින් පළ නොවූ බව සැබෑවක්. කෙසේ නමුදු 1980 දශකයේ මුල් සමය කරා ඔහු පැමිණෙන්නේ 'මුවන් පැලැස්ස 3', 'මොනරතැන්න 2', 'හිතත් හොඳයි වැඩත් හොඳයි', 'චන්නයි කෙල්ලො දෙන්නයි' වැනි එබඳු සිනමාපට සමග. 1980 දශකයේදී හඳුනා ගැනෙන ඉන්දීය අනුකාරක සිනමාපට මාදිලියේ අවස්ථා කිහිපයක් සමගින් ද රවීන්ද්‍ර එක්වනවා. 'ජය අපිටයි', 'රජ වැඩකාරයෝ' නිදසුන් ද්විත්වයක්.

රවීන්ද්‍රගේ මේ පිවිසුම යම් නවමු බවක් ද රැගෙන එන බවයි විද්වත් රසික ප්‍රජාවට වුව හැඟෙන්නේ. සමකාලීන ව කැපී පෙනුණු විජය කුමාරතුංග, සනත් ගුණතිලක, ජීවන් කුමාරතුංග පළ කළ තරු ලකුණු හමුවේ රවීන්ද්‍ර සිය අනන්‍යතාව රැකගන්නේ උපයා ගත කිසිවක් අනිසි ලෙස වැය නොකරමින්. එසේ ම කවර සිනමා මාදිලියකට වුව අනවබෝධයකින් තොර ව අනුගත ව සිනමා කර්මාන්තයේ සුරැකුම වෙනුවෙන් ක්‍රියා කරන්නට තමා සතු සමත්කම සේ ම ඕනෑකම ද මෙතැනදී රවීන්ද්‍ර අවධාරණය කරනවා.

'ඉන්දියානු ජනාකර්ෂණීය සිනමාවේ රූපණ මුහුණුවර හා දැක්ම එලෙසින් ම හෝ ඊට සමීප ව අනුකරණයට හා ඇවැසි පරිදි නිරූපණයට එකඟ නොවූ පළමුවැන්නා වන්නේ ගාමිණී ෆොන්සේකා ය' යන්න තිරතුරු ව ම කියැවෙන්නක්. ගාමිණී මෙසේ රැගෙන ආවේ බටහිර පළමු පෙළේ රූපණ ලකුණු. යම් වෑයමකින් අනතුරු ව මේ ලකුණු ගළපාලීමට ඔහු සමත් වූ අවස්ථා ගණනාවක් ම මතකයට නගා ගන්නට පුළුවන්. අනතුරු ව ටෝනි රණසිංහ, ඩග්ලස් රණසිංහ වැනි රූපණවේදීන් යුරෝපීය සම්භාව්‍ය සිනමා රූපණයේ වැඩුණු අවස්ථා සමග සිරිලක සිනමා රූපණය පොහොසත් කළ බව ද අමතක කරන්නට බැහැ. ජෝ අබේවික්‍රම නිසැක ව ම දකුණු ආසියානු ජන දිවිය අදාළ සැඟවුණු තතු සමග ම ප්‍රතිනිර්මාණය කරන්නෙක්. විජය කුමාරතුංග හා අමරසිරි කලංසූරිය එක්තරා ආකාරයකින් ප්‍රංශ සිනමා නවරැල්ලේ ලකුණු මඳ පමණින් වුව පිළිබිඹු කළ බව ද පැහැදිලි වන්නක්. සනත් ගුණතිලකගේ රූපණය ඒ ඒ සිනමාකරුවන් විසින් හසුරුවනු ලබන්නේ අනන්‍යතාව පිළිබඳ සුපුරුදු කියැවීම් හා එපමණට ම එකඟ නොවෙමින්. මෙතැනදී රවීන්ද්‍ර රන්දෙනිය හඳුනා ගත හැක්කේ උක්ත කාරණා සියල්ල ම මුසුවීමේ ඵලයක් ලෙසින්. මේ නිසා රවීන්ද්‍ර යනු නිල හෝ නොනිල වර්ගීකරණයකට ලක් කළ නොහැකි හෝ ලක් කිරීම අසීරු සිනමා රූපණවේදියකු වනවා. සියයකට අධික ඔහුගේ සිනමා රූපණ අවස්ථා එකින් එක ගෙන විමසීමේදී මෙන් ම සමස්තයක් ලෙස විමසීමේදී ද මේ අදහසේ නිවැරදිතාව වටහා ගැනීම අපහසු නැහැ.

'රවීන්ද්‍ර සිරිලක සිනමා රූපණයේ විශිෂ්ටයකු වන්නේ සිනමාකරුවන් හා නිපැයුම්කරුවන් නිසා මෙන් ම රූපණවේදීන් ද නිසා ය' යන්න සඳහන් කළ යුත්තක්. නිසැක වශයෙන් ම මෙහිලා පළමු තැනට පැමිණෙන්නේ

යෝජනා ක්‍රියාත්මක කිරීමේ උත්සාහය ව්‍යර්ථ කරලීමට ඔහුගේ උපදෙස් මත මා ද ක්‍රියා කළා. මා සමග සිනමාකරු කේ.ඒ.ඩබ්ලිව්.පෙරේරාත් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ නිලධාරි පිරිසකුත් එක් වූ බව සඳහන් කළ යුතුයි.

මෙරට සිනමාවේ උන්නතිය උදෙසා ගත යුතු පියවර සඳහන් කළ සේනක බණ්ඩාරනායක කමිටුවේ නිර්දේශ විමසුමේදී ද රවීන්ද්‍රගේ නිර්භය පිවිසුම දක්නට ලැබුණා. ඒ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග පාලන සමයේදී. මේ කමිටු වාර්තාවේ සඳහන් සිනමාපට බෙදා හැරීමේ නව යෝජනා දෙස බොහෝ දෙනෙකු බැලුවේ සුබවාදී අන්දමින්. නමුත් රවීන්ද්‍ර මෙහි එන අනතුරු කරුණු සහිත ව අප හමුවේ පැහැදිලි කළා. ඉන් ඇතැම් පෙන්වාදීම් අදටත් වලංගු වන බවයි මගේ අදහස. මේ අවස්ථා දෙකේදී ම සිනමා කර්මාන්තයේ හැඩරුව හා පරිවර්තන සම්බන්ධයෙන් ඔහු තුළ වූ පුළුල් වැටහීම හඳුනා ගන්නට පුළුවන්.

සිනමා ශිල්පීන්ගේ සුරැකුම වෙනුවෙන් ද ඔහුගේ කැපවීම කැපී පෙනෙනවා. විශේෂයෙන් රූපණවේදීන් හා රූපණවේදිනියන් වෙනුවෙන් ඔහුගේ පෙනී සිටීම අප ව දිරිමත් කරන සුළුයි. 1983 ජූලි ව්‍යසනයෙන් අනතුරු ව වික්ෂිප්ත ව සිටි මා ඇතුළු බොහෝ සිනමා රූපණවේදීන්ට හා රූපණවේදිනියන්ට යහපත් අපේක්ෂා රැගෙන ඒම සඳහා රවීන්ද්‍ර පළ කළ විශ්වසනීයත්වය අතිමහත්. ඔහු මා ද කැටුව ඔහුගේ මෝටර් රථයෙන් නළු නිළියන් සම්මුඛ වීමට යමින් මේ කෙරෙහි දැක්වූ උනන්දුව කිසිසේත් ම අමතක කළ යුතු නැහැ. ශ්‍රී ලංකා නළු නිළි සංගමයේ සභාපතිවරයා ලෙස පත් ව රවීන්ද්‍ර සිදු කළ මෙහෙවර ද මා බෙහෙවින් අගය කරනවා.

සිනමා රූගත කිරීම් විෂයෙහි රවීන්ද්‍රගේ හැසිරීම් නවක අපට අධ්‍යයන ක්ෂේත්‍රයක්. හේමසිරි සෙල්ලප්පෙරුමගේ 'සත්වෙනි දවස' රූගත කෙරුණු සමය එක් උදාහරණයක් පමණයි. එක් පසෙකින් තමාට ලැබුණු චරිතය වෙනුවෙන් ඔහු දැක්වූයේ අසීමිත කැපවීමක්. එහි ප්‍රතිවීර ලකුණු ප්‍රශ්න නොකිරීමත් ඔහුගේ පිළිවෙතක්. අප වැනි නවකයන්ට ලබා දුන් ගුරුහරුකම් සප්‍රයෝජනවත් වූයේ පසුකාලීන ව. එසේ ම සෑම විට ම අපට සමාන ව සැලකීමටත් ඔහු උත්සුක වූවා.

කිසිදු කලාකරුවකුට විශ්‍රාම දිවියක් නොලැබෙන බව රවීන්ද්‍රගේ කීර්තිමත් දිවිය නොසඟවා පවසන කරුණක්. රවීන්ද්‍ර මෙතැනදී කැපී පෙනෙන්නේ සිනමා රූපණයෙන් පමණක් ම විශිෂ්ටත්වයට පත්වූවකු නිසා. දීප්තිය කිසි ලෙසකින්වත් අඩු නොවන සුපිරි තරුවක් ද වන නිසා.

ස්වර්ණා මල්ලවාරච්චි. එසේ ම ඉන්දිරා ජොන්ක්ලාස්, ශ්‍රියානි අමරසේන, මාලිනී ෆොන්සේකා, නීටා ප්‍රනාන්දු, ගීතා කුමාරසිංහ, වීණා ජයකොඩි, අනෝජා වීරසිංහ යන රූපණවේදිනියන් ද රවීන්ද්‍රගේ සිනමා රූපණයේ විශිෂ්ටත්වය පසුපස නන් අයුරින් රැඳී සිටිනවා.

විදෙස් සිනමාපට හා රූපවාහිනී වෘත්තාන්ත කිහිපයක එන රවීන්ද්‍රගේ රූපණ කාර්යය නිසි විමසුමකට ලක් කිරීම සිනමා හා රූපවාහිනී විචාරය විසින් තවදුරටත් අතපසු නොකළ යුතු වගකීමක්. මේවා මුල් පෙළේ නිර්මාණ නොවන්නට ද පුළුවන්. එසේ වුව ද සිරිලක සිනමා රූපණවේදියකු වෙත මෙවැනි ආකාරයේ අවස්ථා ලැබීම නොසලකා හරින්නට බැහැ. ’JUNGLE HEAT, LEN MYSTERES DUSADJURAH’, ‘MOTHER THERESA IN THE NAME OF THE GODS POOR’, ‘MOTHER THRESA OF CULUTTA’ යන මේ නිර්මාණ සිරිලක සිනමා හා රූපවාහිනී රසිකයා වෙත කෙතෙක්දුරට සමීප වූයේ ද යන්න ගැටලුවක්.

සිනමා රූපණයේ තරුවක් සේ ම විශිෂ්ටයකු ද වන නිසා රවීන්ද්‍රගේ වේදිකා නාට්‍ය හා රූපවාහිනී රූපණ දායකත්වය සැඟවී යන්නට ඕනෑ තරම් ඉඩ තිබෙනවා. මෙබඳු අවලෝකනයකදී හැකි පමණින් වෙහෙස විය යුත්තේ එසේ නොවීම පිණිස ඇවැසි සුදුසු පියවර අනුගමනය. සැබවින් ම මේ රවීන්ද්‍රට සමකාලීන ව සිනමා රූපණය සැබැවින් ම ජය ගත් රූපණවේදීන් හා රූපණවේදිනියන් කිහිප දෙනකුට ම අදාළ වන්නේ සෘජු ව ම. ගාමිණී ෆොන්සේකා, මාලිනී ෆොන්සේකා, අයිරාංගනී සේරසිංහ, ටෝනි රණසිංහ, කමල් අද්දරආරච්චි, මොවුන් අතුරෙන් කිහිපදෙනෙක්.

සිනමා රූපණය හා එක්වීමට පෙරාතුවයි රවීන්ද්‍ර කොළඹ, ලයනල් වෙන්ට්ඩ්හි ඇරඹුණු වේදිකා නාට්‍ය අධ්‍යයන පාඨමාලාවකට එක්වන්නේ. මේ සුප්‍රකට රංග ශිල්ප සාලිකාව. පාඨමාලා අදියුරු වූයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර. ධම්ම ජාගොඩ වෙතින් ලද රූපණ දැනුම රවීන්ද්‍රගේ පසුකාලීන සිනමා රූපණය කෙරෙහි හරවත් ව බලපෑ බව නොරහසක්. වේදිකා නාට්‍ය රූපණය,

# දඩබ්බර විලාසය වරෙක අස්වැසිල්ලක්



**උදයකාන්ත වර්ණසූරිය**
චිත්‍රපට අධ්‍යක්ෂ

සිනමාකරුවකුගේ වෙහෙසකර ප්‍රයත්නය ප්‍රේක්ෂකයා කරා රැගෙන යාමේදී රංගන ශිල්පීන්, ශිල්පිනියන් දක්වන දායකත්වය හා මැදිහත්වීම කිසි විටෙකත් අවතක්සේරු කරන්නට බැහැ. ඇතැම් කුඩා චරිත පවා යම් සිනමාපටයක තේමාව හා අරමුණ කුළුගැන්විමේදී විසල් කාර්යභාරයක් ඉටු කරන බව නොරහසක්. සිනමාකරුවකුට අවශ්‍ය වන රංගනය එලෙසින් ම ලබා දීම සිනමා ශිල්පීන්ගේ හා ශිල්පිනියන්ගේ පරම  වගකීමක්. එය උකහා ගැනීමේ වගකීම පැවරෙන පළමුවැන්නා වන්නේ සිනමාකරුවා. මන්ද සිනමාපටයක වගකිවයුත්තා සිනමාකරුවා වන නිසා. මගේ වසර 30කට ආසන්න  සිනමා අධ්‍යක්ෂණ ජීවිතයේදී මේ අත්දැකීම නොමඳ ව ලබා ගත්තේ ප්‍රවීන හා නවක දෙපක්ෂයෙන් ම.
මෙතැනදී රවීන්ද්‍ර රන්දෙනිය පිළිබඳ මගේ අත්දැකීම් අතිශයින් ම වැදගත්. මට රවීන්ද්‍ර හමුවන්නේ ප්‍රතිභාපූර්ණ හා ජනකාන්ත සිනමා නළුවකුව සිටියදී. හැම විට ම ඔහු උත්සුක වූයේ මගේ අරමුණු ඉහළින් ම සාක්ෂාත් කරන්නට. මේ සඳහා ඔහු කැපවුණා. මෙහිලා ඔහු පළ කරන තරමක දඩබ්බර විලාසය මට වරෙක මහත් අස්වැසිල්ලක්. සෙසු ශිල්පීන් හා ශිල්පිනියන් සමග ඔහු පවත්වාගෙන යන සුහද සම්බන්ධතාව මේ ඔස්සේ තීව්‍ර වූ බවයි මට හැඟෙන්නේ.

ඔහු මෙහෙයවීම පහසුයි. ඉතා කුඩා චරිතයකට වුවත් ඔහු ලබා දෙන්නේ දැඩි අවධානයක්. ඉහළ ම වටිනාකමක්. හොඳම උදාහරණය මගේ ‘රිදී සීනු’හි එන ඔහුගේ රංගනය. තමා වෙත ලැබෙන චරිතය කුඩා වුවත් එය අන් චරිත යටපත් වන අන්දමින් නිරූපණය නොකිරීමටත් ඔහු ප්‍රවේශම් වනවා. වසර කිහිපයකට පෙර මා අධ්‍යක්ෂණය කළ ‘වස්සානයේ සඳ’හිදී ඔහු දෙවැනි පෙළ වැඩිහිටි චරිතයක් නිරූපණය කරන්නේ ප්‍රධාන චරිත සඳහා අවශ්‍ය පසුබිම අවහිර නොකරමින්. ඒ නිසා ම ප්‍රධාන චරිත නිරූපණය කළ නවක තරුණ නළු නිළියන් සිව්දෙනා හසුරුවාලීම මට පහසු වුණා.

තරුණ හා නවක නළු නිළියන් රවීන්ද්‍රගේ කෘතහස්ත රඟපෑම් සම්බන්ධයෙන් අපමණ සැලකිල්ලක් දක්වන බවත් මා නිරීක්ෂණය කළ විශේෂ තත්ත්වයක්. තමාගේ රංගන හැකියාවෙන් ඔවුන් ලබන  දැනුම සම්බන්ධයෙන් රවීන්ද්‍ර මහත් සේ සතුටු වන්නට ඇති බවත් මට හැඟෙනවා. ඉන් ඔහු අපේක්ෂා කරන්නට ඇත්තේ අනාගත සිනමා රංගනයට සමත් පිරිසක් සවිබල ගැන්වීම.

මගේ ‘සෙනෙහසේ ගීතය’ ප්‍රාසංගික රූපවාහිනී වෘත්තාන්තයේ එන රවීන්ද්‍රගේ රංගනය පිළිබඳවත් කරුණු සඳහන් කිරීම වැදගත්. සුව කළ නොහැකි රෝගයකින් මිය යන යහපත් මිනිසකුගේ චරිතය රවීන්ද්‍ර නිරූපණය කරන්නේ සමස්ත නිර්මාණයේ ම අදෘශ්‍යමාන ව රැඳී සිටිමින්. ඔහු සතු ව ඇත්තේ සිනමා රංගන හැකියාව පමණක් ම නොවන බවයි මෙහිදී අවධාරණය කෙරුණේ.

මට ඔහුගේ රංගන දායකත්වය වැඩිපුර ලබා ගැනීමට හැකියාව ලැබුණේ  නැහැ. එහෙත් යට කී අවස්ථා කිහිපයට හෝ ඔහු ව එක්කර ගැනීමට අවකාශ සැලසීම ගැන මා බෙහෙවින්ම සතුටට පත්වනවා. මා ඔහුගේ රසිකයෙක්. ඔහුගේ අගනා රඟපෑම් සහිත සිනමාපට නැරඹීමෙන් ලබන අත්දැකීම් නිර්මාණකරණයේදී භාවිත කරලීමට මා කිසිසේත් ම පසුබට වන්නේ නැහැ.

සිනමා රූපණය හා ගළපාලීමේදී සපුරා ගත යුතු දෑ පිළිබඳ ගැඹුරු දැනුමක් මෙහිලා රවීන්ද්‍ර වෙත ලැබෙන්නට ඇති. එසේ ම ගුණසේන ගලප්පත්ති, සුගතපාල ද සිල්වා, හෙන්රි ජයසේන, වින්ස්ටන් සේරසිංහ, අයිරාංගනී සේරසිංහ, කැරන් බ්‍රෙකන්රිජ් වැනි සමකාලීන සිරිලක වේදිකා නාට්‍ය බිමේ කැපී පෙනුණු චරිත ඇසුරේ ලද ගුරුහරුකම් ද රවීන්ද්‍රගේ රූපණ සවිය තියුණු කරන්නට පිටිවහලක් වූ බව පැහැදිලි වනවා.

රවීන්ද්‍රගේ සීමිත වේදිකා නාට්‍ය රූපණ සහභාගීත්වය සුවිශේෂ වන්නේ එය සිරිලක වේදිකා නාට්‍ය බිම සාරවත් කිරීමට හේතු වූ  නිසා. ගුණසේන ගලප්පත්තිගේ ‘මූදු පුත්තු’ නව නිපැයුමේ චරිතයක් රවීන්ද්‍ර විසින් නිරූපණය කරනු ලැබීම සුබවාදී වූයේ ධම්ම ජාගොඩගේ හා ආර්. ආර්. සමරකෝන්ගේ අවධානයට ලක් වීමත් සමග. ධම්ම ජාගොඩගේ ‘වෙස්මුහුණු’ හා ආර්. ආර්. සමරකෝන්ගේ ‘ඉඩම’ රවීන්ද්‍රගේ රූපණ සහභාගීත්වයෙන් කැපී පෙනුණු බව සමකාලීන වාර්තා හැදෑරීමේදී සහතික කර ගන්නට පුළුවන්. වසර ගණනාවකට පසු රවීන්ද්‍ර යළි වේදිකාවට ගොඩවන්නේ ටෝනි රණසිංහගේ ‘ජුලියස් සීසර්’ වෙනුවෙන්. මේ වන විට රවීන්ද්‍ර සිරිලක සිනමාවේ විශිෂ්ට හා ජනකාන්ත රූපණවේදියෙක්.

රවීන්ද්‍රගේ මේ සීමිත වේදිකා නාට්‍ය සහභාගීත්වය සිනමාවේ ප්‍රබල ප්‍රකාශන සමත්කම පිළිබඳ  අදහසක් ගෙන එනවා. එනම් ‘රූපණ ආධිපත්‍යය තවදුරටත් දරන්නේ සිනමාව ය’ යන්න. එසේ ම සිනමාවට වේදිකා නාට්‍ය සපැමිණීම තවදුරටත්  දක්නට ලැබෙන බව ද ඉන් කියැවෙනවා.

රූපවාහිනී රූපණයෙන් රවීන්ද්‍රගේ ප්‍රතිභාව දත හැකි අවස්ථා කිහිපයක් ම හඳුනා ගන්නට පුළුවන්. ඉන් ධර්මසේන පතිරාජගේ ‘ඇල්ල ළඟ වලව්ව’ නියත වශයෙන් ම මුල් තැනක් ගන්නවා. මෙය සිරිලක රූපවාහිනී වෘත්තාන්තයේ එක්තරා හැරවුම් ලක්ෂ්‍යයක්. සිනමා රූපණයේ අඛණ්ඩ ව නිරත වීමේ වාසිය රූපවාහිනියට උචිත පරිදි ගළපා ගැනීමේදී රවීන්ද්‍ර කවර තරමේ සමත්කම් පෑවේ ද යන පැනයට ‘ඇල්ල ළඟ වලව්ව’ හොඳම පිළිතුරක්.

> රවීන්ද්‍ර සිරිලක සිනමා රූපණයේ විශිෂ්ටයකු වන්නේ සිනමාකරුවන් හා නිපැයුම්කරුවන් නිසා මෙන් ම රූපණවේදීන් ද නිසා ය’ යන්න සඳහන් කළ යුත්තක්. නිසැක වශයෙන් ම මෙහිලා පළමු තැනට පැමිණෙන්නේ ස්වර්ණා මල්ලවාරච්චි. එසේ ම ඉන්දිරා ජොන්ක්ලාස්, ශ්‍රියානි අමරසේන, මාලිනී ෆොන්සේකා, නීටා ප්‍රනාන්දු, ගීතා කුමාරසිංහ, වීණා ජයකොඩි, අනෝජා වීරසිංහ යන රූපණවේදිනියන් ද රවීන්ද්‍රගේ සිනමා රූපණයේ විශිෂ්ටත්වය පසුපස නන් අයුරින් රැඳී සිටිනවා.



අඩ සියවසක සිනමා දිවිය සමරමින්


මව පියා සහ සහෝදර සහෝදරියන් සමගින්


සිය කැදැල්ලේ සතුට



බොලිවුඩ් තරු සමග





Mother Teresa (1997)

'ඇල්ල ළඟ වලව්ව' හැරුණු කොට පතිරාජගේ ම 'පුරසක්මන' හා ජයන්ත චන්ද්‍රසිරිගේ 'රැජන' යන රූපවාහිනී වෘත්තාන්ත සඳහා ද රවීන්ද්‍ර එක්වූයේ රූපවාහිනී රූපණයේ පළමුවැන්නන් බොහෝ දෙනෙකු අභිභවා යමින්. සිනමා තිරයට අදාළ ව සපුරා ගත් ප්‍රතිරූපය රවීන්ද්‍රගේ රූපවාහිනී සපැමිණීමේ ද දකින්නට පුළුවන්.

සිනමා රූපණය උදෙසා රවීන්ද්‍ර ලද සම්මාන විෂයෙහි පළමු චරිත පමණක් ම සඳහන් නොවීම පවසන්නේ කවර පමණක චරිතයක් වුව බැහැර නොකිරීමට ඔහු සූදානමින් සිටින බව. අතිශය කුඩා චරිතයකින් වුව සිය රූපණ සමත්කම ගෙන එන්නට හැකි නම් එය නොතකා නොහැරීම පරිණත රූපණවේදියකු සතු වැදගත් ගුණාංගයක්. විශ්වනාත් බුද්ධික කීර්තිසේනගේ 'මිල්ලෙ සොයා' හා 'නිම්නයක හුදෙකලාව'හි එන රවීන්ද්‍රගේ රූපණය මේ බව සහතික කරනවා.

'සිරිපාල හා රන්මැණිකා', 'සඳකඩ පහණ', 'දඩයම', 'මායා', 'සිරි මැදුර', 'සෙයිලම', 'අනන්ත රාත්‍රිය' රවීන්ද්‍ර වෙත ජනාධිපති, සරසවිය, ඕ.සී.අයි.සී., ස්වර්ණ සංඛ රූපණ සම්මාන පළමු පෙළ චරිත සඳහා හිමිකර දුන් සිනමාපට. මේ හැරුණුකොට 'පොඩි මල්ලී', 'සත්වෙනි දවස', 'පාරමිතා', 'බවදුක' යන සිනමාපට වෙනුවෙන් රවීන්ද්‍ර වෙත පිරිනැමුණේ දෙ වැනි පෙළ චරිත නිරූපණ සම්මාන.

රූපණ දිවියේ එක් වරක් පමණක් හිමි වන රණතිසර, ස්වර්ණසිංහ සමාන ද්විත්වය රවීන්ද්‍ර වෙත පිරිනමමින් සරසවිය හා ජනාධිපති සිනමා සම්මාන උලෙළ ද්විත්වය සිය කීර්තිය ඉහළ නංවා ගත් බව ද පැවසිය යුත්තක්. 'ඉඩම' වේදිකා නාට්‍ය වෙනුවෙන් රවීන්ද්‍ර ඇගැයීමක් ලැබුවේ 1970 දශකයේදී. සුමති හා රයිගම් රූපවාහිනී සම්මාන උළෙල වෙතින් ද ඔහු විශිෂ්ටයකු සේ සම්මානනීය වූවා. රවීන්ද්‍ර නම් අසහාය රූපණවේදියා පිළිබඳ වඩා පරිසමාප්ත විමසුමකට මේ සම්මාන පෙළ ද මහෝපකාරී කොට ගන්නට පුළුවන්.

සිනමාව මුල්කර ගත් රූපණවේදියකු සේ රවීන්ද්‍ර ගොඩ නංවා ගත් ප්‍රතිරූපයට අභියෝග කරන කිසිවකුත් නොමැති තරම්. එසේ වුව ද සිනමා අදියුරුකමකට හෝ සිනමා නිපැයුමකට රවීන්ද්‍ර නොපැමිණීම විද්වත් රසික හා විචාරක සාතිශය බහුතරය අනුමත කරන්නේ නැහැ.

දස වසරකට පෙර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය රවීන්ද්‍ර වෙත දර්ශන සූරී සම්මාන ආචාර්ය උපාධියක් පිරිනැමුවේ දෙකරුණක් සිහිගන්වමින්. පළමුවැන්න මේ නිසා රවීන්ද්‍රගේ රූපණය අගනේ ය යන්නට ඉහළ ම තක්සේරුවක් ලැබීම. දෙවැන්න රවීන්ද්‍රගේ රූපණ විශිෂ්ටත්වයට ගරු සරු දැක්වීමෙන් සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ අගය තවදුරටත් තහවුරු වීම.

සිනමාව මුල්කර ගත් රූපණවේදියකු සේ රවීන්ද්‍ර ගොඩ නංවා ගත් ප්‍රතිරූපයට අභියෝග කරන කිසිවකුත් නොමැති තරම්. එසේ වුව ද සිනමා අදියුරුකමකට හෝ සිනමා නිපැයුමකට රවීන්ද්‍ර නොපැමිණීම විද්වත් රසික හා විචාරක සාතිශය බහුතරය අනුමත කරන්නේ නැහැ. ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හා ශ්‍රී ලංකා නළු නිළි සංගමයේ සභාපතිවරයා ලෙස ඔහු කළ මෙහෙය රසික හා විචාරක පාර්ශ්ව සලකා බලන්නේ ඉඳහිට. වේදිකා නාට්‍ය හා රූපවාහිනිය සමග ද ඔහු පවත්වාගෙන එන්නේ රූපණ සබඳතා පමණයි. ඔහු මෙසේ රූපණයෙන් පරිබාහිර කාර්යයක් කරා නොඑළැඹෙන්නේ නොහැකියාවක් නිසා නොවන බව පැහැලි වන්නක්. එබඳු පිවිසුම් ඔස්සේ පාරප්‍රාප්ත වීමේ අභිලාසයෙන් යුතු වූවන්ට ඉඩදී තමාගේ සමත්කම පමණක් වඩවාගෙන දවසැරීම ඔහුගේ මනාපය බවයි පෙනී යන්නේ. විද්වත් රසික ප්‍රජාව හා විචාරක පිරිස රවීන්ද්‍රගේ මේ තීන්දුව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු වනවා.



# රූපණයේ පාසලක්

**සමන්තිකා ප්‍රියදර්ශනී**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජනසන්නිවේදන අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

සූර්යාගේ දීප්තියත් ඉන්ද්‍රගේ තේජසත් එකට කැටි වූ නළු පෞරුෂයක් වේ නම් ඒ රවීන්ද්‍ර රන්දෙනිය යැයි කීම අතිශයෝක්තියක් වන්නේ නැහැ. රන්වන් පැහැයෙන් යුත් චවි වර්ණයත් හීන්දෑරි උසෙන් යුත් ප්‍රතාපවත් රූපකාය බැලූ බැල්මට නාගරික බේබි මහත්තයාගේ විලාසිතාවාදී චරිතයට සීමා වේ යැයි සිතුණත් ඔහු ආරාධනා චිත්‍රපටයේ නිළිරැජිණ මාලනී ෆොන්සේකාගේ පෙම්වතා 'සේනක හලුපිට'ගේ සිට දඩයමේ 'ජයනාත්' දක්වාත් අක්ෂරයේ 'විනිසුරු'ගේ චරිතය දක්වාත් සංකීර්ණ මනෝභාවයන් ඉදිරිපත් කිරීමට සමත් වී තිබෙනවා.

විශේෂයෙන් 'දඩයම' චිත්‍රපටයේ අවසාන දර්ශනයේ ස්වර්ණා මල්ලවආරච්චි (රත්මලී) හා රවීන්ද්‍ර රන්දෙණියගේ (ජයනාත්) රංගනයේ උද්වේකර බව ප්‍රේක්ෂක මනස මොහොතකට ගල් ගැස්සීමට සමත්. වේගයෙන් රථය පදවාගෙන යන ජයනාත්ගේ මෝටර් රථයට රත්මලී පොල්ලකින් පහර දෙනවා. ජයනාත් ලේ වැකුණු මුහුණේ භාව රංගනයේදී චරිතයකට ආවේෂණය තාත්වික රංගනයකට කොතරම් මඟපාදන්නේ ද හා එහිදී කොතරම් කැපකිරීමක් කිරීමට සුදානම් ද යන්නට සාක්ෂියක්.

ගෝඩ් කිං (මොග්ගල්ලාන), සිරිපාල සහ රන්මැණිකා (සිරිපාල), දෙවැනි ගමන (ලාල්), මායා (ආනන්ද), දුහුළු මලක් (රොහාන්), එක්ටැම්ගේ (සරත්), මංගල තෑග්ග (නිහාල්), සෙයිලම (රතු මහත්තයා), පොඩි මල්ලී (සිරිපාල රත්නසිංහ), බවදුක (මුහන්දිරම්), සිරිමැදුර (සම්පත්), ගුරුගෙදර (අර්ජුන), සුරබිදෙන (කීර්ති), යශෝමා (චන්න), වීරපුරන් අප්පු (පුරන්අප්පු), අනන්ත රාත්‍රිය (සුවිසල්), අක්ෂරය (විනසුරු) හා ගාඩි (ඇහැලේපොළ අධිකාරම්) චිත්‍රපට තෙක් වූ චරිතවලින් ප්‍රකට කරන්නේ චරිතයක් ජීවමාන කරන්නට ඔහුට ඇති රූපණයේ දක්ෂතාව.

මෙරට සිනමා කර්මාන්තයට ජාතික ප්‍රතිපත්තියක් මෙන් ම රංගන පාසලක් අතිශයෙන් ම අවශ්‍ය බව ඔහුගේ සිනමා දිවියේ සංධිස්ථාන පිරික්සීමේදී පැහැදිලි ව මතු කරන්නක්. රංගන කුසලතාව ආශාව, කැපකිරීම, නිරීක්ෂණය හා ජීවන අත්දැකීම් මත ප්‍රකට වන්නක් වුවත් අධ්‍යයනය හා පුහුණුව මත එය සාධනය වන්නක් බව ඔහු තදින් ම විශ්වාස කළ බව පෙනෙනවා. සුකුමාල සරල පෙම්වතාගේ සිට ගැඹුරු සංකීර්ණ මනොභාවයන්ගෙන් චරිතවලට ආවේෂ වන්නේත් එම චරිත ඔස්සේ සැබෑ ජීවිතයේ රවීන්ද්‍ර හමු නොවන්නේත් මේ නිසා. මුහුණ, සිරුර මෙන් ම දෙබස් උච්චාරණය මතු කරන්නේ ඒ ඒ චරිතවලට ම ආවේණික වූ ශෛලියක්. ජයනාත්, අබ්බඩා, රතු මහත්තයා, විනිසුරු මෙන් ම ඇහැලේපොළ චරිතවල රවීන්ද්‍ර රන්දෙණියට ම ආවේණික රංග රීතියක් මතුකර ගන්නවා. හුදු ජනප්‍රියත්වය හඹා නොයා වීරයා මෙන් ම ප්‍රතිවීරයාගේ චරිතය රූපණයේ නොනිත් ආශාවක් ඔහුට තිබූ බව පෙනෙන්නක්. ලාංකික සිනමාවේ ස්ත්‍රීන්ගේ වෛරයට ලක් වූ චරිත (මායා/ දඩයම/ සිරිමැදුර/අනන්ත රාත්‍රිය/ අක්ෂරය ආදී) රාශියක් ඔහු සතු වනවා.

නෛතික නොවන ක්‍රියාවලියක් මත වාරණය කරන්නට උත්සහ කරන ලද, අවසානයේ නෛතික ක්‍රමවේදයකින් තහනම් කරන ලද ලාංකික චිත්‍රපටයක් වන 2006 වර්ෂයේ රැගුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් වූ අශෝක හඳගමගේ 'අක්ෂරය' *(A Letter of Fire)* චිත්‍රපටය දක්වන්නට පුළුවන්. චිත්‍රපටයක් යනු අඳුරු, අපැහැදිලි රූප පෙළක් නොවෙයි. එය සකලවිධ සම්භාව්‍ය කලාවෙන් අනුෂාංගික වශයෙන් එක්වුණු කලා භාවිතයක්. එහි සංගීතයක්, රූප රචනයක්, අසීරු රංගනයක්, නාට්‍යමය අවස්ථා රැගත් සිද්ධි ගලනයක්, ළයක් (Tempo), රූප සමෝධානයක්, සංස්කරණයක් තිබෙනවා. එහෙත් මේ කිසිදෙයක් නැති අඳුරු අපැහැදිලි රූප පෙළක් දැක 'අක්ෂරය' නැරඹුවේ යැයි බොහෝ දෙනා පාරම්බානවා. 'අක්ෂරය' තහනම රවීන්ද්‍රගේ සිනමා රංගනයේ සුවිශේෂ කඩයිමක් ප්‍රේක්ෂකයන්ට අහිමි වීමක්.

අධිකරණයේ විනිසුරු භූමිකාවේ ප්‍රතාපවත් පෞරුෂය, තම දියණිය හා ව්‍යභිචාරී හැසිරීමෙන් ඇතිවන වරදකාරී බවත් විවාහය හා පීතෘත්වයේ මහිමයත් අතර වන ගූඪ චෛතසිකයේ දෝලනය වන හැඟීම් සමුදාය නිරූපණයෙහි ලා රවීන්ද රන්දෙනිය නම් මහා රංගධරයා දක්වන ලද ප්‍රතිභාව අමතක කරන්නට බැහැ. රවින්ද්‍ර රනිදෙනිය තරුවක්. ඔහු රූපණයේ පාසලක්. තමන්ට ම ආවේණික රංග වින්‍යාසයක් සහිත ශ්‍රේෂ්ඨ රංගධරයකු වන රවින්ද්‍ර රනිදෙනිය සිනමාවේ ගෞරවනීය ප්‍රාඥයෙක්.

# ක්ලික් කිරීමට පෙර සිතා බැලීම

**ටී. එම්. ජී. චන්ද්‍රසේකර**

විවිධ සමාජ මාධ්‍ය වේදිකා (Social Media) හා වට්ස්ඇප් (WhatsApp) ඇතුළු සන්නිවේදන ජාලා උපයෝගි කරගනිමින් සංසරණය වන දැන්වීම් පෝස්ට්වලින් (Post) පුද්ගල දත්ත, මූල්‍යමය තොරතුරු ලබා ගනිමින් සිදුකෙරෙන සයිබර් වංචා මේ දිනවල බහුල ව දක්නට ලැබෙන බව ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT) මාධ්‍ය ඔස්සේ අනාවරණය කර තිබුණා. ඒ අනුව ඔවුන් මහජනතාවගෙන් ඉල්ලා සිටියේ විවිධ බැංකු, වාණිජ ආයතන, අන්තර්ජාතික ආයතන නාම භාවිත කරමින් පරිත්‍යාග, මුදල් තෑගි, දිනුම් වාසනා, අධික ලාබදායී භාණ්ඩ මාර්ගගත (online) ක්‍රමයට ලබාදීමටත් රැකිරක්ෂා ලබාදීමටත් ලියාපදිංචි වන ලෙස දන්වමින් එවන ව්‍යාජ පණිවුඩවලින් ප්‍රවේසම් වන ලෙස.

අනුකාරක (Fake web) වෙබ් අඩවි, සමාජ මාධ්‍ය වේදිකා, කෙටි පණිවුඩ (SMS), වට්ස්ඇප් ආදිය ඔස්සේ එවන පණිවුඩවලින් මේ සයිබර් ජාවාරම්කරුවන් උත්සාහ දරනු ඇත්තේ ලබාදෙන සබැඳි (links) වෙත පිවිසීමෙන් ඊට සම්බන්ධ වන පුද්ගලයන්ගේ පරිගණක, ජංගම දුරකතනවල දත්ත සොරා ගැනීමෙන් විවිධ අපචාර සඳහා මෙන් ම මුදල් වංචා සිදු කිරීමට. මෙවැනි අපරාධ මෑත කාලයේ වැඩිවෙමින් පවතින අතර ම ඊට ගොදුරුවන්නන්ගේ සංඛ්‍යාව ද වැඩිවෙමින් පවතින බවයි ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය අනාවරණය කරන්නේ.

වට්ස්ඇප් ආශ්‍රිත වංචාවලින් ගෝලීය වශයෙන් සිදුවන පාඩුව 2025 වසර වන විට ඩොලර් බිලියන 1.5 ඉක්මවිය හැකි බව VPNRanks සහ ClearVPN සේවා ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ අනුව පරිශීලකයන් මානසික ව සහ මූල්‍යමය වශයෙන් සූරාකෑම සඳහා වන වංචනිකයන්ගේ ක්‍රියාකාරකම් වර්ධනය වෙමින් පවතින අතර 2025 වසර වන විට එවැනි සිද්ධි 108,000 දක්වා වැඩි විය හැකි වනු ඇති බවටයි අපේක්ෂා කෙරෙන්නේ.

ලොව සමාජ මාධ්‍ය ජාලා අතර තෙවැනි ස්ථානයට පත් ව ඇති 'වට්ස්ඇප්' යනු ලොව බිලියන 02කට අධික පරිශීලකයන් විසින් භාවිත කරනු ලබන ජනප්‍රිය ආරක්ෂිත සන්නිවේදන යෙදුමක්. ෆේස්බුක් (Facebook) සහ යූ ටියුබ් (YouTube) සඳහා එහි හිමි ව ඇත්තේ පළමු සහ දෙවැනි තැන. ඒ අතර වට්ස්ඇප් ආරක්ෂිත සමාජ මාධ්‍ය ජාලයක් ලෙස සැලකෙන්නේ එහි End-to-End Encryption (E2EE) සංකේතාංකන භාවිතය නිසා යවන්නාට සහ ලබන්නාට පමණක් පණිවිඩ කියවිය හැකි බව සහතික කරන නිසා. End-to-End සංකේතනයෙන් වට්ස්ඇප්හි බෙදා ගන්නා සියලු පණිවුඩ, ඇමතුම්, ඡායාරූප සහ වීඩියෝ සංකේතනය කර තිබෙනවා. මෙයින් අදහස් කරන්නේ වට්ස්ඇප් සේවාදායකයන්ට පවා ඔබගේ සංවාදවල අන්තර්ගතය කියවීමට හෝ ගබඩා කිරීමට නොහැකි බව. මෙහි සිග්නල් ප්‍රොටෝකෝලය වට්ස්ඇප්, ෆේස්බුක්, මැසෙන්ජර් (Messenger) සහ ස්කයිප් (Skype) වැනි ජනප්‍රිය යෙදුම්වලට ඒකාබද්ධ කර ඇති අතර මේ වේදිකාවලදී පරිශීලකයන්ගේ සන්නිවේදනය ආරක්ෂා කිරීම සඳහා මූලික සංකේතාංකන තාක්ෂණය ලබා දෙනවා. එය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා පරිශීලකයන්ට වට්ස්ඇප් විසින් හඳුන්වා දෙනු ලැබ ඇත්තේ ද්වි-පියවර (2FA) සත්‍යාපනය වැනි ක්‍රමෝපාය. එම ගිණුම් ප්‍රවේශය සඳහා රහස්‍ය අංකයක් (PIN) හඳුන්වා දීමෙන් අමතර ආරක්ෂිත ආරක්ෂිත රැකවරණක් ද ලැබීම සුවිශේෂ කරුණක්.

එහෙත් ගෝලීය වශයෙන් බලපෑමක් ඇති කරමින් තිබෙන වට්ස්ඇප් වංචාවලදී පුද්ගලික ආරක්ෂාව, මූල්‍ය ආරක්ෂාව සහ ඩිජිටල් සන්නිවේදනය කෙරෙහි ඇතිකරන බලපෑම මහජන විශ්වාසය කෙරෙහි ද බලපා තිබීම අවධානයට ලක් විය යුතු කරුණක්. තතුබෑම් සහ අනන්‍යතා සොරකම් (phishing and scamming) ඇතුළු සයිබර් වංචා මූල්‍ය පාඩුවලට තුඩු දෙන අතර Apps ඔස්සේ පැතිරෙන වැරදි තොරතුරු සෞඛ්‍යය සහ දේශපාලනය වැනි තීරණාත්මක කරුණු සම්බන්ධයෙන් මහජන මනසට භීතියක් ඇති කරන්නට පුළුවන්. මේ වංචා වට්ස්ඇප්හි පුළුල් භාවිතය සහ ඒ සමග සම්බන්ධ වීමට ඇති හැකියාව උපයෝගි කර ගනිමින් සයිබර් අපරාධකරුවන් එය තමන්ගේ වංචනික ක්‍රියා සඳහා පත් කරගෙන තිබෙන්නේ ප්‍රධාන ඉලක්කයක් බවට. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආරක්ෂක ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීමට, එවැනි වංචා හඳුනා ගැනීම සහ වළක්වා ගැනීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට රජය සහ

ඩිජිටල් වේදිකාවලට වැඩි අවධානයක් යොමුකිරීමට සිදු ව තිබෙනවා.

මෑතකාලීන ව ශ්‍රී ලංකාවේ ද වට්ස්ඇප් ආශ්‍රිත වංචාවල වර්ධනයක් දක්නට පුළුවන්. (2024 මැද භාගය වන විට මෙරට ජංගම දුරකතන ග්‍රාහකත්වය මිලියන 23.3ක් පමණ වන අතර එය සමස්ත ජනගහනයට සමාන බව සඳහන්) බොහෝ සිදුවීම්වලට පාදක වී ඇත්තේ වංචාකරුවන් නීත්‍යානුකූල සමාගම්වල නියෝජිතයන් ලෙස පෙනී සිටීම, ව්‍යාජ රැකියා අවස්ථා සහ මූල්‍ය තෑගි ලබාදීම, රෝගීන්ට සහ අසරණවූවන්ට උදව් ඉල්ලා කරන ආයාචනා ආදිය. එමගින් නොසැලකිලිමත් පරිශීලකයන් ආකර්ෂණය කර ගැනීමෙන් ඔවුන්ගේ උගුල්වලට හසුකර ගැනෙනවා. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විටින්විට නිකුත් කරන අනතුරු ඇඟවීම්වලින් පැහැදිලි වන්නේ මේ වංචා බොහෝ විට වට්ස්ඇප් සහ වෙනත් සමාජමාධ්‍ය වේදිකා ඔස්සේ පුද්ගලයන් ඉලක්ක කරගනිමින් සිදු කෙරෙන බව. විශේෂයෙන් සංස්කෘතික හා ආගමික උත්සව ආශ්‍රිත ව ඒවා පදනම් කරගනිමින් පතුරුවා හරින පෝස්ට්වලින් වින්දිතයන් බොහෝ විට රවටා ඔවුන්ගේ සත්‍යාපන කේත (OTP) හෝ පුද්ගලික තොරතුරු වැනි සංවේදී තොරතුරු ලබා ගැනීමට වංචාකරුවන් ක්‍රියා කරනවා. ඒ, අදාළ පුද්ගලයන්ගේ ගිණුම් හෝ මූල්‍ය දත්ත වෙත ප්‍රවේශ වීමට.

සුප්‍රසිද්ධ සන්නාම සමග අනුබද්ධ බව හඟවමින් විවිධ පෝස්ට් නිකුත් කරන වංචනික වට්ස්ඇප් සහ ටෙලිග්‍රෑම් (Telegram) කණ්ඩායම් ද ඉහළ ගොස් තිබෙනවා. නිදසුනක් වශයෙන් ඇතැම් කණ්ඩායම් වංචා කරන පරිශීලකයන්ට අමතර ආදායම් අවස්ථා ලබාදෙමින් ප්‍රකට ව්‍යාපාර ලෙස ව්‍යාජ නියෝජන පොළඹවා ගන්නා අවස්ථා ද දක්නට පුළුවන්.

වට්ස්ඇප් ඉතා පහසු ආරක්ෂිත සන්නිවේදන දාමයක් වීම නිසා ම සයිබර් අපරාධකරුවන්ට වාසිදායක පසුබිමක් නිර්මාණය වී තිබීමත් අවධානයට ලක් විය යුතු කරුණක්. බොහෝවිට වට්ස්ඇප් ඔස්සේ ලැබෙන පණිවුඩයක් හේතුවෙන් සබැඳිය (link) වෙත පිවිසීමට හෝ බෙද හැරීමට (share) පරිශීලකයා දෙවරක් නොසිතන ස්වභාවක් දක්නට ලැබෙනවා. ඊට හේතු වී ඇත්තේ දන්නා හඳුනන මිතුරන් හෝ පවුලේ කෙනකු වේශයෙන් සිය උගුලට ග්‍රාහකයන් අල්ලා ගැනීමට අපරාධකරුවන් යොමුවී සිටීම. එම උගුල්වලින් මිතුරකු ලෙස උපකාර ඉල්ලා සිටින අවස්ථාවල ඔවුන්ගේ ව්‍යාජ ගිණුම්වලට මුදල් යැවීමෙන් පරිශීලකයාගේ ගිණුම්වලට ප්‍රවේශවීමට අවශ්‍ය මාවත් විවර කර ගන්නා අතර ඔවුන් ඉතා කෙටි වේලාවකදී එම ගිණුම්වල ඇති වත්කම් සොරා ගැනීමට සමත් වනවා. ඇතැම් අවස්ථාවල OTP රහස්‍ය අංක උපක්‍රමශීලී ලෙස පැහැර ගනිමින් පරිශීලකයන්ගේ වට්ස්ඇප් ගිණුම් ඔවුන්ගේ ග්‍රහණයට ගන්නා අපරාධකරුවන් සත්‍ය ලෙස ම ගිණුම් හිමියන් ලෙස පෙනී සිටිමින් ව්‍යාජ පණිවුඩ යැවීම ඇතුළු විවිධාකාරයේ අනීතික ක්‍රියාවල නිරතවනු දක්නට පුළුවන්.

මෙවැනි ව්‍යාජ පණිවුඩ පුද්ගල හානියෙන් ඔබ්බට ගමන් කරන්නේ සෞඛ්‍යයට ද බලපෑම් කරමින්. සමාජ ආතති අවුළුවාලීම එහිදී කැපී පෙනෙන්නක්. සෞඛ්‍ය අර්බුදවලදී ව්‍යාජ වෛද්‍ය උපදෙස් භීතියට හේතු විය හැකියි. නිසි ප්‍රතිකාර ප්‍රමාද කළ හැකියි. කොවිඩ් 19 වසංගතය පැවති සමයේ මෙහි ඇති භයානකකම අත්දකින්නට ලැබුණා. දේශපාලන සන්දර්භ වෙනස් කිරීම සහ ආර්ථිකය කඩාකප්පල් කිරීම පවා ඊට කළ හැකියි. දේශපාලනයේදී ව්‍යාජ තොරතුරු පතුරුවා හැරීමෙන් ප්‍රජාව අතර වැරදි වැටහීම් ඇති කළ හැකි අතර ඒවා ගැටුම් දක්වා වර්ධනය වූ අවස්ථා ද තිබෙනවා. මන්ද සත්‍යාපනය නොකළ ප්‍රචාරවලට ජනතාව ප්‍රතිචාර දක්වන නිසා. එබැවින් ව්‍යාජ පණිවිඩ යැවීමේ මේ ගෝලීය ප්‍රවණතාව පත් ව ඇත්තේ බරපතළ අභියෝගයක් බවට.

> මෑතකාලීන ව ශ්‍රී ලංකාවේ ද වට්ස්ඇප් ආශ්‍රිත වංචාවල වර්ධනයක් දක්නට පුළුවන්. 2024 මැද භාගය වන විට මෙරට ජංගම දුරකතන ග්‍රාහකත්වය මිලියන 23.3ක් පමණ වන අතර එය සමස්ත ජනගහනයට සමාන බව සඳහන්) බොහෝ සිදුවීම්වලට පාදක වී ඇත්තේ වංචාකරුවන් නීත්‍යානුකූල සමාගම්වල නියෝජිතයන් ලෙස පෙනී සිටීම, ව්‍යාජ රැකියා අවස්ථා සහ මූල්‍ය තෑගි ලබාදීම, රෝගීන්ට සහ අසරණවූවන්ට උදව් ඉල්ලා කරන ආයාචනා ආදිය.

මෙවැනි පසුබිමක විශ්වාසය සහ මහජන ආරක්ෂාව රැකගනිමින් මේ විවෘත සන්නිවේදන මාර්ග පවත්වාගෙන යන්නේ කෙසේ ද? යන්න දැනුවත්භාවය, විවේචනාත්මක චින්තනය සහ සාමූහික වගකීම අවශ්‍ය වනවා. ඊට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මහජනතාවට උපදෙස් දී ඇත්තේ අනපේක්ෂිත පණිවුඩ ලැබුණු අවස්ථාවල නිල මාර්ග හැර හෝ අදාළ පුද්ගලයන්ට ඇමතීමෙන් සත්‍යාපනය කරන ලෙස. මේ ප්‍රයත්න නොතකා ක්‍රියා කිරීම නිසා දිනපතා විවිධ වංචාවලට හසුවූවන්ගේ පැමිණිලි සංඛ්‍යාව අඛණ්ඩ ව ඉහළ යමින් තිබෙනවා. බොහෝදුරට වංචා පිළිබඳ දැනුවත්භාවය නොමැතිකමයි ඊට හේතුව. මේ නිසා ආරක්ෂිතබව තහවුරු කරගැනීම, තමන් නොදන්නා සබැඳි මත ක්ලික් කිරීමෙන් වැළකී සිටීම, පණිවුඩයක් හදිසි හෝ අසාමාන්‍ය යැයි හැඟේ නම් වට්ස්ඇප් පණිවුඩය යොමු කළ පුද්ගලයා සෘජු ව ම ඇමතීම මෙන් ම මුරපද, බැංකු විස්තර හෝ සත්‍යාපන කේත වැනි සංවේදී තොරතුරු කිසි විටෙක වට්ස්ඇප් ඔස්සේ බෙදා නොගැනීම, Two-Step Verification වැනි ආරක්ෂණ ක්‍රම සක්‍රිය කිරීම, සැක සහිත ගිණුම් පිළිබඳ වාර්තා (report) කිරීම වැනි සරල ආරක්ෂණ ක්‍රමවලින් තමන්ට එල්ලවිය හැකි සයිබර් තර්ජනවලින් වැළකී සිටීමටත් වඩාත් ආරක්ෂාකාරී සන්නිවේදන වේදිකාව වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීමටත් හැකි වනු ඇති.



# අයිතීන් සුරකිමු ඒඩ්ස් නවතමු

කාංචනා සිරිවර්ධන

ලෝක ඒඩ්ස් දිනය යෙදී තිබෙන්නේ දෙසැම්බර් 01 දිනට. 2024 වර්ෂය සඳහා ලෝක ඒඩ්ස් දිනයේ තේමාව වුණේ 'අයිතීන් සුරකිමු-ඒඩ්ස් නවතමු' යන්න. එම තේමාවෙන් අදහස් කෙරෙන්නේ 2030 වසර වන විට ඒඩ්ස් තුරන් කිරීම සඳහා යන ඉලක්කගත ගමනේදී සෑම පුද්ගලයකුට ම ඔවුන්ට අවශ්‍ය වූ විට, HIV තත්ත්වය හඳුනා ගැනීමටත් ප්‍රතිකාර ලබාගැනීමටත් එය වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳ දැනුවත් වීමටත් සෞඛ්‍ය සේවා අවශ්‍ය වූ විට ඕනෑ ම විටෙක මූල්‍යමය බාධාවකින් තොර ව ලබාගැනීමටත් තිබෙන අයිතිය තහවුරු කරගැනීම.

2030 වසර වන විට ඒඩ්ස් රෝගී තත්ත්වය ප්‍රජා සෞඛ්‍ය ගැටලුවක් ලෙස මෙරටින් තුරන් කිරීම ශ්‍රී ලංකාවේ ඒඩ්ස් සම්බන්ධයෙන් ඇති එක් ප්‍රධාන ඉලක්කයක්. මෙරට පළමු HIV ආසාදිත රෝගියා හඳුනාගෙන තිබෙන්නේ 1987 වර්ෂයේ. එතැන් සිට නව රෝගීන් හඳුනාගැනීමේ ප්‍රවණතාව ක්‍රමක්‍රමයෙන් වැඩි වෙමින් පවතින බවයි ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂ, ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය වින්ද්‍යා කුමාරපේලි පවසන්නේ. අදහස් දක්වන ඇය: "2023 වසර වන විට ශ්‍රී ලංකාවේ HIV ආසාදනය වූ පුද්ගලයන් 5000ක් පමණ සොයාගෙන තිබෙනවා. එහෙත් ලියාපදිංචි වී ප්‍රතිකාර ලබන්නේ රෝගීන් 3500ක පමණ සංඛ්‍යාවක්. 2020, 2021 වසරවල වාර්තා වුණේ වසරකට නව රෝගීන් 200-300ත් අතර සංඛ්‍යාවක්. එහෙත් 2022, 2023 වසරවල එම තත්ත්වය දෙගුණයක් වී තිබෙනවා. 2023 වසරේ නව HIV වෛරස ආසාදිත රෝගීන් 694ක් මෙරටින් වාර්තා වුණා. ආසාදිත සංඛ්‍යාව වේගයෙන් වැඩිවෙමින් පවතින බව මේ අනුව පෙනී ගියත් ශ්‍රී ලංකාව අඩු අවදානම් රටක් විදිහටයි සැලකෙන්නේ. ජනතාව අතර අවදානම පවතින්නේ 0.1%කටත් වඩා අඩුවෙන්. අප හොඳින් මතක තබාගත යුතුයි පුද්ගලයකු ඒඩ්ස් තත්ත්වයට ගොදුරු වන්නේ HIV වෛරස් රෝගය ආසාදනය වී කාලයක් ගත වූ පසුව බව." බොහෝ දෙනෙක් HIV සහ ඒඩ්ස් යන්න නිවැරදි ව වටහාගෙන නැහැ. නවීන ප්‍රතිකාර ක්‍රම නිසාත් HIV ආසාදිතයන් කලින් හඳුනාගැනීමේ තත්ත්වය නිසාත් එතරම් ඒඩ්ස් රෝගීන් දක්නට නොමැති බවයි විශේෂඥ වෛද්‍ය වින්ද්‍යා කුමාරපේලි සඳහන් කරන්නේ.

ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන ව්‍යාපාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියා කරනවා. ඒ, නිවාරණ අංශය සහ කලින් හඳුනාගැනීම, පරීක්ෂා කිරීම සහ රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ අංශය යනුවෙන්. වැඩි අවදානම් පුද්ගලයන් වෙනුවෙන් වැඩසටහන් රැසක් මේ යටතේ ක්‍රියාත්මක වනවා. මෙහිදී පිරිමින් සමග ලිංගික ව හැසිරෙන පිරිමින්, සංක්‍රාන්ති ලිංගික තත්ත්වයේ සිටින්නන්, ලිංගික ශ්‍රමිකයන් වැනි කණ්ඩායම් වැඩි අවදානම් කණ්ඩායම් ලෙසයි හඳුනාගෙන තිබෙන්නේ. ඔවුන් ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කරන වැඩසටහන්වලදී රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන ද ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන ව්‍යාපාරය සමග අත්වැල් බැඳගෙන සිටීම විශේෂත්වයක්.

නිවාරණ අංශය යටතේ පොදුවේ දැනුවත් කිරීම් සිදුවන්නේ ආරක්ෂිත ලිංගික සබඳතා පැවැත්වීම පිළිබඳ ව. එසේ ම කොන්ඩම් බෙදාහැරීම, පූර්ව ආරක්ෂිත ඖෂධ සහ පසු ආරක්ෂිත ඖෂධ ලබාදීම ද මේ අංශය යටතේ සිදු වනවා. පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මාතෘ හා ළමා සායන පද්ධතිය විසින් මවගෙන් දරුවාට HIV සහ සිපිලිස් රෝගය සම්ප්‍රේෂණය වීම වැළැක්වීමට 2013 සිට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබනවා. එය සිදු වන්නේ ගර්භණී මව්වරුන්ගේ රුධිර පරීක්ෂාවෙන්. මෙරට සියලු ම ගර්භණී මව්වරුන් HIV සහ සිපිලිස් සඳහා රුධිර පරීක්ෂාවලට යොමු කෙරෙන අතර එම වෛරස් ඔවුන්ට ශරීරගත වී

**2023 වසරේ නව HIV වෛරස ආසාදිත රෝගීන් 694ක් මෙරටින් වාර්තා වුණා. ආසාදිත සංඛ්‍යාව වේගයෙන් වැඩිවෙමින් පවතින බව මේ අනුව පෙනී ගියත් ශ්‍රී ලංකාව අඩු අවදානම් රටක් විදිහටයි සැලකෙන්නේ. ජනතාව අතර අවදානම පවතින්නේ 0.1%කටත් වඩා අඩුවෙන්. අප හොඳින් මතක තබාගත යුතුයි පුද්ගලයකු ඒඩ්ස් තත්ත්වයට ගොදුරු වන්නේ HIV වෛරස් රෝගය ආසාදනය වී කාලයක් ගත වූ පසුව බව.**

තිබෙන බව පරීක්ෂණවලින් ඔප්පු වුවහොත් මවට මෙන් ම ඉපදුණු දරුවාට ද ප්‍රතිකාර ලබාදීම ආරම්භ කෙරෙනවා.

ශ්‍රී ලංකාවේ වාර්තා වන HIV ආසාදිතයන්ගෙන් වැඩි පිරිසක් පිරිමි පුද්ගලයන්. කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම වැනි දිස්ත්‍රික්කවලින් ආසාදිතයන් හඳුනා ගැනීමේ වැඩි ප්‍රවණතාවක් තිබෙනවා. 2023 වසරේ හඳුනාගත් නව රෝගින්ගෙන් 15%ක් ම වයස අවුරුදු 15-24 කාණ්ඩයට අයත් වන අතර නව තාක්ෂණය ඔස්සේ සහකරුවන් සොයාගැනීමට යෑම, නිසි ලිංගික අධ්‍යාපනයක් නොලැබීම, යම් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වැනි කාරණා තරුණ තරුණියන් අතර නව ආසාදිතයන් වැඩිවීමට බලපාන කාරණා ලෙසයි අනාවරණය කරගෙන තිබෙන්නේ. මේ හේතුවෙන් වයසට ගැළපෙන ලිංගික අධ්‍යාපනය යන මැයෙන් මේ වයස් කාණ්ඩයට අදාළ ව සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක් ව විශේෂ වැඩසටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමටයි අපේක්ෂිත.

ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ ලිංග්‍රාශිත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය විනෝ ධර්මකුලසිංහ HIV පරීක්ෂණ සම්බන්ධයෙන් අදහස් දක්වන්නේ මෙලෙස. ඔහුඃ

"HIV වෛරසය ශරීරයට ඇතුළු වී බොහෝ කාලයක් යන තුරු රෝග ලක්ෂණ පෙන්වන්නේ නැහැ. ඇතැම් විට ඒ සඳහා අවුරුදු 2-10 අතර කාලයක් ගත වන්නට පුළුවන්. බොහෝ විට HIV පරීක්ෂණවලදී HIV වෛරසයට එරෙහි ව ශරීරයේ ඇති වන ප්‍රතිදේහය පරීක්ෂා කිරීම සිදු කරනවා. එහෙත් නවීන තාක්ෂණයේ දියුණුවත් සමග හැකියාව ලැබී තිබෙනවා ප්‍රතිදේහයට අමතර ව ප්‍රතිජනක හඳුනාගැනීමට."

ප්‍රතිජනකය සහ ප්‍රතිදේහය හඳුනාගැනීමේ HIV AIDS පරීක්ෂණ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි පිහිටා ඇති ලිංගාශ්‍රිත රෝග සායන 40න් ම සිදු කරගැනීමේ හැකියාව තිබෙනවා. විශේෂඥ වෛද්‍ය විනෝ ධර්මකුලසිංහ සඳහන් කරන්නේ HIV ක්ෂණික රුධිර පරික්ෂාවෙන් විනාඩි 20ක් වැනි කෙටි කාලයක් ඇතුළත එම වෛරසය ශරීරගත වී තිබෙනවාද? නැද්ද? යන කාරණය දැනගැනීමේ පරීක්ෂණ පහසුකම් දිවයිනේ සෑම ලිංගාශ්‍රිත රෝග සායනයකදී, සෑම රජයේ රෝහලකදී ලබාගත හැකි වන පරිදි කටයුතු පුළුල් කරන්නට සෞඛ්‍ය අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව. ජාතික ලිංගාශ්‍රිත රෝග හා HIV මර්දන වැඩසටහන වශයෙන් HIV Rapid test රජයේ සෑම රෝහලකට ම ලබාදී HIV පරීක්ෂණ පුළුල් කරන්නටත් පියවර ගෙන තිබෙනවා. ලිංගාශ්‍රිත රෝග සායන සහ ඒවාගේ තොරතුරු ඇතුළත් වන Know4sure.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඕනෑ ම අයකුට මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා ගන්නටත් පුළුවන්.

යම් පුද්ගලයකු HIV ප්‍රතිකාර නිසි ලෙස ලබාගන්නවානම් එම පුද්ගලයාගේ රුධිරයේ වෛරස ප්‍රමාණය නොගැනිය හැකි තරම් කුඩා ප්‍රමාණයක් ව පවතිනවානම් එම පුද්ගලයාගෙන් වෙනත් පුද්ගලයකුට HIV වෛරසය ලිංගික ව සම්ප්‍රේෂණය නොවන බව ද පරික්ෂණවලින් අනාවරණය කරගෙන තිබෙන කරුණක්.

HIV යනු පාලනය කළ හැකි රෝගී තත්ත්වයක් මෙන් ම ඒ සඳහා දියුණු ප්‍රතිකාර තිබෙනවා. HIV සමග ජීවත් වන පුද්ගලයන්ට මිහිතලය මත ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීමත් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා සියලු දෙනා එක් ව ක්‍රියා කිරීමත් කාලීන අවශ්‍යතාවක්. ඔවුන් කොන් කිරීම සහ වෙන්කොට සැලකීම නොකළ යුත්තක්.

(සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවක් ඇසුරෙන්)

# පාඨක දිශානතිය

**නිරෝෂි දොඹගහගේ**




ලොව පැරණිතම මුද්‍රිත මාධ්‍යයක් වන 'පුවත්පත' විද්‍යුත් මාධ්‍ය සහ අංකිත තාක්ෂණික මෙවලම් ඔස්සේ පරිශීලනය කෙරෙන නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය වේදිකාවලදී (Social Media Platforms) වුවත් සිය පැවැත්ම තහවුරු කරගෙන ඇත්තේ එයට ම අනන්‍ය වූ සුවිශේෂ ස්වරූපයක් නිසා බව නොරහසක්. ඒ, සාම්ප්‍රදායික කියවීමේ පුරුද්ද වෙනස් කරමින් ගුවන්විදුලිය, රූපවාහිනිය හා සමාජ මාධ්‍යවල සිරස්තල කියවීමේ වැඩසටහන් ආකෘති, මාර්ගගත (online) ලෙස වෙබ් අඩවිවලින් මෙන් ම PDF ගොනු ඔස්සේ කියවීමට අවකාශ සැලසීමෙන්. විද්‍යුත් මාධ්‍ය, නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය සඳහා වැඩසටහන් හා අන්තර්ගත නිර්මාණයට ද පුවත්පතෙන් ඉහළ දායකත්වයක් ලැබෙන බවයි ඉන් ගම්‍ය වන්නේ.

කොවිඩ් 19 වසංගතය නිසා උද්ගතවුණු සමාජමය හා ආර්ථිකමය හේතු මත පුවත්පත් මුද්‍රණය අඩාළ වීමෙන් පුවත්පත් කර්මාන්තය යම් බිඳ වැටීමකට ලක් වුණා. පුවත්පත් මාධ්‍ය සම්බන්ධයෙන් ග්‍රාහක දර්ශක (Ratings) ලබාගැනීමේ ක්‍රියාවලිය බිඳ වැටීමට ද මේ තත්ත්වය හේතුවක්. පුවත්පත් කර්මාන්තයේ වත්මන් හැඩරුව කෙබඳු ස්ථරයක ස්ථානගත වී පවතීද යන්න අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවක් වන්නේ ඒ අනුව.

නොබෝද එළිදක්වුණු මෙරට පුවත්පත් පාඨකත්වය පිළිබඳ Print Media Readership Survey 2024 in Sri Lanka සමීක්ෂණයෙහි පර්යේෂණ වාර්තාව එහිදී ඉතා වැදගත්. ශ්‍රී ලංකා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන ලද මෙහි ප්‍රධාන අරමුණ වූයේ පුවත්පත් කර්මාන්තයේ වත්මන් තත්ත්වය පිළිබඳ අවබෝධ කර ගැනීම සහ කර්මාන්තය තවදුරටත් නගා සිටුවීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද යන්න සොයා බැලීම බව එම විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ගයාන් මදුසංඛ පවසනවා.

සමීක්ෂණය සඳහා සහයෝගය ලබා ගැනිමට ජනසන්නිවේදනය හා ජනමාධ්‍ය යනාදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අධ්‍යයන අංශ පවතින විශ්වවිද්‍යාල සඳහා විවෘත ආරාධනයක් සිදුකර ඇති අතර ඒ අනුව කැලණිය හා යාපනය විශ්වවිද්‍යාල මෙන් ම කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ විද්වතුන් හා විද්‍යාර්ථීන් මේ සමීක්ෂණයට එක් ව තිබෙනවා.

මෙහිදී පුවත්පත් මුද්‍රණය කර බෙදා හැරීම සහ ඒවායේ පාඨකත්වය යනු ක්ෂේත්‍ර දෙකක් බව අවබෝධ කර ගැනීම ඉතා වැදගත්. පුවත්පත් මුද්‍රණය කරන සංඛ්‍යාව මත පදනම් ව පාඨකත්වය පිළිබඳ තීරණ ගන්නට බැහැ. ඒ, පුවත්පතක එක් පිටපතක් එක් පාඨකයකුට පමණක් සීමා නොවන නිසා. පාඨකයන් අතර හුවමාරු වන පුවත්පතක පිටපත් සංඛ්‍යාව වැඩි නම් එය දියුණු පුවත්පත් කර්මාන්තයක ලක්ෂණයක් බවයි කථිකාචාර්ය ගයාන් මධුසංඛ පවසන්නේ. එනම් මුද්‍රණ පිරිවැය වඩා ඵලදායී වීමට නම් එක් පිටපතක් වැඩි පාඨක පිරිසක් අතර හුවමාරු විය යුතු වනවා.

> නොබෝදා එළිදැක්වුණු මෙරට පුවත්පත් පාඨකත්වය පිළිබඳ Print Media Readership Survey 2024 in Sri Lanka සමීක්ෂණයෙහි පර්යේෂණ වාර්තාව එහිදී ඉතා වැදගත්. ශ්‍රී ලංකා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන ලද මෙහි ප්‍රධාන අරමුණ වූයේ පුවත්පත් කර්මාන්තයේ වත්මන් තත්ත්වය පිළිබඳ අවබෝධ කර ගැනීම සහ කර්මාන්තය තවදුරටත් නගා සිටුවීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද යන්න සොයා බැලීම.

මේ සමීක්ෂණයට දත්ත දායකයන් ලෙස සහභාගි කරගෙන තිබෙන්නේ ජාති, ආගම්, නාගරික, අර්ධ නාගරික, වතුකරය යන විවිධත්ව නියෝජනය වන පරිදි දිවයිනේ සියලු ම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරා ගත් නියැදියක්. විශේෂයෙන් කොළඹ, කළුතර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක තුනෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දක්වා ම නියැදිය විසුරුවා හැර තිබෙනවා. පුවත්පත් කියවන 2000ක නියැදිය තෝරා ගැනීමට පුද්ගලයන් 15,989ක පමණ පිරිසක් පසු කරගෙන යාමට සිදුවීමත් සුවිශේෂ කරුණක්. ඒ අනුව මෙරට පුවත්පත් පාඨකත්වය සමස්ත ජනගහනයෙන් 12.5%ක් බවයි හෙළිදරව් වී ඇත්තේ. එසේවුවත් සාම්ප්‍රදායික ලෙස මුද්‍රිත පිටපත කියවීමෙන් තොර ව අංකිත තාක්ෂණයෙහි ව්‍යාප්තිය පාදක ව මාර්ගගත තාක්ෂණය ඔස්සේ ගොඩනැගුණු පුවත්පත් පාඨකත්වයක් පවතින බවත් මෙහිදී නොසලකා හැරිය නොහැකි කරුණක්.

සමීක්ෂණයට දත්ත දායකයන් ලෙස සහභාගිත්වය ලබාදුන් 2000ක කණ්ඩායමෙන් 52%ක් කාන්තාවන් වන අතර 48%ක් පිරිමින්. වයස් කාණ්ඩ

**ඩිජිටල් මාධ්‍ය පරිශීලනය නිසා පසුගිය වසර 05හේ පුවත්පත් කියවීම සම්පූර්ණයෙන් ම නවතා දැමූ පිරිස 2%ක්. 49%ක පිරිසකගේ පුවත්පත් කියවීම අඩු වීම සඳහා මේ තත්ත්වය හේතු වී තිබෙන අතර 35%ක පිරිසක් තම පුවත්පත් කියවීමේ පුරුද්ද එලෙස ම පවත්වාගෙන යන බවත් සඳහන්.**



අනුව වයස අවුරුදු 18ට අඩු 2%ක්, 18-24ත් අතර 9%ක්, 25-34ත් අතර 9%ක්, 35-44ත් අතර 21%ක්, 45-54ත් අතර 32%ක්, අවුරුදු 55ට වැඩි 27%ක් එම නියැදියට අයත්.

සමස්තයක් ලෙස මුද්‍රිත මාධ්‍ය පරිහරණය ගත් විට පෙනී යන්නේ 77%ක් පුවත්පත් පරිහරණය කරන අතර 20%ක් සඟරා ද 2%ක් පුවත්පත් අතිරේක (ටැබ්ලොයිඩ්) ද 1%ක් වෙනත් මුද්‍රිත මාධ්‍ය ද පරිහරණය කරන බව. ඒ අනුව සමස්ත මුද්‍රිත මාධ්‍ය කර්මාන්ත පාඨකත්වයෙන් වැඩි ප්‍රතිශතයක් අත්කරගෙන තිබෙන්නේ පුවත්පත්. පුවත්පත් මිල දී ගැනීමට පෙළඹෙන කාරණා ලෙස වැඩි ප්‍රතිශතයක් (44%) දක්වා ඇති හේතුව ප්‍රවෘත්තිවල ගුණාත්මකභාවය හා විශ්වසනීයත්වය. දැන්වීම් වෙනුවෙන් පුවත්පත් මිල දී ගන්නා පිරිස 2%ක්.

දේශීය මෙන් ම විදේශීය කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් වීමට දත්ත දායකයන්ගෙන් 73%ක් දිනපතා පුවත්පත් මිල දී ගෙන තිබෙනවා. ඒ සඳහා සතිඅන්ත පුවත්පත් මිල දී ගෙන තිබෙන්නේ 71%ක පිරිසක්. 2000ක දත්ත දායකයන්ගෙන් 1470ක් දේශීය ප්‍රවෘත්ති දැනගැනීම වෙනුවෙන් පුවත්පත් කියවන අතර 148ක් විනෝදාස්වාද පුවත් වෙනුවෙන් හා 120ක් විදේශීය ප්‍රවෘත්ති දැනගැනීම වෙනුවෙන් පුවත්පත් කියවන බව සමීක්ෂණයෙන් හෙළි වී තිබෙනවා.

68%ක පිරිසක් පුවත්පත් අතිරේක කියවීමට ප්‍රිය කරන බව හෙළි වීම පුවත්පත් කර්මාන්තය නගා සිටුවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධ කර ගැනීමට පිටුවහලක්. එම අතිරේක අතරින් ජීවන රටා (Lifestyle) පිළිබඳ අතිරේක සඳහා කැමැත්ත පළකර ඇති පිරිස 823ක්. විනෝදාස්වාද (Entertainment) සඳහා 231ක් ද ව්‍යාපාර සහ ආර්ථික (Business & Econ) සඳහා 230ක් ද ක්‍රීඩා සඳහා 122ක් සහ සෞඛ්‍ය සඳහා 102ක් ද යනාදී ලෙසින් පුවත්පත් සමග නිකුත් කරන අතිරේක කෙරෙහි පාඨක කැමැත්ත පළකර තිබෙනවා. ඒ අනුව 60%කට ආසන්න සංඛ්‍යාවක් පුවත්පත් මිල දී ගැනීමේදී මේ අතිරේකවල අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වන බව හෙළිදරව් වීම සුවිශේෂ කරුණක්.

ඩිජිටල් මාධ්‍ය පරිශීලනය නිසා පසුගිය වසර 05හේ පුවත්පත් කියවීම සම්පූර්ණයෙන් ම නවතා දැමූ පිරිස 2%ක්. 49%ක පිරිසකගේ පුවත්පත් කියවීම අඩු වීම සඳහා මේ තත්ත්වය හේතු වී තිබෙන අතර 35%ක පිරිසක් තම පුවත්පත් කියවීමේ පුරුද්ද එලෙස ම පවත්වාගෙන යන බවත් සඳහන්.

මේ සමීක්ෂණ දත්ත පාදක ව පුවත්පත් කර්මාන්තය නගා සිටුවීම සඳහා සාධනීය පියවර ගතහොත් දැනට පවත්නා පුවත්පත් පාඨකත්ව ප්‍රතිශතය ඉදිරි වර්ෂ කිහිපයේ 20%ක් දක්වා ඉහළ නැංවිය හැකි වනු ඇති බවයි කථිකාචාර්ය ගයාන් මදුසංඛගේ මතය. රූපවාහිනියෙන් හා සමාජ මාධ්‍ය ඔස්සේ නරඹන ප්‍රවෘත්ති තහවුරු කරගැනීම සඳහා මූලාශ්‍රයක් ලෙස තවදුරටත් මෙරට ජනතාව පුවත්පත භාවිත කරන බව හෙළි වීම නොසලකා හරින්නට බැහැ. එහිදී රූපවාහිනී නාළිකා බොහෝවිට දේශපාලන මතවාද සඳහා පක්ෂග්‍රාහී වන බව දක්වන දත්ත දායකයන් පුවත්පත එසේ නොවී ස්වාධීන කර්තෘ මණ්ඩලයක් වශයෙන් ක්‍රියා කරන බවට විශ්වාසය පළ කිරීම මෙරට පුරවැසියාගේ මුද්‍රිත මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ වෙනස් පැතිකඩක් ද හෙළිදරව් කරනවා.

පුවත්පත්වල මිල ඉහළ යාම, මිලදී ගැනීම සඳහා අමතර පරිශ්‍රමයක් දැරීමට සිදුවීම යනාදී කරුණු ද පුවත්පත්වලින් පාඨකයා ඈත්වීම කෙරෙහි බලපා තිබෙනවා. ඇතැම් දත්ත දායකයන් පවසා ඇත්තේ පුවත්පත් නිවසට ම බෙදා හැරෙන ක්‍රමවේදයක් තිබේනම් ඒවා කියවීමට කැමති බව. මෙවැනි හෙළිදරව් කිරීම් ඔස්සේ මෙරට පුවත්පත් බෙදා හැරීමේ ක්‍රමවේදය කෙලෙස යාවත්කාලීන විය යුතු ද? යන්න පිළිබඳ අවබෝධයක් පුවත්පත් කර්මාන්තයේ නියැළෙන්නන්ට ලබා ගන්නට පුළුවන්. ග්‍රාහක දර්ශකය මැන බැලීම සඳහාත් මේ සමීක්ෂණ දත්ත වැදගත්.

මෙරට මුද්‍රිත මාධ්‍ය නගා සිටුවීමට මෙන් ම මෙවැනි පර්යේෂණවලින් හෙළි වන සංඛ්‍යාලේඛන පුවත්පත් පාඨකත්වය ඉහළ නැංවීමේ කාර්යයට සාධනීය අයුරින් දායක කර ගන්නට පුළුවන්. එහිදී වඩාත් වැදගත් වන්නේ පර්යේෂණ කාර්යයෙන් පිළිබිඹු කරන ජනමතය ගැඹුරින් විශ්ලේෂණය කර හඳුනා ගැනීම. එය ඉදිරියේදී මෙරට මුද්‍රිත මාධ්‍යයේ දිශානතිය වෙනස් කිරීමට හේතුවනු ඇති.



# සාහිත්‍යයට නාලිකා ගැළපුම

**නුවන් කුමාර කටුගම්පල**

ගතවෙමින් තිබෙන්නේ ජනතාව පොතපතින් දුරස් වී ඇතැයි ද ඔවුන් එයට ළං කළ යුතු යැයි ද දේශන පැවැත්වීම, ලේඛන පළ කිරීම ඉක්මවා, සාහිත්‍යයට ජනාකර්ෂණය ලබා දෙන ප්‍රායෝගික වැඩපිළිවෙළක අවශ්‍යතාව තහවුරු කළ යුතු කාලයක්.

'සාහිත්‍යය' කියූ සැණින් සිහි වන්නේ මුද්‍රිත පොත. ඩිජිටල් පොතක් කියූ විට එය තවමත් ඇතැමුන්ට ආගන්තුක වූවක්. එහෙත් 'ඩිජිටල්' යන්නෙන් අත්මිදිය හැකි කිසිවක් නොමැති පසුබිමක ශ්‍රව්‍ය-දෘශ්‍ය සහ අංකිත මාධ්‍ය අවකාශයේ සාහිත්‍යය නියෝජනය වීම ප්‍රමාණවත් ද?

අකුරට, පෙළ (Text)ට හෝ පරිච්ඡේදයට හෝ පොතට සීමා වන්නක් නොවෙයි සාහිත්‍යය. එය ජීවිතයේ පිළිබිඹුව සහ ප්‍රකාශනය නිසා එක් මාධ්‍යයක නියෝජනයට සීමා නොවී සෑම මාධ්‍යයක ම බහුල ව සාකච්ඡාවට බඳුන් විය යුත්තක්. සමාජය සාහිත්‍ය වැළඳ ගැනීම දක්වා ප්‍රචලිත වන්නේ එවිට.

මානව විද්‍යාඥයන්ට අනුව මිනිසා වචනවලින් අදහස් සහ හැඟීම් හුවමාරුව පටන්ගෙන වසර ලක්ෂයකටත් අධික බව චරණ රූපවාහිනියේ හිටපු ජ්‍යෙෂ්ඨ වැඩසටහන් කළමනාකරු ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී වජිර ජයවර්ධන පවසනවා. මුද්‍රිත යුගයට පෙර සිට රූප සංකේත භාවිතයෙන් මානව අදහස් හුවමාරුව ඇරඹුණු යුගයේ පටන් ම මිනිසාගේ නිර්මාණශීලී ගුණය සිය ලේඛන ඔස්සේ ප්‍රකට කළ බවත් අද විද්‍යුත් සහ ඩිජිටල් මාධ්‍ය අවකාශයේ සමස්ත නියෝජනය එහි අඛණ්ඩ ගලා ඒමේ ප්‍රතිඵලයක් බවත් ඔහු ප්‍රකාශ කරනවා.

මුද්‍රණයට සීමා නොවී සාහිත්‍යය ශ්‍රව්‍ය-දෘශ්‍ය ඇතුළු සියලු නව මාධ්‍යවල සමගාමී ප්‍රවේශයක්  ලබන්නේ නම් පමණයි, සාහිත්‍ය පරිශීලනය සඳහා වන සමාජ පෙළඹුම පුළුල් ව ශක්තිමත් වන්නේ. මුද්‍රිත, විද්‍යුත් සහ නව මාධ්‍ය යන සෑම වේදිකාවක ම පූර්ණ විකාශන කාලපරාසය සහිත 'සාහිත්‍ය නාලිකා (Channels for Literature / Literature TV) ඇරඹිය යුතු ය' යන්න අපගේ යෝජනාව.

නව සිතුවිලි ජනිත කරමින් පරිකල්පන ශක්තිය වර්ධනය කිරීම, දැනුම සහ සමාජාවබෝධය වැඩි කිරීම, ශික්ෂිත සමාජයක් බිහි කිරීම, කල්පනාවේ යෙදෙන විමර්ශනශීලී පරිශීලකයකු බිහි කිරීම වැනි අපේක්ෂා ඉටු වන්නේ සාහිත්‍යයෙන්. මැවීම් කළ හැකි තරමට සහෘදයා පෝෂණය කිරීමත් අලංකාර නිර්මාණ බිහි කරන නිර්මාණකරුවන් සහ ඔවුන් කළ නිර්මාණ සමාජ ප්‍රගමනය උදෙසා දායක කරවීමත් රසාස්වාදය වඩවාලීමත් සඳහා රූපවාහිනිය ඇතුළු ශ්‍රව්‍ය-දෘශ්‍ය සමාජ මාධ්‍යයට දැක්විය හැකි දායකත්වය රූපවාහිනිය සහ ඩිජිටල් අවකාශය ඔස්සේ ලැබෙනවා ද? යන්න ගැටලුවක්.

ආපසු ගමන් නොකරන සහ තවදුරටත් ප්‍රබල ව වැඩෙන ඩිජිටල් තාක්ෂණය ගැන අප අගතිගාමී අදහසක් දැරීම අනාගතයේදී ද ලෝකය හමුවේ ශ්‍රී ලාංකිකයා පසුගාමී වීමට බලපාන බව මාධ්‍යවේදී වජිර පෙන්වා දෙන තත්ත්වයක්. ඔහු දකින ලෝක තත්ත්වය වන්නේ ඩිජිටල්කරණයෙන් අත්මිදිය නොහැකි බව. එය සාහිත්‍යයට ද පොදු කරුණක්. වර්තමානයේ ගෝලීය ව උද්ගත වූ ගැටලුවක් වන තිර කාලය (Screen time) අවම කිරීම, ඩිජිටල් උපකරණ භාවිතය නිසා හටගන්නා රෝගාබාධවලට පිළියම් යෙදීම, පුද්ගලයාගේ විවිධ ඉන්ද්‍රිය චාලක අවධිවලට අදාළ ව මුද්‍රිත පතපොතට හුරු නොවීමේ ගැටලුවට පිළිතුරු සෙවීම සංකීර්ණතා බවට පත් ව පැවතිය ද ඩිජිටල් යන්නට පක්ෂපාත විය යුතු ව පවතිනවා. ඒ සඳහා ඩිජිටල් සාක්ෂරතාවෙන් සමාජය සන්නද්ධ කළ යුතු වනවා. ඊට ද රූපවාහිනි සහ සමාජ මාධ්‍ය ම ප්‍රබල ලෙස දායක කර ගැනීමටයි සිදුවන්නේ.

වර්තමාන විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ පවා රසවින්දනයට සහ ප්‍රායෝගික හැදෑරීම්වලට පවතින්නේ අකැමැත්තක්. ඊට හේතුව ජංගම දුරකතනයේ, ටැබ් යන්ත්‍රයේ සහ ලැප්ටොප් පරිගණකයේ තිරය විසින් අසීමාන්තික ව ඔවුන්ගේ කාලය සහ අවධානය සීමා කරනු ලැබීම. කථිකාචාර්යවරුන්ගේ බහුල අත්දැකීම් අනුව ගැඹුරු ප්‍රායෝගික හැදෑරීමකට වඩා ඔවුන්ගෙන්


බහුතරයකට අවශ්‍ය වන්නේ දේශන ශාලාවට කොටු වූ න්‍යායික කටපාඩම් සංස්කෘතියක් පමණයි. අවම වශයෙන් පැවරුම්වලදී පවා ක්ෂේත්‍ර පර්යේෂණ හෝ නියැදි විශ්ලේෂණ සඳහා කාලය සහ ශ්‍රමය නොයොදවා අන්තර්ජාලයෙන් සොයා ගත හැකි කරුණු මත පමණක් පාදක ව නිබන්ධන සකස් කරන ශිෂ්‍ය ප්‍රතිශතය පවතින්නේ ඉහළ මට්ටමක. එවැනි හැදෑරීමකින් වැඩ කළ හැකි ප්‍රායෝගික ශ්‍රම බලකායක් රටට එකතු වන්නේ කෙසේ ද? යන්න ප්‍රශ්නයක්.

සාහිත්‍යය, කලාව, ක්‍රීඩාව වැනි වින්දනාත්මක, ශාරීරික ක්‍රියාකාරකම් සහිත ප්‍රායෝගික තල නියෝජනය නොකිරීම සහ පොතත් ඩිජිටල් තිරයත් මත පමණක් සියලු චර්යා හැඩගැසීම වැනි හේතුපාදක ව යම් යම් මනෝමය ගැටලුවලට මුහුණපාන දරුවන් ද සිටිනවා. එවැනි තත්ත්වයක සාහිත්‍යය ඩිජිටල් මාධ්‍යයට පිවිසීම මේ ප්‍රශ්නය වර්ධනයට හේතුවක් වෙයි ද? යන්නත් මතු වන ගැටලුවක්.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ මනෝවිද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අසංක බුලත්වත්ත පවසන්නේ පාඨකයකුට ප්‍රබල කම්පනයක් ඇති කිරීමට ඩිජිටල් පොතට නොහැකි බව. එහෙත් කෙනකුගේ කියවීමේ අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීමේ ක්‍රමයක් ලෙස ඩිජිටල් මාධ්‍ය පොත භාවිත කළ හැකි බවත් ඔහු පෙන්වා දෙනවා. විශේෂයෙන් ම එය වැදගත් වන්නේ සාහිත්‍යය ප්‍රචලිත කිරීම සඳහා හොඳ වාහකයක් ලෙස මිස සාහිත්‍ය පත පොත පුරුද්දක් ලෙස කියවීම සඳහා සුදුසු ම මෙවලමක් ලෙස නොවෙයි. මුද්‍රිත පොතක් රැගෙන යා නොහැකි ගමන්වලදී පමණක් කෘතියක කියවීමේ අඛණ්ඩතාව රැකගැනීමට ඩිජිටල් ශ්‍රව්‍ය පොත (Audio Book), දෘශ්‍ය පොත (Video Book, Flip book, PDF book) සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය පොත (Audio-Visual Book) භාවිත කිරීම වැදගත්. එහෙත් පාඨකයා සාමාන්‍ය පරිසරයට පැමිණි වහාම මුද්‍රිත පොත අතට ගැනීමට සූදානමින් සිටිය යුතුයි.

සාහිත්‍යය පිළිබඳ සමාජ උත්තේජනය වැඩි කිරීමේ මාධ්‍යයක් ලෙස එය පුළුල් ව භාවිතාවට ගත හැකි වුවත් තිර කාලය යන්න ප්‍රජානන සංවර්ධනය (Cognitive Development) සහ චිත්තවේගී සංවර්ධනය (Emotional Development) කෙරෙහි අහිතකර ලෙස බලපාන බව සිහියේ තබා ගත යුත්තක්. රූපවාහිනී මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය භාවිත කරමින් සාහිත්‍ය කතිකාවත් ගොඩනැංවීම වැදගත්. මේ එක් එක් මාධ්‍යවල සහ තාක්ෂණයේ තිබෙන ප්‍රගමනීය සහ අවගමනීය තත්ත්ව අවබෝධ කරගෙන සියලු භාවිත කිරීම් සිදු කළ යුතු වනවා. ශ්‍රව්‍ය (ශබ්ද) පොත් භාවිතයෙන් කියවීමේ දෘශ්‍ය අපහසුතා ඇති අයට පොත් පරිශීලනය කිරීමේ පහසුකම ලබා ගැනීම නිසි භාවිතාවට උදාහරණයක්. ඩිජිටල් තිරයට ඇබ්බැහි වීම වැනි අහිතකර තත්ත්ව අවම කිරීමට දෙමව්පියන් සහ පවුලේ වැඩිහිටියන්, ගුරුවරු, රජය, මාධ්‍ය, සෞඛ්‍ය, නෛතික වැනි අංශ වගකීම භාර ගත යුතුයි. සාහිත්‍ය සඳහා රූපවාහිනිය සහ නව මාධ්‍ය දායකත්වය වැඩි නොකර සිටීමට එකී ඇබ්බැහිය හේතුවක් කර නොගත යුතු

සාහිත්‍යය, කලාව, ක්‍රීඩාව වැනි වින්දනාත්මක, ශාරීරික ක්‍රියාකාරකම් සහිත ප්‍රායෝගික තල නියෝජනය නොකිරීම සහ පොතත් ඩිජිටල් තිරයත් මත පමණක් සියලු චර්යා හැඩගැසීම වැනි හේතුපාදක ව යම් යම් මනෝමය ගැටලුවලට මුහුණපාන දරුවන් ද සිටිනවා. එවැනි තත්ත්වයක සාහිත්‍යය ඩිජිටල් මාධ්‍යයට පිවිසීම මේ ප්‍රශ්නය වර්ධනයට හේතුවක් වෙයි ද? යන්නත් මතු වන ගැටලුවක්.




වන්නේ එය අනාගතයේ තවදුරටත් සාහිත්‍යය සමාජයෙන් බැහැර වීමට හේතුවක් විය හැකි නිසා.

අදහස් දක්වන ආචාර්ය අසංකඃ "ඇබ්බැහිවීම සිදුවන නිසා ඩිජිටල් තිරය ප්‍රතික්ෂේප කිරීමෙන් අහිමි විය හැකි අනාගත ප්‍රතිලාභ සහ ප්‍රගතිශීලී මෙහෙවර ගැන අප සැලකිල්ලට ගත යුතුයි. තාක්ෂණය, සාහිත්‍ය විෂයෙහි පාඨකයා දිරිගැන්වීමේ පදනම (Incentive basis) මත සකසුරුවම් ව සහ නිවැරදි සාක්ෂරතාවෙන් යුක්ත ව භාවිතයට ගැනීමට තිබෙන පහසුව සහ වැදගත්කම අවධානයට ගත යුතු වනවා. පොත්පත් කියවීම ආශ්වාදයක් බවට පත් කරන්නටත් පුස්තකාල ඩිජිටල්කරණය කර ඩිජිටල් පොත සහ මුද්‍රිත පොත අතර ඒකීයත්වයක් (Synchronize) ඇති කිරීමටත් හැකි නිසා මේ ක්‍රම ද්විත්වය සමබර ව භාවිත කිරීමට ආකල්පමය පෙළඹවීමක් ඇති කළ හැකියි. ජර්මනිය, රුසියාව වැනි රටවල මෙන් අපේ රටේත් කියවීම සංස්කෘතියක් බවට පත්කළ යුතුයි. සාහිත්‍යකරුවන් සහ විනෝදාංශයක් ලෙස හෝ වෘත්තීය අවශ්‍යතා මත හෝ පොත් කියවන්නන් හැරුණු කොට ඒ රටවල සූපවේදියාත් කරණවෑමියාත් රියදුරාත් වෛද්‍යවරයාත් ගුරුවරයාත් වෙළෙන්දාත් ගොවියාත් ඇතුළු සියලු පාර්ශ්ව රසය උදෙසා පොත් කියවන්නන්. එය ඒ රටවල සංස්කෘතියේ කොටසක්. අපේ රටේ ඇත්තේ ළමයින්ට කියවන්නට උපදෙස් දෙමින් වැඩිහිටියන් වෙනත් වැඩ සහ සමාජ මාධ්‍ය ඔස්සේ පණිවිඩ හුවමාරු කරමින් සිටින, රූපවාහිනිය නරඹමින් සිටින, දුරකතනවල එල්ලී සිටින, ඕපාදූප කතා කරමින් සිටින සංස්කෘතියක්. කුඩා අවධියේ සිට ම දරුවාට නිසි සමාජ ඉගෙනුම (Social learning) නොලැබෙන්නේ එයින්. අන්තර්පුද්ගල සම්බන්ධතා අහිමි වන්නේත් කියවීම සහ සාහිත්‍ය භාවිත කිරීමට වඩා විනෝදවීමට සමාජ මාධ්‍යයේ හැසිරෙන්නේත් නිවැරදි මාර්ගෝපදේශනය සහ නියාමනය නොපැවතීම හේතුවෙන්."

'ඩිජිටල්' යන අකුරු හතරට අවනත වූ ලෝකයක අපට ඉන් බැහැර වීමේ හැකියාවක් නැහැ. ඒ නිසා කලාව සහ සාහිත්‍යය ඒ මත රැඳවීමයි වැදගත්. ඕනෑ ම මාධ්‍යයකින් කෘතියක් පළ කළ හැකි තත්ත්වය තිබියදී නිර්මාණාත්මක කෘතියක් සම්පාදනයට වෙහෙසෙනවා විනා රූපවාහිනියට, ගුවන්විදුලියට හෝ නව මාධ්‍යට දෝෂාරෝපණය කරමින් සිටීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. හොඳ නිර්මාණයකට

වැදගත් වන්නේ වාහකය නොවෙයි චින්තනය බව පවසන මාධ්‍යවේදී වජිර ජයවර්ධන අවධාරණය කරන්නේ 'සියලු නිර්මාණ ඩිජිටල් අවකාශයේ තැන්පත් කළ යුතු ය' යන්න. මෙහිදී මුද්‍රණයට ප්‍රමුඛස්ථානය දෙන අතර එම මුද්‍රණයේ ඩිජිටල් පිටපත අන්තර්ජාලයට උඩුගත (Upload) කිරීමෙන් අවශ්‍ය අයට භෞතිකවත් අනෙක් අයට අන්තර්ජාලයෙනුත් සාහිත්‍ය පරිශීලන අවස්ථා පුළුල් වනවා.

අදහස් දක්වන මාධ්‍යවේදී වජිර ජයවර්ධනඃ "ඩිජිටල් අවකාශයේ සහ සාම්ප්‍රදායික රූපවාහිනිය යන මාධ්‍යවල සමබරතාව රැක ගනිමින් මා සාහිත්‍ය වෙනුවෙන් පුළුල් යමක් කළායැයි සිතනවා. ඩිජිටල් අවකාශයෙන් නැවත ඒවා දකින විටයි ඒවායේ සාහිත්‍යයික, සමාජීය සහ ජාතික වටිනාකම කොතරම් ද යන්නත් ඒ කතාබහ කළ නිර්මාණ සංචිතය කෙතරම් පුළුල් ද යන්නත් ඉස්මතු ව පෙනෙන්නේ. සාහිත්‍ය වෙනුවෙන් සාම්ප්‍රදායික රූපවාහිනි චැනල ලබා දෙන ගුවන් කාලය කිසිසේත් නොසෑහෙන්නක්. ඒවා ව්‍යුහගත වන්නේ ම ලාබය සඳහා වෙළෙඳ ප්‍රචාරණය ප්‍රමුඛ ව. මේ වෙනුවෙන් රටේ ඉහළ ම ස්ථරය වන රාජ්‍යය (Ruling system) සකස් වීම වැදගත්. මාධ්‍ය ඇතුළු සෙසු ස්ථර ක්‍රියාත්මක විය යුත්තේ ඊට අනුව. පසුග ිය දශක කිහිපයේ සාහිත්‍යය සහ කලාව වෙනුවෙන් දේශපාලන බර තැබීමක් සිදු වූයේ නැති තරම්. මෑතකදී සාහිත්‍ය කතිකා, කවි, ගීත සහිත විචාරශීලී ආමන්ත්‍රණ පිරුණු බලවත් රසයක් දේශපාලන වේදිකාවලින් ඉස්මතු වීම සහ ඒවාට රූපවාහිනි සහ සමාජ මාධ්‍ය චැනල ඔස්සේ ලද ජනතා ආකර්ෂණය විශේෂයි. එයින් පෙන්නුම් කෙරන්නේ ජනතාව සෑම විට ම දැනුමෙන්, අවබෝධයෙන්, රසයෙන් සහ ඥානයෙන් හීන, පාලකයාට සහ සාම්ප්‍රදායික මාධ්‍යයට නතු ව පසුපසින් සිටින පිරිසකැයි සිතා ක්‍රියා කළ අය තේරුම් ගත යුතු සත්‍යයක්. ඒ, ජනතාව තමාට වඩා ඉහළින් සිටින බව සහ ඔවුන් තමා අභිභවා ඩිජිටල් මාධ්‍ය ධාරාවේ ගමන් කර ඇති බව. ඒ නිසා සාහිත්‍යය සහ කලාව අරබයා පැවති කුඩම්මාගේ සැලකිලි සහිත මාධ්‍ය භාවිතාව උඩු යටිකුරු කර සබුද්ධික ජන කණ්ඩායමක් ආමන්ත්‍රණය කිරීමට ඉදිරියේදී මාධ්‍ය වගබලා ගත යුතු වනවා. එය සරල නැහැ. ගැඹුරු කාර්යයක්."

රූපවාහිනියට නැතිනම් මාධ්‍යයට කලාව සහ සාහිත්‍ය ගළපන්නට බැරි බවට සහ එමගින් වෙළෙඳපොළක් නිර්මාණය කර ගත නොහැකි බවට මාධ්‍ය විසින් ම නිර්මාණය කරනු ලැබ ගත් කල්පිතයක් පවතින බව පවසන මාධ්‍යවේදී වජිර තමා එය බොරු කළ බවත් පෙන්වා දෙනවා. සාහිත්‍ය ජනප්‍රිය නැත යන්නත් එය ජනතාව වැළඳ නොගන්නක් (මාර්කට් කළ නොහැකි) ය යන්නත් ප්‍රචලිත කර සරල වින්දනය සහිත මෙවලමක් බවට මෙරට රූපවාහිනිය ඇද දමා ඇති බවත් ඔහු පෙන්වා දෙනවා. ජනප්‍රිය රැල්ලේ ම යන, එක ම ආකාරයේ වැඩසටහන් එක ම වේලාවේ ප්‍රචාරය කිරීමේ පුහු තරගයක රූපවාහිනි චැනල අඛණ්ඩ ව ගමන් කළ අතීතයට සමු දෙන්නට කාලය ඇවිත්. මේ අභියෝගය හඳුනාගෙන ඊට එරෙහි ව උඩුගං බලා පිහිනා ජහග්‍රහණ සටහන් කළේ මීට වසර ගණනකට පෙර සිට බවත් ඒ හඳුන්වා දුන් පූර්වාදර්ශය අනුව ඉදිරි වැඩසටහන් සකස් කළහොත් සමාජයට යහපත් මිනිසුන් නිර්මාණය කර ගත හැකි වනු ඇති බවත් ඔහු පවසනවා.

ප්‍රධාන වශයෙන් අප තේරුම් ගත යුතු කාරණය වන්නේ 'පාරවල් හැදුවාට වැඩක් නැහැ. ඒ පාරවල යන්නට මිනිස්සු හැදුවේ නැත්නම්' යන්න. තාක්ෂණය ගෙනාවාට වැඩක් නැහැ. ඒ තාක්ෂණය පාවිච්චි කරන්නට මිනිස්සු හැදුවේ නැත්නම්' යන්න. ඒ අවශ්‍යතාව ඉටු කළ හැක්කේ සාහිත්‍යය සියලු මාධ්‍ය ඔස්සේ පුළුල් ව ප්‍රචලිත කිරීමෙන්.

> ප්‍රධාන වශයෙන් අප තේරුම් ගත යුතු කාරණය වන්නේ, පාරවල් හැදුවාට වැඩක් නෑ. ඒ පාරවල්වල යන්නට මිනිස්සු හැදුවේ නැත්නම් යන්නයි. තාක්ෂණය ගෙනාවාට වැඩක් නෑ. ඒ තාක්ෂණය පාවිච්චි කරන්නට මිනිස්සු හැදුවේ නැත්නම් යන්නයි. ඒ අවශ්‍යතාව ඉටු කළ හැක්කේ සාහිත්‍යය සියලු මාධ්‍ය ඔස්සේ දැඩි ව ප්‍රචලිත කිරීමෙන්.





# 200ට උසස් වීම

වර්නන් ගුණසේකර

ශ්‍රී ලංකා පාපන්දුව නුදුරු අනාගතයේදී ම ආසියාවේ බලකණුවක් බවට පත්වන ලකුණු පහළ කර තිබෙනවා. ඒ, ලෝක පාපන්දු ශ්‍රේණිගත කිරීමේ අංක 200 ස්ථානයට පිවිසෙමින්. ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමට කලාපීය හා මහාද්වීපික වශයෙන් තිබෙන තත්ත්වය ඔසවා තැබීම අරමුණ කර ගත් ශ්‍රී ලංකා පාපන්දුවේ ධනාත්මක පරිවර්තනයේ උත්සාහයට යම් තරමක සාර්ථකත්වයක් ලැබී තිබෙන බවක් මෙයින් පෙන්නුම් කරනවා.

ශ්‍රී ලංකාව ජගත් පාපන්දු සම්මේලනයේ ශ්‍රේණිගත කිරීම්වල අංක 200 ස්ථානයට පිවිසියේ අංක 154 ස්ථානයේ සිටි යේමනය පරාජය කරමින්. ලෝක ශ්‍රේණිගත කිරීමේ අංක 203 ස්ථානයේ සිට යේමන් කණ්ඩායම සමග කටාර් දේශයේ තරග වැදීමට ශ්‍රී ලංකාවෙන් පිටත් ව ගිය කණ්ඩායම පෙරළා දිවයිනට පැමිණියේ අංක 200ට උසස් වීමක් ලබමින්. යේමනය සමග පැවති පළමු තරගය ගෝල් 1-0කින් ජය ගැනීමට ශ්‍රී ලංකාව සමත් වුව ද ආබාධයට ලක්වූ ප්‍රබල ක්‍රීඩකයන් කිහිපදෙනකු නොමැති ව තරග කළ දෙවැනි තරගයෙන් ගෝල් 0-2ක පරාජයක් ලැබීමට ශ්‍රී ලංකාවට සිදු වුණා. ඒ අනුව තරගමාලාව අවසන් වූයේ 1-1ක් ලෙස සම තත්ත්වයෙන්.

මේ වසරේ ම මීට පෙර අවස්ථාවකදී ද ශ්‍රී ලංකා කණ්ඩායම ආසියානු පාපන්දු කවුන්සලයේ ආසියානු කුසලාන සුදුසුකම් ලැබීමේ තරගයකදී කාම්බෝජියාව පරාජය කරමින් අංක 205 සිට අංක 200 දක්වා ස්ථාන පහක් ඉහළට නැගීමට සමත් වුණා. පසුගිය සැප්තැම්බරයේ සිදුවූ මේ නැගීම 2019 වසරෙන් පසුව ශ්‍රී ලංකාවට ජගත් පාපන්දු සම්මේලනයේ ශ්‍රේණිගත කිරීම්වල සිය තත්ත්වය දියුණු කර ගැනීමට හැකිවූ ප්‍රථම අවස්ථාවයි. මේ අනුව ඔවුන් ආසියානු ශ්‍රේණිගත කිරීමේ ද අංක 46 සිට අංක 45ට පිවිසියා.

පාපන්දු ක්‍රීඩාව පාලනය කරන ලෝක බලධාරීන් වන FiFA ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාව 2019 වසරේදී අංක 205 ස්ථානයේ ද 2020 වසරේදී අංක 206 ස්ථානයේ ද 2021 වසරේදී අංක 204 ස්ථානයේ ද 2022 වසරේදී අංක 207 ස්ථානයේ ද පසුගිය වසරේදී අංක 204 ස්ථානයේ ද පසුවෙමින් සිටියා.

ශ්‍රී ලංකාව මීට පෙර 2023 වසරේ අප්‍රේල් මාසය වන විට අංක 207 දක්වා පහළට බැස සිටි අතර අංක 200 දක්වා ඉහළට පිවිසීමට ඔවුන්ට මං විවර කළේ කාම්බෝජියාවට එරෙහි ව ලැබූ ජයග්‍රහණය. මෙය තරග කිහිපයකදී පරාජයකින් තොර ව සිට ශ්‍රී ලංකාව ලබා ගත් පළමු ජයග්‍රහණය ද වුණා. ශ්‍රී ලංකාව අංක 207ට පිවිසීම ඔවුන් මෑත ඉතිහාසයේ ශ්‍රේණිගත කිරීම්වල වැටුණු පහළ ම ස්ථානය. ශ්‍රී ලංකා පාපන්දුව ලෝක ශ්‍රේණිගත කිරීමේ මෙතෙක් ලබාගෙන තිබෙන ඉහළ ම ස්ථානය වන්නේ අංක 122. ඔවුන් එම තත්ත්වයට පිවිසියේ 1998 වසරේ නොවැම්බර් මාසයේ.

මේ අනුව ලෝක ශ්‍රේණිගත කිරීමේ සටහනේ කණ්ඩායම් කිහිපයක් පසු කරමින් අංක 200 ස්ථානය හිමිකර ගැනීමට අබ්දුල්ලා අල්මුටයිරිගෙන් පුහුණුව ලබන ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායම සමත් ව සිටිනවා. ශ්‍රී ලංකාවට ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම වර්ධනය කර ගැනීමට හැකිවූයේ අංක 180 වැනි ස්ථානයේ සිටි කාම්බෝජියාවට එරෙහි තරගය ජය පැරදුමින් තොර ව අවසන් කර ගැනීමෙන් පසුව වාර්තා කළ පෙනල්ටි ප්‍රහාරය ජයග්‍රහණය නිසා. එම ජය වාර්තා වූයේ 2027 වසරේ සෞදි අරාබියේ පැවැත්වීමට නියමිත ආසියානු කුසලාන තරගාවලිය සඳහා සුදුසුකම් ලබා ගැනීම පිණිස කාම්බෝජියාවේ පැවති එරට කණ්ඩායමට එරෙහි ආපසු තරගයේ. කෙසේ වෙතත් පෙනල්ටි ප්‍රහාරයේදී 2-4ක පරාජයක් ලැබුව ද කාම්බෝජියාව ඔවුන්ගේ 180 වැනි ස්ථානයේ ම රැඳී සිටීමට සමත් ව සිටිනවා.

කුවේට් ජාතික අබ්දුල්ලා අල්මුටයිරි ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස පත්වීමෙන් පසුව කණ්ඩායමේ ක්‍රීඩා රටාව ආක්‍රමණශීලී ලෙස වෙනස් ව තිබෙන්නේ ශ්‍රී ලංකා පාපන්දුවට නව යුගයක් උදා කරමින්. කාම්බෝජියාව පරාජය කරමින් ශ්‍රී ලංකාව ආසියානු කුසලානයේ තෙවැනි සුදුසුකම් ලැබීමේ වටය දක්වා ගෙන යාමෙන් ප්‍රදර්ශනය වූ ඔහුගේ සාර්ථකත්වය නිසා ක්‍රීඩා ලෝලීන්ගෙන් මෙන් ම පාපන්දු කළමනාකාරිත්වයේ ද විශ්වාසය හා සහයෝගය ඔහුට ලැබී තිබෙනවා.

අල්මුටයිරි ප්‍රසිද්ධ ව සිටින්නේ ඔහුගේ ආක්‍රමණය මුල්කර ගත් ශක්තිමත් කණ්ඩායම් ජීවයකින් යුත් ක්‍රීඩා විලාශයට. මෙය ශ්‍රී ලංකාවේ අභිලාෂ සමග මනාව ගැළපෙනවා. ඔහුගේ ධුර කාලයේ ශ්‍රී ලංකා කණ්ඩායමට නැවත පිබිදීමේ අවධානය හා උපායමාර්ග ගෙන එනු ඇතැයි අපේක්ෂා කෙරෙන්නේ ලබන වසරේ පැවැත්වෙන දකුණු ආසියානු පාපන්දු ශූරතාවලියට අල්මුටයිරි ශ්‍රී ලංකා කණ්ඩායම සූදානම් කරමින් සිටින මේ වකවානුවේ.


සුජාන් පෙරේරාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ ප්‍රගතියට තවත් ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ එම කණ්ඩායමේ සිටින විදෙස් ක්‍රීඩකයන්. ගෝල් රකින්නා සහ ආරක්ෂක පෙළේ දෙතුන් දෙනකු හැරෙන්නට ශ්‍රී ලංකා කණ්ඩායම ප්‍රධාන වශයෙන් සමන්විත ව තිබෙන්නේ ශ්‍රී ලංකාවේ සම්භවයක් සහිත ව විදෙස් තරගවල නියැළී සිටින ක්‍රීඩකයන්ගෙන් වන අතර ඔවුන්ගේ විදේශීය තරග අත්දැකීම් ශ්‍රී ලංකා කණ්ඩායමට ලැබී තිබෙන ඉතා වටිනා ආශිර්වාදයක්.

විශේෂයෙන් හිටපු ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහගේ ක්‍රියාවන් නිසා ජගත් පාපන්දු සම්මේලනයේ තහනමට ලක්වීම ඇතුළු දේශපාලන අභියෝගවලට මුහුණදීමට ශ්‍රී ලංකා පාපන්දු පරිපාලනයට පසුගිය කාලයේදී සිදු වුණා. පාලනය කිරීමේ ගැටලු හා ජාත්‍යන්තර තරග අවස්ථාවල තිබූ අඩුව ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ ප්‍රගතිය පමා කර තිබුණා.

නවතම ශ්‍රේණිගත කිරීමේදී දකුණු ආසියාවේ ඇතැම් රටවල් ඔවුන් සිටි ස්ථානවලින් පහළට වැටෙමින් සිටියදී ශ්‍රේණිගත කිරීමේ ඉනිමගේ ඉහළට නැගීමට හැකිවීම ශ්‍රී ලංකාවේ වැදගත් ජයග්‍රහණයක් පෙන්නුම් කරන අතර ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ අනාගත සාර්ථකත්වය ද එයින් පිළිබිඹු වනවා.

පසුගිය මාස 14 ඇතුළත ශ්‍රී ලංකාව ස්ථිර දියුණුවක් ලබා තිබෙන්නේ යුරෝපයේ හා ලොව අනෙකුත් ප්‍රධාන පෙළේ තරගාවලිහි ක්‍රීඩා කරන වෘත්තීය ක්‍රීඩකයන් 14 දෙනෙක් කණ්ඩායමට එක් කර ගනිමින්. සිය මවුපිය සම්බන්ධකම් මත ශ්‍රී ලංකාවට ක්‍රීඩා කිරීම සඳහා සුදුසුකම් ලබා සිටින මේ වෘත්තීය ක්‍රීඩකයන් සමග දේශීය ක්‍රීඩකයන් 20කට ආසන්න සංඛ්‍යාවක් මිශ්‍ර කිරීමෙන් ශ්‍රී ලංකා ජාතික පාපන්දු කණ්ඩායමට ලැබී තිබෙන්නේ විශාල ලාභයක්.

යේමනයට එරෙහි ව නොවැම්බරයේ ලබා ගත් ජයග්‍රහණයට පෙර ශ්‍රී ලංකාව සහභාගි වූ ජාත්‍යන්තර තරග 08කදී ඔවුන් කාම්බෝජියාවට එරෙහි ව 4-2ක් හා භූතානයට එරෙහි ව 2-0ක් වශයෙන් ජයග්‍රහණ දෙකක් ද ජය පැරදුමින් තොර ප්‍රතිඵල තුනක් හා පරාජ තුනක් ද වාර්තා කළා.



ශ්‍රී ලංකා ජාතික පාපන්දු කණ්ඩායම වර්තමානයේ සීඝ්‍ර දියුණුවක් ලබා තිබෙන්නේ ජස්වර් උමාර් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ මුල් පුටුවට පිවිසීමෙන් පසුව වීම විශේෂත්වයක්. ආසියානු පාපන්දු තරග බිමේ ප්‍රබල තරගකරුවකු ලෙස ක්‍රමක්‍රමයෙන් ඉස්මතු වෙමින් සිටින ශ්‍රී ලංකාව ඉදිරි වසරවලදී සැලකිය යුතු බලවේගයක් බවට පත්වෙමින් සිටිනවා.


දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-